# හොඳ උවදෙස්

## (2 වන පොත)


## කතෘ: චානක බණ්ඩාරගේ

BA (HONS), LLB, GDLP (Aust), DAG, DTAG (UK)



**KKN ප්‍රකාශණයකි**

කොළඹ 8

දුරකථනය: 0711334224

arwdc@bigpond.com



සියළු හිමිකම් ඇවිරිණී

Copyrights Protected

**කතෘවරයාගේ වෙනත් කෘති:**

- හොඳ උවදෙස් (1 වන පොත) (පිටු 200)

**(අප සමාජය/ජීවිතය, ආදරය/විවාහය/පවුළ, අපගේ දෑස් වැනිවූ දරුවෝ, ඉංග්‍රීසි ගැන, අපට අත්‍යාවශ්‍යම නීරෝගීකම, /මනා සෞඛ්‍ය, සතුන්/ වනජීවීන්/සුරතල් සතුන්, කාළින රසවත් ප්‍රස්ථාව පිරුළු)**

- රසවත් රස කථා (1වන පොත) (පිටු 168)

**(හිනා හිනා හිනා හතර හිනා, මසුරන් වටිනා වැකි)**

- රසවත් රස කථා (2වන පොත) (පිටු 128)

  **(අප සමාජය, වෛද්‍යය සේවය , හෝටල්, සුන්දර අතීතය, හොඳ තේරවිලි)**

- රසවත් රස කථා (3වන පොත) (පිටු 144)

**(පෙම්වතුන්/විවාහය/පවුල් ජීවිතය/ නැට්ටුක්කාරියෝ, රස ආහාර පාන, බීමතුන්, සොඳුරු පාසැල් දිවිය, සිඟන්නෝ, පිස්සෝ, හොල්මන්/මරණ/ මිනීමැරුම්/ජොයතිෂ්‍ය)**

- **Selected Writings of Chanaka Bandarage** (328 pages, in English)

*ශ්‍රී ලංකාවාසි සැම විසින් කියවිය යුතු වටිනා පොතක්*

---

*KKN ප්‍රකාශණයකි*

---

# හොඳ උවදෙස් (2 වන පොත)

---

copyrights@චානක බණ්ඩාරගේ

---

ISBN 987 – 055 – 658223 -2 – 7

---

KKN Trading Company, Colombo 8 – Book Publishers

---

ප්‍රථම මුද්‍රණය: 2016 සැප්තැම්බර්

---

කතෘ - චානක බණ්ඩාරගේ

- පිළිගැන්වීම - ආදරණීය මාතෘ භූමියට සහ මා සහෘද ශ්‍රී ලාංකික ඔබ වෙත ............

---

# හොඳ උවදෙස්

## (2 වන පොත)

- අපේ පරිසරය විනාශ
  වීම අපි වළකමු )
  පිටු 1-31 )

- අපේ රට දියුණු ) රටේ
  කිරීම ) යහපත
  සඳහා වූ ) පිණිස
  හොඳ රාජ්‍ය ) කරන සාධාරණ
  ප්‍රතිපත්ති මෙන්න: ) විවේචන
  පිටු 32 -158 ) සහිතයි

- කළාව/ක්‍රීඩා/සංස්කෘතිය )
  පිටු 159 -173

- මගී ප්‍රවාහන දියුණු )
  කරන ක්‍රම )
  පිටු 174 – 198 )

# • අපේ පරිසර විනාශය අපි වලකමු

1. පරිසරය අපි රැක්කොත් තමයි, පරිසරය අපිව රකින්නේ.

2. පුළුවන්තරම් යහපත් රුක් රෝපණ කාර්යයන්ට සහභාගී වන්න.

3. කපන එක ගහකට දහයක් වවමු මතුවට.

4. තමන්ගේ නොවන ස්ථානවල කුණු කසල දැමීමෙන් වළකිමු.

5. තමන් ඉන්න ගේ දොර විතරක් නොවෙයි අවට පරිසරයත් පිරිසිඳුව තියාගන්න ඕන කියලා අපේ මිනිස්සුන්ට නොතේරෙන්නේ ඇයි? ගෙදර කුණු ටික අතුගාලා, ගෙදර හොඳට පිරිසිඳු කරගෙන, ඒ කුණු ටික පාරට/එලියට විසි කරලා දානවා. අවට පරිසරය අපවිත්‍ර කරනවා.

6. එයින්, මියෝ/කැරපොත්තෝ/මැස්සෝ බෝවෙලා තමන්ගේ ගෙදරටම ආපසු එන බව මේ අයට වැටහෙන්නේ නැති හැටි.

7. හැකි සෑම විටම පරිසරය පිරිසිඳුව තබා ගනිමු, බස් ටිකට් එකක්වත් බිම විසි නොකර.

8. මුහුද ආශ්‍රිත වැසියන් මුහුදට කුණු විසි කිරීම නතර කල යුතුයි. කුණු ලොරිය එන්නේ නැත්නම් වලක් කපලා කුණු දාන්න ඕන. වෙළුණු කුණු, කාලයෙන් කාලයට පුළුස්සා දමන්න.

9. අනුන්ගේ හෝ මහජන/රජයේ ඉඩම් වල තමන්ගේ කුණු දාන්නන එපා.

10. කුණු දාලා දාලා සමහර උද්‍යාන, මුහුදු වෙරළවල් අද කැත කුණු ගොඩවල් වෙලා.

11. බොහෝ ප්‍රදේශවල දැන් කුනු ලොරිය/ට්‍රැක්ටරය සතියකට වරක් හෝ දෙවරක් පැමිණ කුණු එකතු කරගෙන යනවා. ඉතාමත්ම හොඳ දෙයක්. ඒත්, සමහරු කුණු ටික අතුගාලා පාරට හරි වෙන කාගේවත් ඉඩමකට හරි වෙරළට හරි දානවා. මේ මෝඩ මිනිස්සු හිතන්නේ තමන්ගේ ගෙවත්ත විතරක් පිරිසිඳුව තබා ගත්තොත් ඇතියි කියලයි.

12. අපට **1948** නිදහස ලබන විට රටින් **49%** මහා වනය. **2012** දී මේ ප්‍රමාණය **16.5%** දක්වා අඩුවී තිබුනා. මේ ප්‍රමාණය එන්න එන්නම ක්ෂය වෙනවා.

13. නුවරට කෝච්චියේ යනකොට අම්මා සමඟ ගමන් කල අවුරුදු 8ක පමණ හුරුබුහුටි පිරිමි ළමයෙක් ගෙදරින් ගෙනා විවිධ කෑම ජාති කා ඒවා ඔතා ගෙන ආ සෑම කොලයක්ම, අත පිසින කොළ, හිස් බීම බෝතල, ප්ලාස්ටික් බෑග්, බට පවා, ජනේලයෙන් එලියට විසි කලේ එළිය කුණු පෙට්ටියක් කියා හිතා ගෙන වගෙයි. අම්මයි, පුතයි හරි හරියට මේ දේ කළා. ඉදිරි පරම්පරාවත් අපගේ ඒ නරක සිරිත් දිගටම ගෙන යනවා නේද කියා ලොකු දුකක් ඇති වුනා. පේරාදෙණිය පහු උනාම මැදිරියේ සෙනග අඩු වෙලේ හොඳින් කියලා පහදලා දුන්නම දෙන්නම කැමැත්තෙන් පිලි ගත්තා, ආයි කරන්නේ නැහැ කියලා පොරොන්දු උනා. කෝච්චියේ මැදිරි තුල කසල බඳුන් තබන්නේ නම් හොඳයයි අපි දෙගොල්ලම පිලිගත්තා.

14. කුණු දමන පෙට්ටියක් හම්බුවෙන තෙක් කිමි 2ක් තම බස් ටිකට් එක කමිසයේ උඩ සාක්කුවේ දමාගෙන පයින් ගිය විශ්‍රාම ලත් ඉස්කෝලේ මහත්තයෙක් හමු උනා. ඇහුවහම කිවුවා පාර අවට වෙන මොන කුණු කන්දරාවක් තිබුනත් තමන්ගේ කුණු (බස් ටිකට් එක) පාරේ විසිකරලා පරිසරය තවත් අපවිත්‍ර කරන්න හිත ඉඩ දුන්නෙම නැතිලු. කොච්චර හොඳ මහත්මයෙක්ද?

15. හැටන් -නුවරඑළිය ප්‍රධාන මාර්ගයේ දිඹුල සෙන්ට් ක්ලෙයාර් දියඇල්ල අසල, නුවරඑළිය ප්‍රාදේශීය සභාව මගින් ඒ අසල කැලිකසල බැහැර කිරීම සඳහා ස්ථාන

කීපයක ප්ලාස්ටික් බඳුන් සකස් කර තිබුනත්, එම මාර්ගයේ නුවරඑළියට පැමිණෙන දේශීය සංචාරකයන් එම නැරඹුම් මධ්‍යස්ථානයේ සිට තමන් රැගෙන එන ආහාරපාන අනුභව කර, ඉවත ලන ප්ලාස්ටික්,පොලිතින් සහ ඉතිරි කසල ද්‍රව්‍ය එම ඉවතලන බඳුන් වලට නොදමා, අවට දර්ශනීය පරිසරයටම මුදාහරිනවා. ඔවුන් ප්‍රිය කරන පරිසරය ඔවුන් විසින්ම විනාශ කරගන්නවා නේදැයි ඔවුන්ගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නයක්.

16. කිරිවෙහෙර මාර්ගයේ ගමන් කරන ගොඩක් අය පූදබිම ගැන අබමල් රේණුවක්වත් නොසිතා, පලතුරු කා, කොටස් කසළ බඳුන් පෙනි පෙනී, කිරිවෙහෙර මාර්ගයේ දමා යති.

17. සිංගප්පූරුව, ඕස්ත්‍රේලියාව, ස්විට්සර්ලන්තය වගේ රටවල් ඔය තරම් පිරිසිඳු ඒ රටවල ජනතාව තමන්ගේ යුතුකම අකුරටම ඉටු කරන නිසායි. බස් ටිකට් එකක් නැත්නම් කෝච්චි ටිකට් එකක්, කාපු හිස් චිප්ස් බෑග් එකක් වගේ දේවල් කසල දමන බින් එකක් ළඟ නැත්නම් සාක්කුවේ දමා ගෙන ගෙදර ගෙන ගොස් ගෙදර බින් එකට දානවා. ඒ රටවල සිගරට් බට් එකක් කාර් එකකින් ඉවතට විසි කිරීම පවා නිතිය කැඩීමක්. රටට ආදරය කරන ඒ මිනිස්සු ඉතා විනය ගරුක වෙලා අවට පරිසරයත් තමන්ගේම භූමියක් ලෙස හිතලා පරිස්සම් කරනවා. වැරදි කරන අයට කියා දෙනවා, සමහරවිට අල්ලා දෙනවා.

18. සිංගප්පූරුවේ මිනිස්සු චුවින් ගම් හපා හපය කෝච්චිවල ස්වයංක්‍රිය දොර පීලි වල අලවා යන නිසා කෝච්චි වල දොරවල් නොවැසිමේ තත්ත්වයක් ඇති වුනා. ඒ රජය ඒ රට චුවින් ගම් සැපීම තහනම් කරන නීති ගෙනාවා. ඒ නීති අදත් තියෙනවා. කෝච්චි දොරවල් හරියට වැඩ කරනවා. රට ඉතාම , පිරිසිදුයි.

19. රජයන්ට විතරක් බැනලා වැඩක් නැහැ. රටේ ජනතාව රට අපවිත්‍ර කරනවා නම්, තමන්ගේ යුතුකම් කොටස රට වෙනුවෙන් නොකරනවා නම්, කවදාවත් රට, පරිසරය, (මෙයට ගංගා, මුහුද, අප හුස්ම ගන්න වාතාශ්‍රයද ඇතුලත්) පිරිසිඳුව තබා ගන්න බැහැ.

20. කන්ද උඩරට පලාතක දිසා ලේකම් තුමෙකුට අනුව ඒ දිස්ත්‍රික්කයේ අපයෝජනය නොවූ එකදු ජල පෝශිතයක් වත් නැති තරම්ලු. බොහොමයක් දිය උල්පත්, දිය ඇලි වල වතුර අපවිත්‍ර වෙන්නේ විශේෂයෙන්ම වතුවල ජනයා තම වැසිකිලි, කුස්සි, නාන කාමර ආදියේ අපද්‍රව්‍ය එම ජල පෝෂිත දෙසට හරවන නිසාලු. මේවාට ඒ මිනිසුන්ට දොස් තබනවාට වඩා ආදාල නිලධාරින්විසින් තම සේවා කටයුතු නිසි ලෙස නොකිරීම බලපානවා.

21. රිටිගල කන්ද මහා පුදුම තැනක්. කන්දේ පාමුල තියෙන්නේ වියලි කර්කෂ දේශගුණයක්, කඳු මුදුන නුවරඑලිය වගේ සීතලයි. රිටිගලට පමණක් ආවේනිකවූ ශාක වර්ග 5ක්

තියෙනවා, ලෝකයේ වෙන කොහෙවත් (ලංකාවද ඇතුළුව) ඒවා නැහැ.

22. මේ මැතක් වනතුරු දරුවෝ අරගෙන ගෝල් ෆේස් ගිහින් රැල්ල පැගුවා. පෝට් සිටියට පින්සිද්ද වෙන්න ඒ තිබ්බව වෙරළ දැන් නැහැ, උරහිස ගාවට වතුර එන වෙලාවල් බොහෝයි. ගෝල්ෆේස් එකේ මුහුදට බසින සමහර පඩි පෙලවලුත් ගලවලා දාලා.

23. ඈත මුහුදේ යන නැව් වලට දැන් ජනාධිපති කාර්යාලයට ලස්සනට පේනවා; ප්‍රථාපවත් අපේ ඒ ගොඩනැගිල්ල. ඒකත් වැහිලා යනවිදියටයි පෝට් සිටිය නිර්මාණය කරන්නේ. ගෝල් ෆේස් එකේ ජනාධිපති කාර්යාලය අසළ මුහුද දෙසට යොමු කල කාලතුවක්කු අවුරුදු 70ට වැඩිය ඒ ස්ථානවල සාඩම්බරව ස්ථාපිතව තිබුන. ගලවා කොහේ හයි කරයිද දන්නේ නැහැ (එක කාලතුවක්කුවක් පහුගිය කාලේ ඒ ළඟ හෝටලයක් ගාවට ගෙනිහිල්ලා හයි කරගෙන තිබුනා). කොහොමත් අනාගතයේ හැදෙන පෝට් සිටිය දෙසට අපේ දැන් ගෝල් ෆේස් එකේ තියෙන පරණ කාලතුවක්කු මාන ගෙන සිටීමේ නම් තේරුමක් නැහැ.

24. පෝට් සිටි නව නගරයෙන් එන ඉතා උස ගොඩනැගිලි වලින් දැනට ඉන්දියන් සාගරය උඩින් අපට දක්නට ලැබෙන නිල්වන් අහස මැකී ගොස් මුළු ගාලු මුවදොර පැත්තම කළුවී, අඳුරු වෙලා යන්න පුළුවන්, විශේෂයෙන්ම

ජනාධිපති කාර්යාලය, කිංග්ස්බරි , ගලදාරි, හිල්ටන් සහ අලුතින් හදන ෂැන්ග්රි ලා වැනි හෝටල අවට පෙදෙස්. මේ නව නගරය ඉතා ප්‍රවේශමින් නිර්මාණය කල යුතු එකක්, මුලින්ම 'වරද්ද  ගත්තොත්' පස්සේ හදා ගන්න බැහැ (නවතම වාර්ථා අනුව ජනාධිපති ලේකම්කාර්යාලය කෝට්ටේ පාර්ලිමේන්තු පාරේ අපේ ගම පරිශ්‍රය අසල ඉදිකිරීමට සැලසුම් කර තිබෙනවා. එසේනම් දැන් තියෙන ජනාධිපති ලේකම්කාර්යාලයට මොකද වෙන්නේ?).

25. පෝර්ට් සිටි නව නගරයට අවශ්‍ය වන බලශක්තීන් සෝලර්, සුළං, මුහුදු රැල්ල, සුළං මෝල්,  වැනි පරිසර හිතකාමී මාර්ගවලින් ද ලබාගැනීමට පියවර ගත යුතුයි. කැලි කසළ බැහැර කිරීමද කැලි කසල ප්‍රතිචක්‍රීයකරණය වැනි පරිසර හිතකාමී මාර්ගවලින් ද විය යුතුයි.  පූරවනු ලබන වටිනා ඉඩම්වලින් විශාල ප්‍රමාණයක් වාහන නැවත්වීමට නොයොදවා පොලොව යට සහ උස, මහල් ගොඩනැගිලිවල වාහන නැවත්වීමේ පහසුකම් ඉදි කල යුතුයි.

26. පෝර්ට් සිටි නව නගරය තනිකරම හෝටල, සමාජ ශාලා, ඩිස්කෝ, කැසිනෝ, ඇමරිකන් වැනි කෑම  විකුණන ආපනශාලා  වලින් පිරි, බටහිර සංස්කෘතියේ අංගෝපංග වලට පමණක් මුල් තැන දෙන තැනක් නොවිය යුතුයි. අපේ දේශීය සංස්කෘතිය, සභ්‍යත්වය, ප්‍රෞඩ ඉතිහාසය, බුද්ධාගමටද නිසි තැන ලැබෙන පරිදි එය නිර්මාණය කිරීමට දැන්ම සිටම වග බලා ගමු.  උද්‍යාන, සක්මන් මාර්ග,

ජල පොකුණු, වතුර මල්, භාවනා/යොගා සඳහා ස්ථානයන්, ලංකාවට ආවේනික විවිධ ශාක වර්ග එහි විය යුතුයි.

27. ඉස්සර බේරේ වැවේ පල්, ජරා වතුර ජනාධිපති කාර්යාලය අසලින් බැස ගොස් ගෝල්ෆේස් එකට ඔබ්බෙන් මුහුදට වැටුනා කිසි අවහිරයක් නොවී. දැන් පෝට් සිටියේ නව ගල් බැම්මවල හැපී, නැවතී ඒ වතුර සේරම ගෝල් ෆේස් පැත්තේ මුහුද දෙසට හරවා යැවීමෙන් ඒ පැත්තේ (කොළඹ 3, 4) මිනිසුන්ගේ සෞඛ්‍යයට අයහපත් කාරක ඇතිවන්නට පුළුවන්?.

28. ගෝල් ෆේස් එකේ පෝට් සිටිය ගාව අලුතෙන් වෙරලක් හදලා මිනිස්සු එක ජාමෙට නානවා/විවිධ සෙල්ලම් කරනවා. බේරේ වැවෙන් එන ජරා වතුර මුහුදට එක් වෙන්නේ එතනින් කියලා මේ අයට තේරෙන්නේ නැති හැටි. සමේ රෝග එහෙම හැදෙන්න පුළුවන්.

29. පෝට් සිටියට මුහුද පුරවන්න කළු ගල් ගෙනල්ලා තියෙන්නේ ඔරුවල, අරංගල, අතුරුගිරිය පැත්තේ විශාල කළු ගල් පර්වත කඩලා, දැන් ඒ පැත්තේ ඉන්න බැහැ රස්නෙයි, ලිං වල වතුරත් හින්දිළලු. වෘක්ෂ ලතා, වනජීවී හානිය කියා නිම කරන්න බැහැ. දුර දිග බලන්නේ නැතිව කරන වැඩවල විපාක.

30. ණය පියවීම පිණිස පෝර්ට් සිටිය තවත් ලොකු කරන්න යනවා කියලා කතාවක් තිබුනා (තවත් හෙක්ටයාර් 50කින්ද කොහිද). ඒ කථාව ඇත්ත නම් ඉස්සරහට කළු ගල් එහෙම කොහෙන් කඩලා ගේයිද දන්නේ නැහැ. කලින් පාර මුළු අතුරුගිරිය පැත්තම කඩලා ඉවර කලා.

31. ඔය පෝර්ට් සිටියෙන් නව ගල් බැම් වලින් නවත්තපු මුහුදු රැල්ල වෙන කොහෙන් හරි වෙරළටම ගහන්නම ඕන, ස්වභාව ධර්මය එයයි. මේ නිසා කොල්ලුපිටියේ ඉදලා ගල්කිස්ස පැත්තට මුහුද කෑම වැඩිවෙන්න බොහෝ දුරට ඉඩ තියෙනවා.ගෝල් ෆේස් එකේ පවා තියෙන ගල් බැම්ම නිතර අලුත්වැඩියා කරන්න වෙයි. අනිත් පැත්තෙන්, මුහුදු කෑම මෝදර, උස්වැටකෙයියාව, පමුනුගම , මිගමුව පැති වලට වැඩි වෙන්න පුළුවන්.

32. පෝර්ට් සිටියේ කළු ගල් දාලා, මුහුද ගොඩකරලා, බැම් ගහලා ඉස්සුවාට පස්සේ (2013/14 වසර වලදී), ඒ වැඩ ගොඩාක් ඉවර වුනාට පස්සේ බොහෝ දෙනෙක් පෝර්ට් සිටිය නවත්වන්න කියලා ඉල්ලුවා. මේ අය කියන්නේ ඒ ගල් පර ආපහු අරන් දාන්න කියලද? අශ්වයා ගියාට පස්සේ ඉස්තාලේ දොර වහන්න කියනවා වගේ වැඩක්.

33. බේරේ වැව අවට නිවාස, කර්මාන්තශාලාවලින් පිටකරන බොහොමයක් මිනිස් සහ වෙනත් අපද්‍රව්‍ය කෙලින්ම වැවට මුදාහරිනවා. මේ අතර තදබල රසායනික ද්‍රව්‍යත් තිබෙනවා. මෙවා නතර කරන්න වැඩපිළිවෙළක් ගෙන

නැහැ. වැවේ සමහර ස්ථානවල ජලය ගලාගෙන යන්නේ නැහැ. මේ නිසා වැවේ ඉහළ ස්ථරයේ නීලහරිත ඇල්ගී හැදෙනවා. එවිට වැව් ජලයේ ඒ ප්‍රදේශ වලට සූර්යාලෝකය කිඳාබසින්නේ නැහැ. ජලයේ පහළ ප්‍රදේශයට හිරු එළිය නොලැබීම නිසා එහි නිර්වායු බැක්ටීරියා සක්‍රීය වෙනවා. මේ නිසා සල්ෆර් ඩයොක්සයිඩ් වායුව හැදෙනවා. මේ නිසාත් දූර්ගන්ධය ඇතිවෙනවා. දැන් කරන්නේ ඇල්ගී නැතිවෙන්න ඒවා උඩට අළුහුණු දානවා. එයින් ඇල්ගී ඉවත් වෙනවා. එහෙම කළාම ගඳ අඩුවෙනවා. නමුත් මාළු සහ අනෙක් ජීවින් මැරෙනවා. ඒ වතුර අල්ලන්න සුදුසු නැහැ. අළු හුණු දැමීම ප්‍රශ්නයට පැලැස්තර දැමීමක් පමණයිද?

34. අලුතින් හදන රුසියානු තානාපති කාර්යාලය අසලින් බැස යන විශාල කානුව (බෝක්කුව) ලඟින් යනවිට එන්නේ අසුචි මිශ්‍ර පල් වතුර ගඳක්.

35. අද කොටුවේ කස්ටම්ස්, ලේක් හවුස් බිල්ඩින් තියන පැතිවල බේරේ වැව ලඟින් යනකොට නහය වහගෙනයි ඕන කෙනෙක් යන්නේ. මුළු කොළඹම මිනිස් අසුචි මෙතනට එක් වෙලාද කියලා හිතෙන තරමට අසුචි ගඳ උහුලන්න බැහැ. ඒ විධියට නම් අපිට ආසියාවේ ආශ්චර්යය වෙන්න බැහැ. දවසකට දහස් ගණනක් සංචාරකයෝ පයින් මේ ස්ථාන පහු කරගෙන යනවා නේද. ජාතියක් හැටියට අපට ආඩම්බර වෙන්න පුළුවන් දෙයක් නොවෙයි.

36. කොළඹ සහ වෙනත් ප්‍රධාන නගරවල කානු, ඇල දොළ වල් ඉතා අපවිත්‍රවී කුණු ගඳ ගහනවා. උදාහරණයකට බේරේ වැව කොළඹ නගරය මැද සමහර ස්ථානවල දරා ගන්න බැරි තරම් අප්‍රසන්න ගඳක් වහනය කරනවා; විශේෂයෙන්ම මිනිස් වැසිකිලි අපද්‍රව්‍ය බේරේ වැවට වහනය වීම නිසා. මේවා වැව උඩ පාවෙනවා පේනවා විශේෂයෙන්ම තදින් පායන දවස්වලට. විසඳන්නම ඕන ප්‍රශ්න මේවායි, බොරුවට ගාලු පාර වගේ ප්‍රදේශවල හොඳට තියෙන පේව්මන්ට් කඩ කඩා වටිනා රතු පාට වගේ ගඩොල් වර්ග නැවත ඇල්ලීමට වඩා.

37. වේරහැර, කටුවාවල පැත්තේ මහා මාර්ගයේ පැත්තක හොඳට බෝක්කු ලොකුවට හදලා කොන්ක්‍රීට් පියන් වලින් වැසුවත් කාණුවලින් තදබල් මිනිස් අසූචි දුගන්ධයක් හැමුවා. සමහරු හොරෙන් ටොයිලට් හරවලා වගේ වැහි වතුර බහින්න හදපු කාණුවලට, ඒවා මේ ලොකු බෝක්කුවට එක් වෙලාද?

38. මාතර මහ රෝහලෙන් බැහැර කෙරෙන අපද්‍රව්‍ය සහ මිනිස් මලාපවහන කෙලින්ම නිල්වලා ගඟට මුදා හැරීමට කටයුතු කර තිබුනා. පුදුම ගඳක් ගඟේ ඒ පැත්තෙන් ආවේ.

39. ගම්පහ මූලික රෝහලේ අසූචි මිශ්‍ර මළ ද්‍රව්‍ය ගංවතුරට යටවූ අවට නිවාසවලට ගලා ඒම නිසා ප්‍රදේශවාසීහු දැඩි

දුෂ්කරතාවකට ලක්වෙනවා. මේවා මඟින් ප්‍රදේශවාසීන්ට ලෙඩ රෝග වැළඳීමේ අවදානමක් පවතිනවා.

40.ගල්කිස්ස, වටරප්පල පාරේ, හුළුදාගොඩ මංසන්දිය අවට මාර්ගයේ දෙපස ජලය බැසයන කානු පද්ධතිය පිරිසිදු නොකිරීම නිසා ඇතිව ඇති දැඩි අපවිත්‍රතාවයෙන් ප්‍රදේශවාසීන්, විශේෂයෙන්ම කුඩා දරුවන්, මොනතරම් ප්‍රමාණයක් ලෙඩවෙන්න ඇද්ද කියා වෙලාවකට සිතෙනවා.

41.නල්ලතන්නියේ හෝටලයක වැසිකිළි අපද්‍රව්‍ය සීත ගඟුලට හරවලා. ශ්‍රීපාද රක්ෂිතයේ සිට මාවුස්සාකැලේ ජලාශයට ගලා බසින සීත ගඟුල ඔයේ ජලය, ශ්‍රීපාද වන්දනාකරුවන් හා ප්‍රදේශවාසීන් දහස් ගණනක් දිනපතා ප්‍රධාන අවශ්‍යතාවන් සඳහා පාවිච්චියට ගන්නවා.

42.වසර දෙදහසකට අධික ඉතිහාසයක් ඇති ඓතිහාසික රංගිරි දඹුල්ල ලෙන්විහාරය ලෝක උරුමයක් ලෙස නම්කර තිබෙනවා. මෙහි ලෙන් විහාරයේ චිත්‍ර විනාශවීමේ බලවත් තත්ත්වයකට මතුවී තිබේ, වැහි වතුර කාන්දුවීම නිසා.

43.කාක්කන් අද අපේ ප්‍රධාන නගර අල්ලාගෙන ඉවරයි. මුන් කරන පරිසර හානිය, කුණු කසල ප්‍රවාහනය නිසා ඇතිවෙන සෞඛ්‍යය සහ පවිත්‍රතා ප්‍රශ්න කියා නිම කල නොහැකියි. උන් කුණු කසල යම් ප්‍රමානයක් කා දමනවා වෙන්න පුළුවන්, නමුත් ඉතා පිරිසිඳුව තබා ගන්නා ස්ථානවලට ඒ කැලි කසළ ගෙනත් දානවා. බෞද්ධ රටක් නිසා උන්

විනාශ කරන්න බැරි එක ඇත්ත, නමුත් ජාන විද්‍යා ක්‍රම උපයෝගී කරගෙන උන්ගේ බෝවීම අවම කල යුතුයි. නගර සභා මඟින් විදි බල්ලන්ගේ පැතිරීම දක්ෂ ලෙස පාලනය කරනවා වගේ.

44. කාක්කන් බහුල වෙන්න වෙන්න වෙනත් පක්ෂීන්ට බෝවෙන්න බැරි වෙනවා.

45. ලෝක සංරක්ෂණ සංගමයේ රතු දත්ත පොතට අනුව නම් වෙන කවරදාටත් වඩා වේගයෙන් ලෝකයේ කුරුල්ලන් වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇත.

46. ලංකාවේ ඉස්සර ගෙවල් වල කූඩු හදාගෙන ජීවත්වූ ගේ කුරුල්ලන්ට මොකද වුනේ?

47. සුද්දන්ගේ අපට ලැබුණු යහපත් දායාදයක් ගාලු මුවදොර තන නිල්ල. ඒ අය අපට දීලා ගියේ සැබවින්ම එක, සම මට්ටමේ, දිග තන නිල්ලක්. ලෝක උරුමයකට පවා සුදුසුකම් ලබනවා මේ බිම් තීරුව. අද අපි එය හැමතැනම මැද්දෙන්/පැතිවලින් කඩා දාලා, හරියට කුඹුරුවල නියරවල් හදලා වගේ. ඉස්සරහට මේ අය තව නොයෙක් අට මගල් ඕකේ මැද ගහයිද?

48. ගාලු මුවදොර තන බිම කියන එකට වඩා අද සුදුසු ගාලු මුවදොර පස් බිම කියලා කියන එකයි.

49. ඉස්සර ගෝල් ෆේස්, විහාරමාහාදේවි පාර්ක් ගියේ සාමකාමී, නිහඬ වින්දනයක් ලබන්නයි, ස්වාභාවික් පරිසරයේ ආශ්වාදය රස විඳින්නයි. දරු පවුල සමඟ නව රසාස්වාදයක්, අත්දකිමක් ලබන්නයි. ඒ ස්ථාන එදා සුද්දා හැදුවේ කෑම කන්න යන්න නෙවෙයි, ඒවාට වෙන තැන් නගරයේ තියෙනවා. අද ඒ ස්ථාන කෑම කඩ දාගෙන, විශේෂයෙන්ම මස් කෑම විකුණන ප්‍රධාන තැන් බවට පත් වෙලා. මේ නිසා වෙනදා නොතිබුණු කසළ හා අප ද්‍රව්‍යය, වෙනදා නොසිටි තඩි බලලුන් තරම් වූ උරු මීයෝ, කැරපොත්තෝ, මැස්සෝ, කාක්කෝ (දඩාවතේ යන බල්ලෝ පවා) ආදී ලෙඩ බෝ කරන සතුන්ගේ තෝ තැන්නක් වෙලා, මේවා ඉතාම වැදගත් අපේ ස්ථාන.

50. සවසට ගෝල්ෆේස් පැත්තේ දැන් ඇවිදින්න යන්න හිතෙන්නේ නැහැ, කෑම සංස්කෘතිය මුළු තනනිල්ලම වගේ අල්ලලා ඉවරයි. සවස 7ට පමන මස් පිලිස්සීමෙන් වහනය වන්නේ දැඩි තෙල්/ග්‍රීස් මිශ්‍රිත වාතාශ්‍රයක්. කොහොමද පිරිසිඳු වාතාශ්‍රයක් ලබා ගන්න ඇවිදින්න යන්නේ? බොහෝ කෑම කඩ පිරිසිඳු බවින් ඉහළ ගුනාත්මයකට ඇවිත් නැහැ.

51. ගෝල් ෆේස් තන බිම මත සරුංගල්, ළමා ප්ලාස්ටික් බෝනික්කෝ වගේ සෙල්ලම් බඩු මහා පරිමාණයෙන් විකුනනවා. මේ අය මේ අල්ලා ගෙන තිබෙන්නේ සාමාන්‍ය මිනිසුන්ට නිදහසේ ගමන් කිරීමට තිබෙන ඉඩ ප්‍රදේශයි.

සරුංගල් කඩ ලඟින් රැට යන්න භයානකයි, මොකද ඒ සරුංගල්වල නුල් වලට පය පැටලිලා වැටෙන්න පුළුවන්.

52.ගෝල් ෆේස්, විහාරමාහාදේවි උද්‍යානයේ කෑම විකුණන පැති කුණු කෑම, කුණු බක්කි නිසා ඒ පැති විනාශ වෙලා. ජනාකීර්ණ දවස්වල කළුවර වැටුණු පසු සමහර මිනිස් කණ්ඩායම් ගෝල්ෆේස් තන බිමේ බිම වාඩිවී හංගගෙන අරක්කු, විස්කි, බියර් වගේ ජාති බොන බව පේනවා. සිගරට් බොනවා. මේ වැඩවලින් මේ ස්ථාන විනාශ වී යනවා. හොඳ, යහපත් මිනිසුන් ඒම අඩු වෙන්න පුළුවන්. පොඩි ළමයිනට සරුංගලයක් යවන්න, දුවන්න පනින්න සෙල්ලමක් කිරීමට, නිදහසේ ගත කිරීමට සුදුසු පරිසරයක් බිහි කල යුතුයි.

53.විහාරමාහාදේවි උද්‍යානය හැදුවේ නගර මැද කලබලකාරී පරිසරයෙන් ඇත්වී නගරයේ ජනයාට කිසියම් මානසික සුවයක්, නිදහස් වූ වින්දනයක් ලබාදීමටයි. එය අතිශය චමත්කාර ජනක උද්‍යානයක් වුවා. බොහෝ ගස්වැල්, අඳුරු ස්ථාන, නුග, නා, මාර වැනි වසර සිය ගණන් පැරණි දැවැන්ත වෘක්ෂයන්, පොකුණු, ගුහාවල් ආදියෙන් පිරි, ජනාකීර්ණ නොවූ, කොලඹ හරි මැද පිහිටි නිසංසල පරිසරයක්. අද, එහි එදා තිබූ ඒ ගුප්තාත්මක සහ විවිධාකාර භාවය නැහැ හෝ අඩුයි. ඇවිදින මං තීරු නිසා එය ව්‍යායාම කරන්නන්ගේ පාරාදීසයක් වෙලා; ළමා පිටිය ඉතා ජනාකීර්ණයි; ඒ අතර කෑම කන්න එන අයගෙන් ඒ

ප්‍රදේශය පිරිලා. මේවා නිසා පාක් එක බිහිකිරීමේ මූලික පරමාර්ථය වෙනස් වෙලාද?

54. විඩා පත් නගර වැසියාට හෝ පිට පලාතකින් කොළඹට පැමිණි කෙනාට එදා මෙන් නොව අද විහාරමහාදේවි උද්‍යානයේ තන බිම මත හෝ උද්‍යාන බැංකුවක් මත එදා මෙන් පැයක් දෙකක් නිදා ගෙන යාමේ හැකියාව බොහෝ දුරට අවහිර වෙලා.

55. ඉතුරුවූ/කැලි කසල පිරි බඳුන්වල ආහාර කෑමට කාක්කන් දැන් සිය දහස් ගණනින් විහාරමහා දේවි උද්‍යානය පිරිලා, ඒ වගේමයි උරු මී උවදුර. කොකුන්, හංසයන් වගේ සතුන්ට නිදහසේ සැරිසැරීමට කිසිම අවකාශ නැහැ.

56. කාක්කෝ නිසා විහාරමහාදේවි උද්‍යානයේ උස ගස් වල වහලා ඉන්න වවුලන්ට තර්ජනයක්.

57. කාක්කන් මුළු විහාරමහාදේවි උද්‍යානයම යම් දිනකදී 'අල්ලා' ගනු ඇත.

58. විහාරමහාදේවි, පේරාදෙණිය, නුවර එළිය, නුවර වේල්ස්, හෙනරත්ගොඩ, සීතාවක මෙවැනි මාහැඟි උද්‍යාන නගර මධ්‍යයන්හි පිහිටවූයේ විඩාපත් ජනයාට ඒවාට පිවිස, විඩාව නිවා, නිස්කලන්කව ඔවුනට ඒවා තුල කාලය ගත කිරීමට ඉඩ දීමටයි; ස්වභාව සෞන්දර්යයේ රස විඳීමටයි. අප උවමනාවට වඩා මේවායේ ඇවිදින මං තීරු, කෑම කඩ,

ළමා ක්‍රීඩා පිටි ආදිය බිහිකලොත් මේ උද්‍යාන පිහිටුවීමේ මුල් අරමුණ නැති කර ගන්නවා. ඒ මුල් අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා එන පුද්ගලයන් අඩුවී, නව අරමුණු සාක්ෂාත් කරගැනීමට එන අයගේ සංඛ්‍යාව වැඩි වෙනවා.

59. උදේ පාන්දර 6ට විතර ගාලුමුවදොරට ඇවිදින්න යන්න බලන්න. කුණු කෑම කන්න ඇවිත් ඉන්න කාක්කෝ රංචු බලන්න පුළුවන්. සිය, දහස් ගණන් කාක්කෝ නිසා මුහුද අද්දර පාරේ කෑම කඩ පැත්තෙන් ඇවිදින්නවත් යන්න බැරි තරම්. ඉදිරියේදී ගාලුමුවදොර, විහාරමහාදේවි පාක් එකේ තවත් කෑම කඩ දානවට සැකයක් නැහැ. නගර සභාවට ආදායම් ලැබෙනවා නම් තමයි.

60. කාක්කා කසල වාහකයෙක් මිස කසල ශෝධකයෙක් නොවෙයි. කුණු කා දමන නමුත් කුණු එක් තැනක සිට තවත් තැනකට ගොස් දමා අත් හැරීමෙන් කරන හානිය අපමණයි, කොතරම් පිරිසිදුවට තබා ගත් මිදුලකට වුනත්.

61. කාක්කෙකුට ඉතා පහසුවෙන් මැරුණු මී කුනක්, මස් කඩෙන් අහක දාපු සත්ව බඩවැල්/හම් ආදිය ගෙනවිත් අතහැර යන්න පුළුවනි. මෙයින් ඒ අවට පරිසරයම අපවිත්‍ර වෙනවා. වෙනත් පක්ෂීන්, මාංශ භක්ෂක නැති/අඩු ඔවුන්ගෙන් මෙවැනි ප්‍රශ්නයක් නැහැ.

62. කොටුව දුම්රිය ස්ථානය ඇතුලේ ඉස්සර හිටියේ පරෙවියෝ විතරයි. දැන් ක්‍රම ක්‍රමයෙන් කාක් ආක්‍රමණය පටන් අරං. තව ටික කලකින් කාක්කෝ සිය ආධිපත්‍ය එම ස්ථානයෙත් විහිදුවයි වගේ.

63. සමන් ගිරේ පිරිසිදු උල්පත් වලින් පටන් ගන්නා කැළණි ගඟ කොළඹ මෝදර මෝය කටින් මුදට ගොඩ බසින තැනට ගිහින් බැලුවහම පුදුම හිතෙනවා, ගඟ අරන් එන කුණු කන්දරාව දැක්කහම. හැතැප්ම 90 දික්වූ කැළණි ගඟ ඒ ගලන කාලයේදී ටොන් ගණන් කැලි කසළ රැගෙන පහලට ගලනවා. කර්මාන්තශාලා වලින් පිට කරන අපද්‍රව්‍ය, බෙලෙක්, ප්ලාස්ටික්, පොලිතින්, ගෙවල් වලින් හරවන ටෝයිලට් සහ වෙනත් අප ද්‍රව්‍යය, වාහන සර්විස් ස්ථානවල කුණු තෙල්, ග්‍රීස් ආදිය මේ සමඟ වෙනවා. මහ මුහුද මේ අපද්‍රව්‍ය බාර ගෙන, නැවත අප වෙතටම දෙනවා. මෝදර සිට මිගමුව දක්වාවූ මුහුදු තීරය දිනපතාම මේ අපද්‍රව්‍යය මහ මුහුද විසින් බැර කරන ස්ථාන. ඒ වෙරල තිරය පමණක් නොවෙයි මුහුදු වෙරල ආශ්‍රිත මුහුදේ වතුර පවා ඉතා අපිරිසිඳුයි. ලංකාවේ අනිත් ගංගා වල තත්ත්වයත් මෙයමයි. ගංගා වලට කුණු හරවන ව්‍යාපාර ආයතන, පුද්ගලයින්ට දැඩි දඬුවම් දිය යුතුයි.

64. සමහර ෆැක්ටරි පොලව යටින් වලලපු බට මඟින් කැළණි ගඟට අපද්‍රව්‍ය හරවලා තියෙනවලු අල්ලන්න බැරි විදියට.

65. කැළණි ගඟෙන් මෝදරිදී මුහුදට වැටෙන කුණු අපද්‍රව්‍ය මීගමුවේ පිටිපන වෙරළේදී (km 35ක් විතරින් එහා), යලි දකින්න පුළුවන්.

66. තමන්ගේ මට්ටකුලියේ කෝවිලකදී නැතිවෙච්ච සෙරෙප්පු දෙකෙන් එකක් වැල්ල පාගද්දී කැපුන්ගොඩ වෙරළේදී හඳුනා ගත්ත අම්මෙක් හිටියා.

67. ලොව තර්ජනයට නතුවී ඇති ගංගා 10ට කැළණි නදිය අයත් බව International Rafting Federation එක සිය වෙබ් අඩවියෙන් දක්වනවා.

68. කැළණි ගඟ කිතුල්ගල පැත්තේදී ඉතා චමත්කාර ජනකයි. ලොව නන් දෙසින් එහි ඔරු පදින්න සංචාරකයන් එනවා; ඒ මඟින් කිතුල්ගල/ගිනිගත්හේන ප්‍රදේශවලට හොඳ ආදායමක් ලැබෙනවා. නමුත්, යෝජිත කිතුල්ගල ජල විදුලි බලාගාරයෙන් කැළණි ගඟ ඒ පැත්තේදී ‘මරා’ දමන්න පුළුවන්.

69. මුළු කොළඹටම පානිය ජලය සපයන්නේ ලබුගම, කලටුවාව සහ අඹතලේ ජාලාශ වලින්; ඒවායේ කොටසක් කැළණි ගඟේ වතුර. සමහර ජලාශවල ෆිල්ටර් වලට පෙරන්න බැරි තරම් රොන්මඩ සහ වෙනත් අපද්‍රව්‍ය එකතුවෙනවලු මේ වතුරට.

70. දිනපතා වැලනොකැඩී එන දේශීය, විදේශීය සංචාරකයන් නිසා ඉංගිරිය පරෙයිතොට තොටුපළ කැළි කසළින් පිරිලා ඉතිරිලා; අලුතින් ඉදි කල හෝටල් අයිති කරුවන් දිසා ලේකම් වරියටවත් සවන් දෙන්නේ නැද්ද?

71. කතරගම වන්දනාවේ යන දේශීය සංචාරකයින් විසින් යෝධ වැවට කැලි කසල දැමීම නිසා ඒ වැව නිතරම කසල ගොඩක් බවට පත්වෙනවා. තිස්සමහාරාම පුස්තෝලමුල්ල ජයවික්‍රම කනිෂ්ඨ විද්‍යාලයේ නංගිලා මල්ලිලා පුරා දවසක් තිස්සේ මහන්සි වෙලා යෝධ වැවේ කුණු කසළ ඉවත් කිරීමේ මහා ශ්‍රමදානයක් පැවැත්වූවා. එදා ඒ අය දේශීය සංචාරකයින් විසින් පරිහරණය කරන ලද ප්ලාස්ටික් බෑග්, පොලිතින්, හිස් වතුර බෝතල් වැනි අපද්‍රව්‍ය මොන තරම් කන්දරාවක් ඉවත් කලාද? තිස්සමහාරාම නගර සභාව මේ ස්ථානවල කැලි කසළ බඳුන් තැබීමට පියවර ගත යුතුයි.

72. රජ කාලේ හදපු (දෙවැනිපෑතිස් රජ දවස) අත්තනගල්ලේ රත්මල්ගහ ජලාශය අද හොඳටම ගොඩ වෙලා, කොච්චර කිව්වත් පිළිසකර කර දෙන්නේ නැහැ. හැදුවොත්, අලුතින් කුඹුරු අක්කර සිය ගානක් වපුරන්න පුළුවන්.

73. 'ජාතියේ අංක 1' කියාගන්නා එක් බැංකුවක් මඟින් දැන් වසර ගණනාවක සිට සිය වායුසමන යන්ත්‍රයකින් පිටවෙන වතුර දිනකට දහස් ගණනක් ජනයා ගමන් කරන බොරැල්ල හන්දියේ පෙව්මන්ට් එකකට නොකඩවා හරවා යවනවා;

මහත් පරිසර විනාශයක් කරනවා. පාරේ යන මිනිසුන්ගේ ඇඳුම් පවා ජරා වෙනවා; මේ අයට මේ දෙවල් නොපෙනෙන හැටි.

74. නීති විරෝධී ලෙස ආරම්භ කල හෝටල් ව්‍යාපෘති නිසා යාල ජාතික වනෝද්‍යානයේ කලාප අංක හතරේ කැලෑ ඉඩම් විනාශ මුඛයටම ඇද වැටී තිබුනා. මෙම ඉඩම් කොටස් තුළ හෝටල් හා කදවුරු බිම් සකස් කරමින්, එම ස්ථානවලට ළගාවීම සදහා වනාන්තර විනාශ කරමින්, මහාමාර්ග තනා තිබෙනු දක්නට ලැබුනා. මේවා තවමත් සිදු වෙනවාද?

75. යාල ඇතුලේ කුඩාරම් ගසා, රට,විදේශ සංචාරකයන්ට පෙන්වන්න දිවියන්ව ලඟට ගෙන්වා ගත් අය හිටියා, උන්ට හරක් මස් ආදිය විසි කර. මේ කරන දෙයින් ඒ දිවියන්ට සතුන් දඩයම් කිරීමේ හැකියාවත් නැතිවෙලා යන බව මේ අයට තේරුනේ නැද්ද?

76. ලෝක උරුමයක් වන සිංහරාජ මහා වනය දෙකඩ කරමින් අඩි 28ක් පළල මාර්ගයක් මැදින් ඉදි කිරීමට 2013 දී රජය අවසර දී තිබුනා.

77. වනයක් මැදින් පාරක් කපනවා කියන්නේ ඒ වනයේ අවසානයි. විල්පත්තුවෙත්, යාලත් මේ දේවල්ම පසුගිය දා කරලා තියෙනවා.

78.නකල්ස් ලෝක උරුම වනාන්තරය තුල අනවසරයෙන් ලොකු ගස් කැපීම නිසා ගිං ගඟට, මා ඔයට හා කරඹකැටියේ ජල මුලාශ්‍රවලට දැඩි හානි සිදු වී තිබෙනවා. කැන්ද,ඇකේසියා, මාර,ලුණු මිදෙල්ල වැනි ඇතැම් ගස් වට අඩි 10-12ට වඩා වැඩියි. මේවා අවුරුදු 100ට වඩා පැරණි ගස් විය හැකි නොවේද?

79.නකල්ස් ලෝක උරුම වනාන්තරය තුල කොළඹ සල්ලි කාරයෝ නිවාඩු නිවාස තනාගෙනලු. සමහරක්, කළු සල්ලි කියලයි කියන්නේ.

80.වල් අලි ඉන්න මින්නේරියේ මහා සන කැලය කපලා සංචාරක හෝටලයක් හදපු දේශපාලනඥයෙක් ගැන ඒ දවස්වල පත්තරවල ගියා නේද. බිලා හිස් කරපු බියර් බෝතල් සිය ගණනක් එහෙමත් හම්බ උනාලු. ඒත් මුකුත් උනේ නැහැ නේද?

81.කෙසෙල් වගා කරන්න කියා සෝමාවතිය මහා වනයේ අක්කර දහස් ගානක තට්ටේ ගෑවාලු, පස්සේ කරන්න බැරිවෙලා හකුලාගෙන ගිහිල්ලා. හැබැයි විනාශය කරලා ඉවර උනාට පස්සේ. රටේ ප්‍රසිද්ධ අය සම්බන්ධ වෙලා තියෙනවා වැඩේට.

82. ජල පෝෂක අවහිර කරලා බදුල්ලේ හදන්න හදපු ගොල්ෆ් පිටියත් ඒ අය හකුලන් ගියා කියලයි කියන්නේ; ඇප, කැපවී වැඩ කරන පරිසර සංරක්ෂණ වේදීන්ට ස්තුති වෙන්න.

83. අතහැර දමන ලද විශාල ගල්වලවල්වල පතුළ, පිලිගත් ක්‍රමවේද අනුව සකසා කුණු (පොලිතීන් සහ ප්ලාස්ටික් ඉවත් කල) සහ පස් ක්‍රමානුකූලව තට්ටු වශයෙන් ඒවායේ පුරවා ඒ අතරට යෙදූ නල පද්ධතියක් මගින් එම කුණු මගින් නිපදවෙන ගෑස්, පොළව මතුපිට පිහිටවූ ගෑස් ටර්බයින් මගින් දහනයකර, විදුලිය සහ වෙනත් බලශක්ති (ගෑස් වැනි) නිපදවිය හැකියි.

84. දැනට කුණු දාන්න තැන් නැතිව, මහජනයාට මහත් විනකරන කුණු කඳුවල වගකීම භාරව ඇති නගරසභාවලට, ප්‍රාදේශීය සභාවලට, ඒ කුණු, ක්‍රමවේදයන් මත, පහත් බිම් ගොඩකිරීමේ ව්‍යාපෘති, මුහුද ගොඩ කරන ව්‍යාපෘති වලට යොමු කරවීමට සැලැස්වීමෙන්, එම ඉඩම් ගොඩකරන්න යන විශාල මුදල් ඉතිරි කරගන්න පුළුවන් වෙනවා පමණක් නොව, ඉතා පලදායි අතුරු ප්‍රයෝජනත් ලබන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් විශාල මුහුදු තීරයක් ගල් බැම්වලින් වෙන්කර (පෝට් සිටි ව්‍යාපෘතිය වැනි), හිස්කර, එම ප්‍රදේශය ගල්, පස් සමඟ ක්‍රමානුකූලව කුණු පුරවා රටේ කුණු ඉවත්කිරීමේ ප්‍රශ්නයට විසඳුමක් ලබාගතහැකි වෙනවා පමණක් නොව, අවශ්‍ය කරන නව බිම් තීරයන් බිහි කරගැනීමට පුළුවන.

85. අප රතිඤ්ඤා පත්තු කිරීමෙන් ආශ්වාදය ලැබුවත් අහිංසක සතුන් මොන තරම් බිය වෙනවද? දියුණු රටවල රතිඤ්ඤා පත්තු කිරීම තහනම් කරලා තියෙන්නේ මේ නිසයි.

86. පරිසරය සුරැකීම, පරිසරය පිරිසිදුව සහ ලක්ෂණට තබා ගැනීමේ වැඩ; රජයකට සෑම දෙයක්ම කරන්න අමාරුයි. පොදු මහ ජනතාව, ව්‍යාපාරික ප්‍රජාව හවුල් කර ගත යුතුයි. උදාහරණයක් වශයෙන් පවත්නා රජයක ප්‍රබල ඇමතිවරයෙක් කොළඹ නගරයේ ව්‍යාපාරික ප්‍රජාව පුද්ගලිවකම ඔවුන්ගේ ප්‍රදේශවලට ගොස් හමුවී ඔවුන්ගේ වියදමින්, ඔවුන්ගේ ව්‍යාපාරික ගොඩනැගිලි පිළිසකර කර, තීන්ත ආලේප කිරීම වැනි දේ කර, ඔවුන්ගේ ව්‍යාපාරික ස්ථානය සහ අවට පරිසරය/මාර්ග වටරවුම් ආදිය පිරිසිදුව සහ දර්ශනියව තබා ගැනීමට උදව් වෙන ලෙස ඉල්වා සිටියොත් ඒ අය එම ඉල්ලීම ඉතා සතුටින් භාර ගත්නවා පමණක් නොව කියූ පරිදිම කටයුතු කරනු ඇත. මේ සඳහා අදාළ ඇමතිවරයා ඉතා කැපවීමෙන් කටයුතු කල යුතු අතර ව්‍යාපාරික ප්‍රජාව පිළිගත්, ඔවුන්ගේ විශ්වාසය දිනු කෙනෙක් විය යුතුයි. මේ සිද්ධාන්තය අනිත් ප්‍රධාන නගරවලටද ආදේශ කල හැකියි.

87. ස්වභාව ධර්මයට විරුද්ධව යමින් (බොහෝවිට හුදු දේශාපාලන උවමනා මත), ගහවල් හරවන්න ගිහින් ඒ ගහවල් අපි ‘මරාගෙන’ තියෙනවා. ගහක් හරවන විට අලුතින් හදන මාර්ගයේ, ස්වභාවික ගංගා මාර්ග තුල තිබෙන

ඉබේටම යටින් උනන වතුර උල්පත් ඒවායේ නැහැ. ඉතින් කෘතිමව හදන ගඟක් කවදාවත් ස්වභාවික ගඟක් වගේ නැහැ.

88. පායන කාලයට මධ්‍යම කඳුකරයේ අධික වියළි කාලගුණය නිසා මහවැලි ගඟ ඉක්මනට සිඳී යනවා. **1970** මුල ගණන් වල (මහවැලි ගඟ හරවන්න ඉස්සර) මෙවැනි තත්ත්වයක් තිබුනේ නැහැ. මහනුවර තැන්නේකුඹුර ප්‍රදේශයට ගිහින් බලන්න, ගල් පර මතුවෙලා මහවැලි ගඟ සිඳී ගොස් තිබෙන අයුරු. හරවන්න ඉස්සර මහවැලි ගඟේ මෝරු වගේ ලොකු මාළු පීනලා තියෙනවා, අද මාලුවෙක් නැති තරම්. තැනින් තැන ගඟ හරස් කර වේලි බැන්දහම කොහොමද ලොකු මාළු ජල ධාරාව සමඟ පිහිනා යන්නේ?

89. **2016** ජනවාරි මාසයේදී වික්ටෝරියා ජලාශයේ වාන් දැමීමට තරම් ජලය පිරී තිබූ මහවැලි ගඟේ ජලය මාස දෙකහමාරකට පසුව පතුලටම සිඳී යනවා.

90. නුවර පැරැන්නෝ දන්නවා අද මහවැලි ගඟ පතුලටම සිඳී ගොස් ඇති තැන්නේකුඹුර පාලම යටින් **1981** පෙර මොන තරම් වතුර කන්දරාවක් ගලාගෙන ගියාද කියා. අද ස්ථිර ලෙස මතුවී ඇති ගල්පර එදා මතුවුනේ ඉතා තදබල නියං කාලයකදී පමණයි - වසර ගනණාවක් තුළයි.

91. වලවේ, කැළණි, කළු ගංගා මාර්ග අවහිර කර නොයෙක් වාරි සහ ජල විදුලි ව්‍යාපෘති පටන් ගන්න යන බවට ප්‍රවුර්ති

තියෙනවා. තැනින් තැන වේලි බැඳලා. මේ ගංගාත් 'මරා' දමන්නද හදන්නේ?

92. උමා ඔය ව්‍යාපෘතිය නිසා බණ්ඩාරවෙල පැත්තේ මිනිස්සු විඳින දුක්, කරදර දන්නේ ඒ මිනිස්සු විතරයි.

93. මීරියබද්ද නාය යාමට (2015) උමා ඔය ව්‍යාපෘතියට (ගල් කැඩීම සහ උමං ඉදිකිරිම) සම්බන්ධ බව පරිසර විද්‍යාඥයයෝ පෙන්වා දෙනවා.

94. ප්‍රධාන රෝහලක්, දුම්රිය පොලක් තිබෙන රාගම බස්නාහිර පළාතේ තිබෙන අවලස්සනම, අපිරිසිඳුම නගරයක්. වැඩිය අවශ්‍ය නැහැ රාගම නගරයේ, හොරපේ පාරේ දුම්රිය පාලම යට තියෙන කැළිකසළ, ඉටි අපද්‍රව්‍ය, යෝගට් කෝප්ප,. ලොරි ගණනින් ගොඩ ගැසී තිබෙන හැටි බලන්න.

95. විදුලි ව්‍යාපෘතියක් නිසා ශ්‍රී ලංකාවේ අතිශයින්ම සුන්දර සෙන්ට් ක්ලෙයාර් දිය ඇල්ල බාගෙට මරා ගත්තේ අපි නේද මේ මෑතකදී. පරිසර හානිය/ස්වාභාව සෞන්ධර්ය කෙසේ වෙතත් සංචාරක ආදායම අඩු වීමෙන් පමණක් අපට කොපමන ආදායමක් නැති වෙයිද?

96. රයිගම් උඩුගහපත්තුව සතු එකම වැව ලෙස සැලකෙන පනංගල වැව ශීඝ්‍රයෙන් ගොඩ වී යාමේ තර්ජනයකට මුහුණ තිබෙනවා. ඉංගිරියේ පිහිටි මෙම වැව ගොවිතැන් කටයුතු සඳහා මෙන්ම අලංකාරය අතින්ද වැදගත් තැනක් උසුලන

අතර, ජල මූලාශ්‍රයක තිබිය යුතු 'රිසවේෂන්' කොටසද නොසලකා හැර ඇතැම් පුද්ගලික ඉඩම් හිමියන් මේ වැව ගොඩ කරගෙන යනවා.

97.ගල් අඟුරු තාපක හොඳයි කියනවා නොවෙයි, නමුත් ජල විදුලි ව්‍යාපෘති වලින් වෙන ගංගා මැරීයාම, මත්ස්‍ය වර්ග ක්ෂය වීම ඒවායින් කෙරෙන්නේ නැහැ.

98.අප න්‍යෂ්ටික විදුලියට අත නොගැසිය යුතුයි. න්‍යෂ්ටික විදුලි බලාගාර අනතුරක් සිදුවුවහොත් විය හැකි ව්‍යසනය කියා නිම කල නොහැකියි. අරපරිස්සමින් අඩු සමාජයක් වන අපට චෙරෝනොබිල්, ෆුකොෂිමා වැනි වූ අනතුරක් සිදුවුනොත් ඒවා පාලනය කරගත නොහැකි වීමේ සම්භාවිථාව ඉතා වැඩියි. දහස් ගණනින් අහිංසක මිනිස්සු මැරී යාවි (බිහාර් නගරයේ භෝපාල් ඛේධවාචකය මතක් වෙනවා).

99.දියුණු රටවල පාරවල් අද්දර, ඉඩම් වල කුණු ගොඩවල් ගසා නැහැ. ඉතා ලස්සනට ඒ රටවල කසළ ඉවත් කරන, ප්‍රතිචක්‍රී කරණ ක්‍රම වේද තියෙනවා.

100. අවට පරිසරය පිරිසිඳුව තබා ගන්න, ඩෙංගු මදුරුවා මර්ධනය කරන්න.

# • දියුණු වීමට හොඳ රාජ්‍ය ප්‍රතිපත්ති මෙන්න:

101. අපේ නායකයෝ හැම අතින්ම ආදර්ශමත් විය යුතුයි.

102. සමහර දේශපාලනඥයන් ඉන්නේ රටේ නීතියට ඉහළින්.

103. ඕස්ත්‍රේලියාවේ අගමැතිටත් පොලිස් කාරයෙක් දඩ කොලයක් දීලා සීට් බෙල්ට් නොදා ගිහින්.

104. ලංකාවේ රාජ්‍ය නායකයෝ, හිටපු රාජ්‍ය නායකවරු, මැති ඇමතිවරු, නීති ක්ෂේත්‍රයේ අය ඉඳලා හැමෝටම එකම විදියට නිතිය ක්‍රියාත්මක වෙනවා නම් -පොලිසියට මල් මිටක් පුදන්න පුළුවන් විදියට ඒ අය රාජකාරිය ඉටු කර පෙන්වාවි. දේශපාලනඥයෝ තමයි බොහෝ වෙලාවට හැමදේටම හොට දාලා විනාශ කරලා දාන්නේ.

105. උසස්ම රාජ්‍ය නායකයන්ගේ ඉඳලා පහලටම 100% පිරිසිඳු වෙනවා නම්, පොලිසි සහ වෙනත් නීති රක්නා ආයතන තුල නීතිය මුළුමනින්ම ක්‍රියාත්මක වෙන තත්වයක් බිහි වුනොත්, සියළු රජයේ අනෙක් ආයතන වංචා

විරහිත වෙනවා නම්, මේ රට සුරපුරයක් වෙනවා නොඅනුමානයි.

106. ලංකාව තරම් දේශපාලනයකරණීය වූ රටක් තවත් මේ ලොව නැති තරම්.

107. පැති පනින දේශපාලනඥයා එක පාරක් නොව කිහිප පාරක්ම පනිනු ඇත, තම හුදු ආත්මාර්තකාමිත්වය උදෙසා.

108. පැති දේශපාලනය මේ රටේ පටන් ගත්තේ 1951දී එවකට රජයේ ඇමතිවරයෙක් රජයෙන් ඉවත්වී කණ්ඩායමක් සමඟ වෙනත් දේශපාලන පක්ෂයක් පටන් ගැනීමෙන්. ඊට පෙර රටේ තිබුනේ එක් ප්‍රධාන දේශපාලන පක්ෂයක් පමණයි. මෙසේ ප්‍රධාන පක්ෂ 2ක් බිහිවීමෙන් රටේ ජනතාව දෙකට බෙදුනා පමණක් නොව ඔවුන් අතර ආරාවුල්, කුලල් කා ගැනීම් පටන් ගත්තා, බොහෝ දෙනෙක් දේශපාලන බේධ නිසා මිය ගොස් තිබෙනවා. අදටත් මේ දේවල් වෙනවා. ඒ වගේම, බෙදුම්වාදීන්ට නව පණක් ලැබුනා.

109. 1948දී අපේ රටේ ආර්ථිකය ජපානයට පස්සේ ආසියාවේ 2වැනි තැනට වගේ තිබුනේ. අදුරදර්ශි, දූෂිත දේශපාලනය නිසා අපි අද අන්තිම ණය හරිත; තවමත් 3වන ලෝකයේ වූ රටක් හැටියට පවතිනවා.

110. 1950 ගණන් වලදී ලී ක්වාන් යූ කිව්වේ සිංගප්පූරුව ශ්‍රී ලංකාව වගේ වෙන්න ඕන කියලා. 1980 ගණන් වලදී එතුමා කිව්වේ සිංගප්පූරුව ශ්‍රී ලංකාව වගේ නොවිය යුතුය කියලා. අපේ දේශපාලනඥයන්ගේ හපන්කම් ඒ ප්‍රකාශ දෙකෙන් මොනවට පිළිබිඹු වෙනවා.

111. ධනවාදී ආර්ථික ක්‍රමය හොඳයි කියනවා නොවෙයි, නමුත් සමාජවාදී/කොමියුනිස්ට් ආර්ථික ක්‍රමත් දූෂිත වෙලා නේද තිබුනේ. මිනිස්සුන්ට කොමියුනිස්ට් ක්‍රමයෙන් ලැබුනේ දිළිඳු වූ ජීවන මට්ටමක්.

112. අද කොමියුනිස්ට් යයි කියා ගන්නා චීනය ලෝකයේ වැඩියෙන්ම ධනවාදී ආර්ථික මූලධර්ම ක්‍රියාත්මක කරන රටක්. කියුබාව පොහොසත් නොවුනත්, යම් තරමකට සාධාරණ සමාජ ක්‍රමයක් බිහි කලා වූ රටක්, නමුත් අනාගතයේදී ඇමරිකාව ඒ රටත් ‘ඩැහැ’ ගනු ඇත.

113. 1950 මැද ඉඳලා 1970 මැද කාලය විතර වෙනකම් ‘සමාජවාදී’ ලේබල් අලවගත්ත රජයන් අත්තනෝමතික ලෙස පෞද්ගලික අංශයේ ව්‍යාපාර රජයට පවරා ගත්තා. සමහරක් කලේ දේශපාලන පලිගැනීම් ලෙස. ඒ ව්‍යාපාර බොහොමයක් පස්සේ වැහිලාම ගියා. ෂෙල් කොම්පැනිය, BCC, යුන්යිටඩ් මෝටර්ස් වගේ විශාල පරිමානයේ කොම්පැනි රජයට පවරා ගත් ඒවා කිහිපයක්. මරදානේ බුහාරි හෝටලය පවා රජයට ගත්තා. පුවත් පත් ආයතන රජයට පවරා ගත්තා විතරක් නොවෙයි පුවත් මුඛ වාඩම්

දැම්මා, රජයක් සාධාරණ ලෙස විවේචනය කල පත්තර සමාගමකට පත්තර මුද්‍රණ කඩදාසි දුන්නේ නැහැ. සමහර පත්තරවල කතුවැකි 'බල්ලෝ කෑමට' ලක් කළා. හොඳ, විශාල තේ, රබර් වතු රජයට අරගෙන පොඩි කෑලි කෑලි වලට කඩලා දැම්මා - අක්කර 50ට වගේ. වතු ආර්ථිකය නැතිකරලම වගේ දැම්මා. 1948 ආසියාවේ දෙවෙනියට හොඳම ආර්ථිකය තිබුණු රට, බලා ඉන්දැද්දී දුප්පත් උනා.

114. අද අපි විදේශ ආයෝජන එනතෙක් කට ඇරගෙන බලා සිටිනවා. ලොව පිළිගත් බහුජාතික සමාගම් කීයක් බොහෝ දුරට අපේ සමහර 'සමාජවාදී' රජයන්වල ප්‍රතිපත්ති නිසා වැසී ගියාද? මතකයට එන සමහර එවන් බහු ජාතික හෝ විදේශ සම්බන්ද්ධතා තිබු සුප්‍රකට සමාගම් නම්: ලිප්ටන්, බ්රුක් බොන්ඩ්, විටෝල් බවුස්ටඩ්, වොලංකා, කාසන් කම්බබැච්, කොලට්ස්, රෝලන්ඩ්ස්, වෝකර්ස්, බ්‍රවින්ස්, වෝකර් ඇන්ඩ් ග්‍රෙග්, ලුවිස් බ්‍රවුන්, සීඩ්ල්ස්, බාට්ලිට්ස්, මුලර් ඇන්ඩ් පිප්ස්, ඇන්ග්ලෝ ඒෂියන්, CV බහාට්, ආඩම්ජී ලුක්මන්ජී, මිලර්ස්, ඇපොතිකරිස්, මොරිස් රෝච්.

115. වරායන් ජනසතු කිරීමෙන් ඒවායේ සේවකයන්ගේ ජීවන/සේවා තත්ත්ව ඉහල ගියා. හැබැයි ජනසතු කරලා අවුරුද්දක් ඇතුලත වරායන්හි නිෂ්පාදන/පලදායි හැකියාවන් 50%ක් දක්වා පමණ අඩුවෙලා ගියා කියලයි කියන්නේ.

116. දුක් මහන්සින් වී, දිවා රෑ නොබලා වැඩ කර, තම ව්‍යාපාරය ගොඩනඟා ගත් බස් ව්‍යාපාරිකයෙක් පිළියන්දල සිටියා. 1958 දි ඔහුගේ බස් සියල්ල පැය 24න් රජයට පවරා ගත්තා; වන්දි මුදල් හැටියට ලැබුනේ සොච්චමක්.

117. මීගමුවේ සිටි දුක් මහන්සිවෙලා දිවා රෑ මහන්සි වී වැඩ කර නිවාස 25 -30 ගණනක හිමි කරුවෙකුට 1971/2 විතර ඒ නිවාස ඔක්කොම වගේ රජයට පවරා දෙන්න සිද්ධ වුනා. දරුවන් නොසිටි ඒ මහත්තයා සහ නෝනා දෙන්නම මලේ තදබල සිත් අමාරුවෙන්.

118. රට දියුණු කරන්න නම් ඉස්සෙල්ලම නිරෝගී ජනතාවක් බිහි කල යුතුයි.

119. අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල වැඩි කිරීම පුදුම ලෙස වැඩි වෙනවා; මිනිස්සු කන බොන දේවලින් බදු අය කිරීම අද බවට මෝස්තරයක් වෙලාද?. වර්තමානයේ ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් වන ආහාර පාන, රෝහල්, බෙහෙත් ආදියෙන් අධික ලෙස බදු අය කිරීම නිසා කබලෙන් ලිපට වැටෙන්නේ ජීවිතය ගැට ගසා ගන්න හා දුක් විදින අහිංසකම දුප්පත්, අසරණ මිනිස්සු.

120. ඩුබායි රටේ බදු ඇත්තෙම නැහැ.

121. **2016** මැයි මාසයේ මහා ගංවතුරක් ඇවිල්ලා ලක්ෂ **5**ට වඩා ජනයා අවතැන් වෙලා, කඳවුරු යනාදියේ සිට නැවත ගෙවල් බලා යනවිට අත්‍යාවශ්‍ය බඩු මිල සේරම වගේ වැඩි වෙලා, පාන් ගෙඩියේ ඉඳලා. නැවත ගෙවල් හදාගන්නේ කොහොමද කියලා ඒ මිනිස්සු හිතනකොට සිමෙන්ති කොට්ටෙක මිල තව රුපියල් **60**කින් ඉහල ගිහිල්ලා.

122. අපේ රටේ බොහෝ කාන්තාවන් මැද පෙරදිග ගොස් ඉතාම දුක් ගැහැට විඳිනවා. කාන්තාවන් ගෘහ සේවයට මැද පෙරදිග යවනාවානම් ඔවුන් ආරක්ෂා කිරීමට සහ ජීවන තත්ත්වය නංවාලීමට රජයන් මීට වඩා බොහෝ දේ කල යුතුයි. ඇත්තවශයෙන්ම ඔවුන්ව නොයවනවා නම් වඩාත් හොඳයි. ඉන්දියාව ඔවුන්ගේ කාන්තාවන් මැද පෙරදිග යවන්නේ නැත.

123. අලි - මිනිස් ඝට්ටනයෙන් බැට කන මිනිස්සුන්ගේ ජීවිත ඉතා දුක්ඛිතයි. හැමදාම රෑට නිදාගෙන්නේ මොන තරම් බයකින්ද; ‘අද අලියා එයිද, ගේ කඩයිද, වගාව හානි කරයිද, මගේ අඹුව/ළමයි සුරක්ෂිතද’, ආදී නගරබද වැසියාට නැති ප්‍රශ්ණ මේ අයට තියෙනවා. මේවා ජීවිතය, මරණය අතර ප්‍රශ්ණ. නමුත්, මේ අයගේ ප්‍රශ්ණ විසඳන්න මේ දක්වා කිසිම රජයකට බැරි උනා. ඒ නිසා ඉතා වටිනා මිනිස් ජීවිත සහ වන අලි සිය ගණනක් සෑම අවුරුද්දකම මැරී යනවා. තවමත් සිද්ධ වෙනවා.

124. තමන්ගේ බිරිඳ, දරුවන්, තම දේපොළ, ආරක්ෂා කරගැනීම උදෙසා කෙනෙක් අන්තයටම යන්න පුළුවන්. අලින්ට වෙඩි තියන්න, හක්කා පටස් ඇටවීමට, වගා ලිං වල ගිල්වීම වැනි ක්‍රියාවන් වලට පෙළඹෙන්නේ වෙනත් කරන්න කිසිම දෙයක් නැති නිසායි. අලි-මිනිස් සට්ටනයට දොස් කියන්න ඕන එයට මැදිවී සිටින මිනිස්සුන්ටවත්/අලින්ටත් නොවේ, රජයන්ට. මේ සා විශාල ප්‍රශ්නයක් විසඳන්න පැහැදිලි ප්‍රතිපත්තියක් නැතිකම සහ ඒ පිළිබඳව දිවා රෑ නොතකා විසඳුම් නොසොයවීමෙන් ප්‍රත්‍යක්ෂ වන්නේ මෙතෙක් වූ රජයන්ට මිනිසුන්ගේ බොහෝ දැවෙන ප්‍රශ්නවලටද පැහැදිලි, සාර්ථක විසඳුම් විසඳුම් ලබාදීමට නොහැකිවී ඇති බව සහ තදබල කැපවීමක් සහ උවමනාවක් නොමැතිකමයි.

125. මේ අලි මැරෙන විදියට නුදුරු අනාගතයේදී අලි අපේ අභය භූමි වලට පමනක් සීමා වෙන්න බොහෝ දුරට ඉඩ තියෙනවා; යාල, විල්පත්තුව, උඩ වලවේ වැනි. කුරුණෑගල, අනුරාධපුරය, පොලොන්නරුව, අම්පාර දිස්ත්‍රික්ක අපේ අලින්ට ඉතා හොඳටම අපලයි.

126. අපේ අනාගත පරම්පරාවට ලියෙන් කැපූ අලි බලා සැනසෙන්න වෙයිද?

127. උඩවලවේ යනු අලින් වෙනුවෙන් බිහි කල අභය භූමියක්. එය තුලට අවට ගම්වාසින් තම කිරි ගවයන්

දක්කනවා. මේ ගවයන් කන්නේ අලි, විශේෂයෙන්ම අලි පැටවුන්, කන තණකොළමයි. වනජීවියේ මහත්තුරු/මහත්මීන් ගවයන් දාන්න ඉඩ නොදෙන කොට සමහර දේශපාලනඥයෝ කෑ ගහනවා. ගවයන්ව අභය භූමිය තුලට දැමීමට ඉඩ දිය යුතුයි කියා. ඒ අය බොහෝ දුරට කෑ ගහන්නේ චන්ද ගැන සිතායි; අපේ පරිසරය සහ වනජීවීන් ආරක්ෂා කරගත යුතු යයි නොසිතන නිසායි.

128. කොළඹ - මඩකලපුව දුම්රිය මාර්ගයේ අලි විශාල ප්‍රමාණයක් දුම්රියේ හැපීම නිසා මිය යනවා. මේ දුම්රිය රථ දුම්රිය මාර්ගයේ අලි ගැවසෙන ප්‍රදේශවල ඉතා සෙමෙන් ධාවනය කර හෝ මේ අහිංසකව සතුන් බේරා ගත යුතුයි.

129. අද ලංකාවේ වනාන්තරවල අලි 2000ක් වත් ඉතුරුව නැතැයි එක් පරිසර විද්‍යාඥයෙකුගේ උපකල්පනය වුනා. අලි සංගණනයක් කියා කලේ අමු මුලාවක් බවයි ඔහුගේ අදහස, එකම අලියා දෙතුන් වතාවක් ගැන්නාලු.

130. අලියෙක් අඩු තරමින් රුපියල් ලක්ෂ 60ක් වත් වටිනවා. ළපටි/තරුණ අලියෙකුට ලෝක වෙළඳ පොලේ ඇති වටිනාකම ඉතාම ඉහලයි; ලක්ෂ 120ක් පමණ තමයි කියන්නේ. මෙවන් තත්ත්වයක, අලියා යනු අධි ආර්ථික වටිනාකමක් ඇති සතෙක් බවට හෝ සලකා හෝ, උන්ව ආරක්ෂා කිරීමට අප මීට වඩා බොහෝ සැලකිලිමත් විය යුතුයි.

131. ශ්‍රී ලංකාවේ පෙරහැරවලට බුරුමයෙන් අලි ගේනවා යයි කතාවක් ඇහුනා.

132. එදා සිය දහස් ගණනින් ලංකාවේ සැරි සැරූ වලහා, දිවියා, කිඹුලා වැනි සතුන් අද නැත්තටම නැතිවී වගේ ගොස් නේද? අතලොස්සක්වූ ඉන්න සතුන් ටික දෙනාවත් ඇස් දෙක වගේ බලාගන්න කටයුතු නොකරන්නේ ඇයි?

133. තේ වතු ආශ්‍රිත ව සැරිසරන, ශ්‍රී ලංකාවට පමණක් ආවේණික දිවියන් විශාල ගණනින් හිටි ගමන් මිය යන්න පටන් අරං. හැටන්, වටවල, ආගරපතන, කොටගල හා නොර්වුඩ් හි දිවියන් ගණනාවක් බාහිර තුවාල නොමැතිව මිය යාමට හේතුව උන්ට මස් වලට වස දමා සහ උගුල් වලට අසු කර මරා දැමීම බව වනජීවි නිලධරයෝ කියත්. මෙහෙම ගියොත් මේ දිවියෝ නැවත අපිට දකින්න ලැබෙන එකක් නැහැ.

134. මේ මෝඩ වැඩ කරන වතු කම්කරුවන් මේ දිවියන්ගෙන් රැක ගැනීමට අවශ්‍ය සියළු කටයුතු කල යුතුයි. වතුකරයේ තිබෙන කුඩා කැලෑ අතොරක් නැතිව එලි පෙහෙළි කිරීම මෙයට එක් ප්‍රධාන හේතුවක්.

135. අක්කර 70 ක පමණ නුවර එලිය දිස්ත්‍රික්කයේ (නෝර්ටන් බ්‍රිජ්) රජයේ කැලෑ වගාවක් මේ මෑතකදී යන්ත්‍ර දාලා කපලා සුද්ද කරලම දාලා තියෙනවලු. ඒ අය ඇවිල්ලා

තියෙන වාහනවල රාජ්‍ය වන ආයතනයක බෝඩ් බොරුවට ගහගෙන. මේ විස්තරය කියපු කෙනා කිව්වේ බලගතු දේශපාලනඥයෙක් සම්බන්ධයිලු වැඩේට, ඒ නිසා රාජ්‍ය නිලධාරින් නීතිය ක්‍රියාත්මක කිරීමට බය වුනාලු.

136. අධිවේග හදන්න එපා කියනවා නෙවෙයි. ඊට වඩා වැදගත්, තියෙන දැවෙනම ප්‍රශ්නයක් තමයි අති දැවැන්ත වාහන තදබදයට විසඳුම් සෙවීම. සතියේ දිනකට වාහන තදබදය වැඩිම වෙලාවට, අතුරුගිරියේ මිනිහෙක් බස් එකෙන් (170) කොළඹ යන්න, km 20ක් වත් නැහැ, පැය 2ක් යනවා. මහා විකාර තත්වයක්. බොරැල්ල හන්දියේ ට්‍රැෆික් එකට විනාඩි 20ක් අහුවෙච්ච ත්‍රීවීල් මල්ලියෙක් ඉන්නවා.

137. අද ලංකාවේ තියෙන ලොකුම ප්‍රශ්නයක් 'ට්‍රැෆික් ජෑම්ස්'. රජයන්ට මේවා දෙස නොබලා ඉන්නා බැහැ. මෙහෙම ගියොත් තව අවුරුදු 5ක් යනවිට කොළඹ සිට අවිස්සාවේල්ලට යන්න පැය 4 ක් යාවි.

138. මේ ඉතා උග්‍ර ට්‍රැෆික් ප්‍රශ්නය දැන්මම විසඳුවේ නැත්නම් 2020 වෙනකොට වාහනවලට සමහර ට්‍රැෆික් ලයිට් වල විනාඩි 20 – 25 නවත්තගෙන ඉන්න වේවි.

139. අද කොළඹ වටිනා වාහන ගෙදර තියලා ත්‍රී වීල් වලින් ගමන් යන බොහෝ අය ඉන්නවා; ට්‍රැෆික් ප්‍රශ්නය නිසා.

140. මාර්ග නීති තදකරලා, වාහන මිල උස්සලා, මාර්ග වන් වේ කරලා පමණක් මේ තියෙන වාහන තදබදය නැති කරන්න බැහැ. අලුත් අදහස් තියෙන අයට මේ වැඩ බාර දෙන්න ඕන - ට්‍රැෆික් ලයිට්ස්, පොලව යටින්, පොලව උඩින් යන මාවත් (ෆ්ලයි ඕවර්ස්), අලුත් මාවත්, තියෙන මාවත් පළල් කිරීම (මොන බලපෑම් ආවත්), පාරවල් හොඳට කාපට් කර හැදීම, වාහන නොයන පාරවල් වාහන සඳහා විවෘත කිරීම, වසා ඇති පාරවල් ඇරීම, ලේන් වල තාප්ප කඩා, නිවෙස්/කඩ කඩා හෝ නව පාරවල් බිහි කිරීම (වන්දි ගෙවිය යුතුයි), ප්‍රධාන, ජනාකීර්ණ පාරවල රථවාහන නතර කිරීම සම්පූර්ණයෙන්ම නැවත්වීම, මං සන්ධිවල කුඩා 'රවුන්ඩ් අබවුට්'ආදිය ඇතිකිරීම, නගරාසන්න බස්/දුම්රිය සේවා වැඩි දියුණු කිරීම, ලොකු බස් වෙනුවට පොඩි බස් යෙදීම, දුම්රිය මැදිරි වැඩි කිරීම වැනි නව ක්‍රමෝපායන් සෑම එකක්ම සලකා බලන්න වෙනවා මේ ට්‍රැෆික් ප්‍රශ්නය විසඳන්න.

141. රටේ ආර්ථිකයට මරුම මරු පහරක් මේ ට්‍රැෆික් ප්‍රශ්නය. මිනිසුන්ගේ වැයවෙන කාලය, නිරපරාදේ දහනය වන ඉන්ධන පමණක් නොවේ මිනිසුන්ගේ මානසිකය පවා

පිරිහෙනවා. සංචාරකයෝ/ආයෝජකයෝ එන්නේ නැති වෙයි.

142. පැය ගණන් කාර්/බස් ඇතුලේ ට්‍රැෆික් එකට හිරවෙලා තම වටිනා කාලය නිරපරාදේ වැය කර ගන්නේ මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යාමේ කර්තව්‍යට කෙලින්ම උරදී සිටින රටේ වැඩ කරන ජනතාවයි.

143. කොළඹ, නුවර,ගාල්ල නගරවල අදත් තියෙන්නේ සුද්දා හදලා ගිය පාරවල්. මේවා ඉතා පටුයි. මේ පාරවල් පළල් කිරීම, මාර්ග පද්ධතිය දික් කිරීම, නව පාරවල් හැදීම වැනි බොහෝ දේ අපි කරලා නැහැ. සුද්දා ගිහිල්ලා දැන් අවුරුදු 70කට කිට්ටුයි. පාරවල්වලට දාන රථ සංඛ්‍යාව නම් සුද්දා ගියාට පස්සේ දස දහස් ගුණයකින් වැඩි වෙලා,නමුත්, පාරවල තත්ත්වය දස දහස් ගුණයකින් කෙසේ වෙතත් සිය ගුණයකින් වත් වැඩි දියුණු වෙලා නැහැ.

144. ට්‍රැෆික් ප්‍රශ්නයට හේතුව රටේ වාහන වැඩි කම කියා දැන් වාහන ගෙන්වීම සීමා කරන්න හදනවා. මේක හිසේ රදේට කෝට්ටේ මාරු කරනවා වගේ වැඩක්.

145. අපේ ට්‍රැෆික් ලයිට්ස් පරිගණක තාක්ෂනය යොදාගෙන උපරිම ලෙස කළමනාකරණය කරන්න ඕන, ට්‍රැෆික් අඩුකර ගන්න. පුළුවන් තරම් වාහන ට්‍රැෆික් ලයිට්

එකක් ළඟ ගොඩ නොගහා නිදහස් කරන්න බලන්න ඕන. උදාහරණ වශයෙන් කෙලින් යන වාහනවලට පුළුවන් තරම් එක දිගටම, පේලියේ තියෙන සෑම ට්‍රැෆික් ලයිට් එකකින්ම 'කොළ' දෙන්න බලන්න ඕන, නොනැවතීම එම වාහනවලට යන්න.

146. හතර මං හන්දිවලදී 'රතු' තිබුනත් ප්‍රවේශමින්, වාහනවලට වමට හරවන්න ඉඩ දෙන්න ඕන.

147. කොළ *ඊතලයම* අවශ්‍ය නැහැ ට්‍රැෆික් ලයිට් තියෙන සතරමං හන්දියකදී වාහනයක් දකුණට හරවන්න. 'කොළ' පමණක් තිබුනම ඇති. ඉදිරියෙන් වාහන එන්නැති බව බලලා ප්‍රවේශමින් දකුණට හැරවිය හැකි විය යුතුයි.

148. හතර මං හන්දියක ට්‍රැෆික් කන්ට්‍රෝල් කරන රාලහාමි හුඟක් වෙලාවට බලන්නේ එක මාර්ගයක වාහන පේලියටම අවම කරලා අනිත් මාර්ගය වාහන වලට විවෘත කරන්න. සමහර වෙලාවට අත වන වනා ඇත එන වාහනවලට අඬගහනවා. මේකෙන් වෙන්නේ අනිත් මාර්ග 3නේ ඉතා දිග වාහන පෝලිම් හැදෙනවා. කරන්න තියෙන්නේ වාහන 25% - 30% විතර අඩු උනාට පස්සේ තවත් මාර්ගයක් විවෘත කරන්නයි. එතකොට අනිත් මාර්ග 3 දිග රථවාහන තදබදය නතර වෙනවා. ඉක්මනට වාහන 'ක්ලියර්' වෙනවා.

149. හතර මං හෝ ඊට වැඩි හන්දිවල ට්‍රැෆික් කන්ට්‍රෝල් කරන රාලහාමිලා හොඳ පළපුරුදු අය උනත් සමහර වෙලාවට හරියට වැඩ බැරි අය ඉන්න බවත් පේනවා. තුන්මුල්ල හන්දියේ යන්න තියෙන පාරවල් වාහන වැරදි ලෙස ගෙන්වාගෙන අහුරා ගත් රාලහාමි කෙනෙක්ව දැක්කා.

150. ගම්බද දුෂ්කර ප්‍රදේශවල තියෙන පාරවල් අඩුම තරමින් කොන්ක්‍රිට් දාලා හරි හදන්න ඕන. ගොවියන්ට තම නිෂ්පාදන ප්‍රධාන මාර්ගවල යන ලොරිවලට පැටවීම සඳහා ගෙන ඒමට හොඳ මාර්ග පද්ධතියක් තියෙන්න ඕන. ඔය අධි වේග වලින් උද්ධමනය අඩු උනේ නැහැනේ, ගම්බද ප්‍රදේශ වල අලි නාවන වලවල් වලින් පිරි බොරළු/පස් පාරවල්, කොන්ක්‍රීට් දාල හදලා දුන්නොත් දළ ජාතික ආදායම බලන් ඉන්දැද්දී ඉහල යයි.

151. වවුනියාවේ කැලෑ බෝගස්වැව ඉදලා ජනකපුරට යන මාර්ගයේ ගිහිල්ල බලන්න - km 40ක් විතර ඇති. පැය 3ක් විතර යනවා බස් එකෙන් යන්න. පිස්සු හැදෙන මාර්ගයක්. හදන්න කවුරුවත් උනන්දු වෙන්නේ නැහැ වගේ.

152. කොළඹ - මාතර, කොළඹ - කටුනායක, කොළඹ - නුවර අධිවේග කමක් නැහැ කියමුකෝ. නමුත් මාතර - හම්බන්තොට, නුවර - යාපනය වැනි මාර්ග අධිවේග තනන්න තරම වාහන තදබදයක් තියෙන මාර්ග නොවෙයි.

හොඳට එක් පැත්තකට මං තීරු දෙක (හෝ තුනක්) වෙන්න, දැන් තියන පාරවල්ම පළල් කරලා කාපට් කළා නම් ඇති. බොරුවට කැලෑ කපලා, කුඹුරු/වතුපිටි යට කරලා, වනජීවී දහන් විනාශ කරලා, පරිසර දූෂණය උපරිම කරලා, ලෝකෙටම ණය වෙලා හදන අධිවේග වලින් වැඩක් නැහැ. පාලු පලාත්වල බිලියන ගනන් වියදම් කර නව අධිවේග හදන්න, පිස්සු වැඩක්, ඊටත්ම ලංකාවේ අධිවේග හදන්න යන මුදල ඇමරිකාවේ ඒවා හදන්න යන මුදල හා සමානලු.

153. මාතර සහ ඉන් එහා දක්වා දීක්වෙන දක්ෂිණ අධිවේගය නිසා ලෝක උරුමයක් වූ සිංහරාජ වනෝද්‍යානය දෙපලකින් දෙකඩ වන බවයි වාර්තා වුනේ.

154. අනාගතයේදී හදන නව අධිවේග මාර්ග නිසා උඩවලවේ වන උද්‍යානය, විතාරකන්ද, ලුණුගම්වෙහෙර, මදූනාගල, වීරවිල, නිමලව, බුන්දල, උස්සන්ගොඩ, කතරගම, යාල, බුද්ධන්ගල, උල්පස්ස, එගොඩයාය මහකන්දරාව, අනුරාධපුරය, මිහින්තලේ, රිටිගල, පල්ලෙකැලේ, සිගිරිය, මින්නේරිය, ගිරිතලේ, සෝමාවතිය, ඇලහැර, බකමුණ, කවුඩුල්ල, චුන්ඩිකුලම, විල්පත්තු, යෝධවැව, මුතුරාජවෙල, මඩු රක්ෂිතය, කලමැටිය, බිබිලේ නිල්ගල යන ප්‍රදේශ සහ ඒවාට අදාළ සහ අවට වනෝද්‍යාන සහ කැලෑ රක්ෂිතයන් තදබල ලෙස විනාශ වී යාමට ඉඩ ඇතැයි පරිසර විද්‍යාඥයයෝ අනතුරු අඟවත්.

155. ලංකාව ඉතා පුංචි දිවයිනක් - වර්ග සැතැප්ම **25,0000** පමණයි. ඒකේත්, උතුර, නැගෙනහිර නමට පමණයි - ඕනෑ කෙනෙකුට ජීවත්වෙන්න බැහැ. අධිවේග බොහෝ දුරට හරියන්නේ විශාල රටවලට.

156. ඔය මෙගා ප්‍රොජෙක්ට් නෙවෙයි, දුප්පත් මිනිස්සුන්ට අඩු පොලියට මයික්‍රෝ ලෝන් දෙන ක්‍රමයක් දිවයින පුරා පුළුල් ලෙස ව්‍යාප්ත කලා නම් ඉතා හොඳයි, විශේෂයෙන්ම කාන්තාවන්ට ස්වයං රැකියා පටන් ගැනීමට වැනි. ඒ අයට මහන මැෂිමක්, සිල්ලර කඩයක්, මාළු ලැල්ලක් දාගන්න පොලී නැති හෝ අඩුම අඩු පොලි ණය ක්‍රමයක් හොඳට හැදුවොත් (බැංකු ලියාපදිංචි ගාස්තු/ගෙවීම් ආදියත් නැතුව), ඒ අය කාටවත් බරක් නොවෙන විදියට ජීවත් වෙයි. ගත්තු ණය පොලියත් සමඟ අන්තිම සතේට ගෙවයි. රට බලා ඉන්දිද්දී දියුණු වෙයි. බංග්ලාදේශයෙන් (අපේ මුතුන් මිත්තන් ආ රට (විජය කුමාරයා) හඳුන්වා දුන්, ග්‍රාමීන් බැන්ක් සංකල්පය ලොව හොඳම මයික්‍රෝ ක්‍රෙඩිට් ව්‍යාපෘතියයි. ලංකාව දියුණු කිරීමට නම් රටට ඔබින්නේත් ඒ සංකල්පයමයි. ග්‍රාමීන් බැන්ක් නිර්මාතෘ, යුනුස්, මහතා ගෙන්වා රජය ඔහුගෙන් උපදෙස් ලබා ගැනීම මැනවයි.

157. සමෘද්ධි/සණස ග්‍රාමීය බැංකු ඉතා හොඳයි. නමුත් මහා පරිමාණයෙන්, පුළුල් වශයෙන් ව්‍යාප්ත වී නැහැ. එය එසේ විය යුත්තක්.

158. සමහර රටවල නීති රීති අකුරට පිළිපැදීම සහ ආර්ථික දියුණුව නිසා ජනතාවගේ ජීවන මට්ටම යහපත් කරගෙන තියෙනවා. හැබැයි හොඳ/නරක, සාධාරණ/අසධාරණ දේ, දියුණු/නොදියුනු කොයි රටෙත් තියෙනවා. ධනපති, 1වැනි ලෝකයේ රටවල් දිව්‍යලෝක නොවෙයි. වර්ණ භේද වාදය යනු පිළිකාවක් වැනි නරක ගතිගුණයක්. එවැනි නරක දේ එවැනි සමාජවල සමහර තැන්වල සැඟවී ඇත්තේ කාටවත් නොපෙනෙන, සොයන්න බැරි විදියට. හැබැයි අවශ්‍ය වෙලාවට ඒ ජරාව එලියට එනවා. අපේ රටේ සැවෝටම කොච්චර ලස්සනට ජීවත් වෙන්න පුලුවන්ද, අප ඉතා ලස්සනට ජීවත් වෙනවා නේද? අප බිහි කර ඇති ‘සැවොම ඇතුලත් කරගන්නාවූ’ මේ සමාජ ක්‍රමය ගැන අපට සැබවින්ම ආඩම්බර විය හැකියි. අප දුප්පත් රටක් වුවත් අපේ උතුම්, සාමාජශීලි, ගුණ ගරුක ගති ගුණ ගැන අපට නිහතමානිව උදම් විය හැකියි. විදේශිකයෝ වැල නොකැඩී අපේ රටට එන්නේ අපේ රටේ ලස්සන බැලීමට විතරක් නොවේ, අපේ මිනිසුන්ගේ අභ්‍යන්තරයේ ඇති ලස්සනත් බැලීමටයි.

159. අපේ රටේ ඇත්ත තත්ත්වය ගැන කීවාම ඒක රටට ගැරහීමක් වෙන්නේ නැහැ, හැබැයි සංවේදී වෙන්න ඕන. කවුරු නමුත් ජාත්‍යන්තරය ඉදිරියේ රට අසාධාරණ අයුරින් පවා දීම වැරදියි.

160. රට දියුණු කරන්න මෙගා ප්‍රොජෙක්ට්ස්ම අවශ්‍යමය යන සිද්ධාන්තය මිත්‍යාවක්. බොහෝ රටවල බොහෝ මෙගා ප්‍රොජෙක්ට්ස් අසාර්ථක වෙලා තියෙනවා.

161. ‘ස්මෝල් ඉස් බියුටිෆුල්’ කියන සංකල්පය රජයන් කරන ව්‍යාපෘති වලටත් අදාලයි. රජය කරන සැම ව්‍යාපෘතියක්ම මහා පරිමාණයෙන් කල යුතුය යන්න වැරදි සංකල්පයක්.

162. ස්වභාව ධර්මයට විරුද්ධව කරන වැඩ, විශේෂයෙන්ම මෙගා ප්‍රොජෙක්ට්ස්, බොහෝ විට අසාර්ථක වෙනවා. ලෝකය පුරාවටම මේ පිළිබඳව නිදසුන් තියෙනවා.

163. අධික පොලියට විදේශ ණය අරං හදන නෙලුම් වැනි කුළුණු වලින් රටේ උද්ධමයනය, අඩු වේද, විරැකියාව අඩු වේද, ආර්ථිකය සංවර්ධනය වේගවත් වේද? මේ ණය, පොලි සමඟ ගෙවා ඉවර කර දැමීමට ඉදිරි පරම්පරා කීයකට සිදු වේද?

164. නෙලුම් කුළුනට වියදම් කරන මිලියන් ගණන් ඩොලර් වලින් රජයේ ඉස්පිරිතාලවලට ඇඳන්/මැට්‍රස්/කොට්ට අරං දැම්මනම්, ඔය බිම නිදියන ලෙඩ්ඩු අඩු තරමින් රැට සුව නින්දක්වත් ලබාවි.

165. නෙලුම් කුලුන නිසා දස දහස් ගණනක් වූ බඩගින්නේ ඉන්න රටවැසියන්ගේ බඩගින්න නිවේද?

166. නෙලුම් පොකුණ/කුළුන හැදුවා කියා වැල්ලම්පිටිය,කොලොන්නාව, අංගොඩ, කඩුවෙල, හංවැල්ල වැනි ප්‍රදේශවල යම්තම් වැස්සත් සිදුවෙන ගංවතුර උවදුර නිම වේද? රටේ තිබෙන ඇත්ත ප්‍රශ්ණ මේවා නොවේද? මේ ප්‍රශ්ණ විසඳීමට රජයන්ට කැප වීමක් තියෙනවාද? අවශ්‍ය විසඳුම් දිවා රෑ නොබලා සොයනවාද?

167. දඹුල්ල රෝහලේ මෙට්ට වල ලේ උරා බොන මකුණු ප්‍රශ්නය මොනතරම් දරුණුද කියනවානම් ලෙඩ්ඩු නිකම් බිම නිදි යන්නේ.

168. එහෙම නැත්නම් පාසැල් සිසුන්ට සහනදායි ලෙස ලැප්ටොප් පරිගණක ලබාදෙන ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන් ඔය නාස්ති කරන මුදල් වලින්. අද අපේ ළමයි කිලෝ ගණන් බර පොත් බෑග් අරගෙන යන කොට කොරියාවේ ළමයි පාසැලට ගෙනියන්නේ ටැබ් එකක්/නෝට් බුක් එකක් විතරයි.

169. මේවා නිකන් මුදල් නාස්ති කරන ප්‍රොජෙක්ට්ස් කියා කියන්නේ, ආණ්ඩුවේ බොහෝ රෝහල් වලින් ලෙඩ්ඩුන්ට ප්‍රයිවෙට් ෆාමසිවලින් බේත්/බැන්ඩේජ්/ඉන්ජෙක්ෂන් ආදිය අරං එන්න යයි කියන නිසායි. රෝහල් එසේ කියන්නේ

ආණ්ඩුවට සල්ලි නැති නිසා නේද? ඒසේ නම් කිසි තේරුමක් නැති මෙවැනි ප්‍රොජෙක්ට්ස්, විදේශ ණය අරගෙන අපි සාදන්නේ ඇයි?

170. අම්පාර දිස්ත්‍රික්කයේ පැරණිතම රෝහල වන මහඔය රෝහලේ රෝගීන්ට ඉඳ ගන්ඩ පුටු නෑ, වෛද්‍යවරුන්ට නිල නිවාස නෑ, හෙද කාර්ය මණ්ඩලය 70 ක් විය යුතු වුවද දැනට ඇත්තේ හෙද හෙදියන් 39 කි. මේ අඩුපාඩු පූරවන්න රජයට සල්ලි නැහැයි කියනවා.

171. නෙලුම් කුළුන මුදල් කාබාසිනියා කරන තවත් නිෂ්ප්‍රයෝජන, මෙගා ප්‍රොජෙක්ට් එකක්. තව රටක් පරයන්න තරගෙට උස ගොඩනැගිලි හදන වකවානුව ඉවර වෙලා දැන් බොහෝ කල්.

172. කෙසේ වෙතත්, නෙලුම් කුලුනෙන් රටේ වැසියන්ට ආත්ම අභිමානයක් සහ තම රට ගැන ආඩම්බරයක් එනවා ඒකත් ධනාත්මක දෙයක්. මෙය නිසා, ඔවුන් ධෛර්යමත් වී, රටට තිබෙන ආදරය, ගෞරවය වැඩි වුනොත්, එයින් හොඳ පුරවැසියෝ, රාජ්‍ය /පෞද්ගලික අංශයේ සේවකයෝ බිහිවුනොත්, රටේ ආර්ථික වර්ධනයටත් එය ඉවහල් වෙනවා (එහෙමවත් හිතමු).

173. නෙලුම් කුළුන, විදේශ සංචාරකයෝ ඇදී එන තෝතැන්නක් කරගත්තොත් විදේශ විනිමය උපයාගන්න

පුළුවන්. දේශීය සංචාරකයන්, විශේෂයෙන්ම කොළඹට දුරස්තරයෙන් එන අය ඇදී ආවොත් එතනින් යම් හොඳ ආර්ථිකයක් ගොඩනගා ගන්න පුළුවන්. නමුත්, මෙවැනි දේ කරන්න නම් සුදුසුකම් බලා දක්ෂයන්ව ඒ තැන්වල විධායක තනතුරුවලට පත් කරන්න ඕන. මේ ස්ථානයේ විදේශිකයෝ බැලීමට ප්‍රියකරන අපේ කෞතුකාගාරයක්, දේශීය කළා මධ්‍යස්ථානයක්, චිත්‍ර ප්‍රදර්ශනාගාරයක් හෝ අත්කම් භාණ්ඩ අලෙවි ස්ථානයක්, දේශීය ආරයට ආහාර සපයන ස්ථාන වැනි දේ පිහිටවෙවොත් විදේශිකයෝ සැහෙන්න ඇද ගන්න පුළුවන් වේවි. මේ සඳහා සංචාරක හෝටල් සමඟ කිට්ටුවෙන් කටයුතු කරන්න වෙනවා. නමුත් නෙළුම් කුළුන උසට ගහනවා හැර අලෙවි සල් දාන්න තරම් ඉඩක් එහි බිහිකරන විදියට සැලසුම් කර නැති බවයි පෙනෙන්නේ.

174. අපේ රටට එන සංචාරකයන්ට බලන්න ඇති ස්ථාන වැඩි කරගන්න ඕන, විශේෂයෙන්ම කොළඹ නගරයේ.

175. අර නැව් අඩු වරාය, ප්ලේන් එන්නේ නැති ගුවන් තොටුපොල, ඔපෙරා අඩු ඔපෙරා ශාලාව, ක්‍රිකට් ගහන්නේම වගේ නැති ක්‍රිකට් ක්‍රීඩා පිටි බොහෝ දුරට අසාර්ථක උනේ සුදුසුකම් මත දක්ෂයන් වෙනුවට, අදක්ෂ, තේරෙන්නේ නැති, දේශපාලන හෙන්චයින්ව එවන් උසස් තැන්වල පාලනයට පාලනාධිකාරීන් විසින් පත් කිරීමයි.

මුදල් වියදම් කරලා ස්ථාන පමණක් හදලා මදි, ඒවා හොඳට 'මාර්කට්' කරන්නත් ඕනා.

176. සිංගප්පූරුව,හොංකොං වගේ වරායවල ඒකාධිකාරිය බිඳලා, ඔවුන්ගේ බිස්නස් කඩලා අපේ වරායන්ට අළුත් බිස්නස් ගන්න නම් (නැව් ගෙන්න ගන්න නම්) ජාත්‍යාන්තරව එවැනි වැඩ කරලා හොඳ පළපුරුද්දක් ඇති, උගත්,හොඳ පෞරුෂයක් ඇති විධායක නිලධාරීන් පත් කල යුතුයි. එවැන්නක් කල බවක් නම් පෙනෙන්නට නැහැ.

177. **1980** අග **1990** මුල ශ්‍රී ලංකාවේ ගාර්මන්ට් කර්මාන්තය දියුණු වේගන ගිය විදියට අපිට ලෝකයේ **1**වැනි තැන ලැබේයයි බොහෝ අය සිතුවා. ඊට පසුව ආ රජයන්හි අදුරදර්ශී ප්‍රතිපත්ති නිසා අපේ රටේ ගාර්මන්ට් කර්මාන්තය අද නැතිවෙන තැනටම වගේ පත් වෙලා. එදා අපට ගන්න බැරිවූ තැන අද අපේ සහෝදර බංග්ලාදේශය අරං තියෙනවා.

178. **2014**දි කොළඹ ප්‍රධාන විද්‍යාලයකට නව තට්ටු **7**ක ගොඩනැගිල්ලක් රජයෙන් අනුමත උනා; (අනේ වාසනාවන්). මේ කාලෙම, මාතලේ කුඹල්ඔලුව කණිෂ්ඨ විද්‍යාලයේ සිසු දරුවන් ජලය, විදුලිය වැනි මූලික පහසුකම් පවා අහිමිව, ඉතා දුෂ්කර සේ ඉගෙනුම ලැබුවා. ඇතැම් ගුරුවරු වෙනත් විකල්පයක් නොමැති නිසා

ගොඩනැගිල්ලෙන් බැහැරව ගස් යට පන්ති පවත්වා ගෙන යනවා. මේ අයව රජයන්ට පෙන්නේ නැහැ?

179. අද ඇමති මණ්ඩලේ රෝයල් කොලිජියට ගිය මැති ඇමතිවරු **15-20** ක් විතර ඉන්නවා. අද බොහෝ මැති ඇමතිවරු ඒ අයගේ ළමයි දමන්නේ කොළඹ රෝයල් කොලීජියට. ඒ අනුව බැලුවොත්, තව අවුරුදු **25**කින් මුළු ඇමති මණ්ඩලේ **50% – 60%** ම පාහේ රෝයල් කොලිජ් එකේ ඉගෙන ගත්ත අය වෙන්න පුළුවන් (ඇයි, මැති ඇමතිවරුන්ගේ දරුවන්ට/ඥාතින්ට නේ අන්තිමට නොමිනේෂන් වරම් ලබදෙන්නේ).

180. රෝයල් කොලීජියට වෙනස් පාසල් වලට නැති විශේෂ සංග්‍රහ/මුදල ප්‍රධාන අනුමත කලේ **1970** අග දශකයේ සිටි රාජ්‍ය නායකයෙක්. වැරදි වැඩක්.

181. සෑම රජයේ පාසලකටම එක සමාන හැන්දෙන් බෙදිය යුතුයි. ළමයි ඔක්කොම එකයි, හැම දෙනාටම එක හා සමාන පහසුකම් සැලසීමට රජයන් බැඳී සිටිනවා. පොහොසත් දෙමව්පියන්, පොහොසත් ආදී සිසුන් ඉන්නා පාසල්, ඒ අය දෙන මුදල්වලින් සංවර්ධනය කරගත්තාට කමක් නැහැ.

182. රටක නායකයා විය යුත්තේ හොඳට දුක් විඳලා, 'කට්ට කාලා', මහා පොලවේ හොඳට අඩිය ගහලා හිටිය

කෙනෙක් (ස්වයං රැකියාවල යෙදුනු අය වගේ අය ඉතා හොඳයි). ඒ අයට පොදු ජනතාවගේ ප්‍රශ්ණ තේරෙනවා, මොකද, ඒ අයත් ඒ දුක විඳලා තියෙන නිසා.

183. පුංචි දෙයක් උනත් අස්සක් මුල්ලක් නෑර බලා, ප්‍රශ්නවල මුලටම ගොස් සොයා, විසඳපු, පොඩි කාලේ හොඳට දුක් විඳලා පන්නරය ලබාගත් ජනාධිපති වරයෙක් සිටියා. ඔහුගේ කෙටි කාලය තුල රට ඉතා සීග්‍රයෙන් දියුණුවට පත් වුනා.

184. ජීවත්ව සිටින අයගේ නමින් මහාමාර්ග නම් කිරීම දැන් පුරුද්දක් කරගෙන. හොඳ දෙයක් නොවේ. ඕක පිස්සුවක් උනොත් රටේ තියෙන මහාමාර්ග ටික මදි වේවි එහෙම නම් කරන්න.

185. බොහෝ ප්‍රතිමා, ස්මාරක තැනෙන්නේ, මාහාමාර්ග, උද්‍යාන නම් කරන්නේ, මුද්දර නිකුත් කරන්නේ මියගිය දේශපාලනඥයෝ නමින්. මේවාට මුල්වී වැඩ කරන්නේ ඔවුන්ගේ දැන් සිටින දේශපාලනඥ දරුවන් සහ පවුලේ ඥාතින්. සමහරුන් ජීවත්ව සිටියදී කල ක්‍රියා දෙස බලනවිට ඒ අය නොසැමරිය යුතුය කියායි බහුතරයක් ජනයා කියනු ඇත්තේ. රටේ ජාතික වීරයෝ යනු මියගිය දේශපාලනඥයෝ පමණක් නොවේ. යුධ භටයෙක්, කළාකාරයෙක්, ආගමික පූජකවරයෙක්, ලේඛකයෙක්, ක්‍රීඩකයෙක්, ගත් කතුවරයෙක්, හොඳ ගුරුවරයෙක්, හොඳ

පුරවැසියෙක් (කාන්තාවන්ද ඇතුළුයි) ජාතික වීරයින් විය හැකියි. ඒ අය අතරින් අති විශිෂ්ටයන් අතලොස්සක් තෝරා ස්මාරක/මුද්දර/පාරවල් බිහිකල හැකියි. නමුත් එසේ සිදු වන්නේ ඉතා කලාතුරකින්.

186. **1970** දශකයේ 'පුංචි පවුල රත්තරන්' කියා පවුල් සංවිධානය කිරීමට මහත්සේ කැපවී මහන්සි වී වැඩ කල හොඳ දොස්තර මහතෙක්ගේ නමින් මාවතක් නම් කර තිබෙනවා. අවසානාවකට වගේ එතුමා එකල නොදැන සිටියත්, ඒ වැඩපිළිවෙලින් පුංචි වුයේ`වුයේ එක් ජනකොටසක ජනගහනය පමණයි.

187. විශිෂ්ටතම ගුරුවරයෙක් වන ගුණපාල වික්‍රමරත්න මැතිතුමා මැරුණු පසු නොව ඔහු ජීවත්ව සිටියදී ඔහුගෙන් සිප් සතර හැදෑරුවෝ, **2016** මැයි මාසයේදී, ඔහුගේ අනූ වැනි උපන්දිනය දා, ඔහුට උපහාර දැක්වූවා. ඉතාම හොඳ දෙයක්. මැරුණු පසු කෙනෙකුට උපහාර දැක්වීමෙන් ඇති පලය කිම?

188. **1980** අග සහ **1990** මුල දස දහස් ගණනින් දකුණේ තරුණ කොල්ලෝ දස වධ දී මරා දැමීම අනුමත කරන්න බැහැ. ටයර් සෑය වල මියගියේ අපේම අයියලා, මල්ලිලා, බාප්පලා, මිතුරන් නේද? ඒ වගේම තමයි **1971** දී දහස් තරුණයන් මරලා ගඟවල් වල පා කර හැරිය හැටි. කන් වලට ඉලෙක්ට්‍රික් ෂොක් ඇල්ලීමෙන් මරපු තරුණයෙක්

ගැන විස්තර දන්නවා. ඒ, සංවිධානය කල ත්‍රස්තවාදී ක්‍රියා අනුමත කරනවා නොවෙයි. ඒත්, රජයකට තම වැසියන් නීතියෙන් පිටත ක්‍රියාමාර්ග වලින් මරා දමන්න අයිතියක් නැහැ. ඔවුන්ව අත් අඩංගුවට ගෙන නීති මඟින් කටයුතු කිරීමයි කරන්න තිබුනේ. ශිෂ්ට සම්පන්න රජයන් හැසිරෙන්නේ එසේයි.

189. බොහෝ සිඟන්නන්ට සමෘද්ධි ආධාර ලැබෙන්නේ නැහැ. හේතුව සමෘද්ධි ආධාර ලබන්න ස්ථිර ලිපිනයක් තියෙන්න ඕන. චන්ද අයිතිය තියෙන්න ඕන. තව, දරු පවුල් කාරයෝ වෙන්න ඕන කියලත් කියනවා. ග්‍රාම සේවක අනුමැතිය අවශ්‍යයි. ඇත්තම කියනවානම් ඔවැනි දේවල් කරගන්න පුළුවන් අයෙකුට සමෘද්ධි ආධාර අවශ්‍යත් නැහැ. සාමාජ සේවා ආධාර කිසිත් නොලැබෙන අන්ත දුප්පතුන් අනන්තවත් ඉන්නවා - අපේ පාරවල, පේව්මන්ට් වල රෑට බුදියන අය, සෑම සියලු දේ අත් හල අය ආදීන්. එදාට එදාට ජීවත් වෙන අය. ඒ අය සමුර්ධි සොයාගෙන යන්නේ නැහැ. ඒ අය පාරේ ලගින්නේ වෙන යන්න කිසිම තැනක් නැති නිසායි. මේ අය අතර හිටපු විදුහල්පතිවරු, ගුරුවරු, ලිපිකරුවෝ, පියන්ලා, මුදලාලිලා පමණක් නොව දොස්තරලා, ලොයර්ස්ලා වැනි සමාජයේ හොඳ ජීවිත ගත කල අය පවා ඉන්නවා කිවුවොත් කෙනෙක් පුදුම වෙයි. අපි කැමති නැහැ ඒ අය ගැන දැන ගන්න හෝ කථා කරන්න; මේක ශෝචනීය තත්වයක්.

190. සමුපකාරයට බඩු ගන්න ගියහම හාල් ටික, කඩල, මුං, කවුපි, මිරිස් මේ සේරම පිටරටින්, බොහෝ විට, ඉන්දියාවෙන්, පකිස්තානයෙන් ගෙනාපුවා. ලංකාවේ කියලා නිෂ්පාදනයක් නැති තරම්. කෙන්යාවෙ තේ, පිලිපීනයේ පොල් එහෙමත් පහුගිය දවස්වල තිබුනා. අනාගත පරම්පරාවට සමහරවිට රම්පෙ කරපිංචා, මයියෝක්කා, කොස්, පොලොස්, පපඩම් එහෙමත් පිටරටින් ගෙන්න වෙයි වගේ.

191. දැන් දියලුණු කැටය, හඳුන්කුරු පැකට් එකත් එන්නේ ඉන්දියාවෙන්. අල්පෙනෙත්තක්, ඉදිකටුවක් වත් හරියට මේ රටේ නිපදවා ගන්න බැරි තත්ත්වයක් උදාවෙලා; සේරම එන්නේ චීනයෙන් නැත්නම් ඉන්දියාවෙන්. එදා තිබුණු ලක්ෂපාන බැටරිය, උෂා ෆෑන් එක, යුනික් රේඩියෝව, මැස්ඩා කාරය, කැළණි ටයරය, ඩියුරෝ සරම, තුල්ටෙක්ස් සාරිය, සියල් පෑන, පර්මා ෂාර්ප් බ්ලේඩ් තලය අද අභාවයට ගිහින් හෝ පන අදින තත්ත්වයක තියෙන්නේ.

192. **1970 – 1977** රජය පටි තද කරගන්න ගියා ජනතාව දැඩි පීඩනයකට සහ අපහසුතාවයන් ලක් කල බව ඇත්ත, නමුත් යම් ප්‍රතිපත්තියක් ඇතුවයි රට පාලනය කලේ. **1977** වනවිට රට බොහෝ ආහාර ද්‍රව්‍යවලින් ස්වයංපෝෂිත වෙලා. රට තුල දේශීය කර්මාන්ත සහ වෙනත් නිෂ්පාදනයන් ඉතා ඉහල මට්ටමකට දියුණු වී තිබුනා. ඉතා සුළු වශයෙන් තමයි විදේශ වලින් භාණ්ඩ ආනයනය වුනේ.

1977දී පිළිවෙලක් නැතිව හඳුන්වා දුන් නිදහස් ආර්ථිකය නිසා ඒ ලබා ගත් දියුණුව නැත්තටම වගේ නැතිවී ගියා. අද අප සෑම දේම පිටරටින් ගෙන්වනවා.

193. රට පුරා අධිවේගී මාර්ග, නවීන පාලම්, ගුවන් පාලම්, ඉදිකළත් (උතුරු වසන්තය/නැගෙනහිර නවෝදයට පමණක් ඩොලර් බිලයන 2ක් වත් විදේශ ණය වියදම් කරන්න ඇති), බුලත්සිංහල මිනිස්සුන්ට පෝරුතොට - බොරලැස්ගමුව යා කරමින් පැළැන් ගඟ හරහා පාලමක් තනා දෙන්න තාම කිසිම රජයකට බැරි වෙලා. තේ දළු ටික, රබර් ටික නගරයට රැගෙන යන්න, සිමෙන්ති කොට්ටයක් ගෙදරට ගෙන්න පමණක් නොවෙයි හදිසියේ රෝගියෙකු රැගෙන රෝහලට යන්න ත්‍රීරෝද රථයක් යන්න වත් ක්‍රමයක් නැහැ. පාලකයෝ ජනතාවගේ දුක/අවශ්‍යතා හරියට දන්නවා නම්, ඒ අයත් එක්ක ඉන්නවා නම්/ගැවසෙනවා නම් මෙහෙම වෙන්න බැහැ නේද?

194. ලංකාවට විදුලි දුම්රිය හඳුන්වා දෙන බවට පුවතක් දුටුවා. ඩොලර් බිලියන ගණනක වැඩක්. මේ මෑතක් වෙනතෙක්ම විදුලි මෝටරය ක්‍රියා විරහිත වීම නිසා මේ මෑතක් වන තෙක් හීන්දෙණිය-පට්ටිගොඩ දුම්රිය ස්ථානයට ජල සැපයුමක් නොමැතිවීම නිසා එහි ඇති එකම වැසිකිළියද පාවිච්චියට ගත නොහැකිව වසා දමා තිබුනේ. මඟීන්ට මොන තරම් කරදරයක්ද? අලුත් විදුලි වතුර මෝටරයකට යන මිල කීයද? රුපියල් 25,000ක් වෙවි.

195. **2014දි ලක්ෂ 5ක් වියදම් කර 'ගම නැගුම' ව්‍යාපෘතිය යටතේ පොල්ගහන්ගොඩ, හල්මිල්ලවැව, දූම්මීය ගම්මානයේ ඉදි කළ වාහන ගමනාගමන පාලම අවුරුදු දෙකක් යන්නටත් මත්තෙන් සම්පූර්ණයෙන්ම, දෙකට මැදින් කඩා වැටී ගියා.**

196. **එක අමාත්‍යාංශයක් පවත්වාගෙන යාම සඳහා මාසිකව කෝටි එකහමාරකට වැඩි මුදලක් කුලී ගෙවනවා. අර ඉබ්බන්වල හන්දියේ තට්ටු 15 ක මහවැලි අමාත්‍යාංශයේ කොටසක් නිකං වේලෙනවා. සමහර තට්ටු වල දෙතුන් දෙනයි ඉන්නෙ. ඒකේ තට්ටු දෙක තුනක් අස් කරල අමාත්‍යාංශය එකේ දාගන්න බැරිද. සව් සිරිපායේත් ඕන තරම් ඉඩ කඩ තියෙනවලු.**

197. **කූට වෙළඳුන් පාරිභෝගිකයන්ව පුදුමාකාර විදියට ගසා කනවා. රුපියල් 2600 ක් දී මිලදී ගත් ලෙදර් සපත්තු ජෝඩුවක් 4-5 පාරක් දැම්ම පසු නිකම්ම කැඩී ගියා. කොළඹ ලෙදර් සපත්තු හදන ෆැක්ටරිය නොමිලේ රිපයාර් කර දෙන්නම් කීවත් සපත්තු දෙක අරගෙන යන්න ආවේම නැහැ. මාස 6ක් බොරු කියා කියා පාරිභෝගිකයාව මුලා කළා. පාරිභෝගිකයන්ට පැමිණිලි කරන්න පුළුවන්, කූට වෙළඳුන්ට විරුද්ධව නිරන්තරයෙන් නඩු පවරන්න පුළුවන් බලගතු පාරිභෝගික ආරක්ෂක අධිකාරියක් පිහිටවිය යුතුයි.**

198. විදුලි දුම්රිය, උමං දුම්රිය, කොන්ක්‍රීට් කණු උඩ දුවන දුම්රිය/වාහන, යලිත් කොළඹට ට්‍රෑම් කාර් - මේවා ආකර්ශනීය අදහස්. තියෙන සම්පත් හදාගෙන ඉදිරියටම යමු, බොරු නාස්තිකාර අත්හදා බැලීම් නැතුව. ඔය අලුත් සමහර ව්‍යාපෘති සඳහා ගොඩාක් ඉඩම් අවශ්‍යයි, කොළඹ දැන් ඒවා නැහැ. පොලව යට කැනීම් වලින් තියෙන යටිතල පහසුකමුත් නැති වෙන්න පුළුවන්; ඒ නිසා එවැනි වැඩ ඉතා ප්‍රවේශමින් කරන්න ඕන.

199. කොළඹ කොන්ක්‍රීට් කණු උඩ දුවන, වටරවුම් පාරවල් මඟින් සියළු අධිවේග යා කරන බව කිවා, හොඳ අදහසක්, බුද්ධිමත්ව පරිසරය සහ අනෙක් දේපල විනාශ නොකර කරනවානම්.

200. පොඩි රෙපයාර්, පොඩි සංවර්ධන වැඩ, පොඩි ණය ආධාර/සහානාධාර දීම තුලින් තමයි රට හදන්න පුළුවන්, මිනිස්සු නගා සිටුවන්න පුළුවන්. නමුත් පාලකයෝ බලන්නේ මහා පරිමානයේ මෙගා ප්‍රොජෙක්ට්ස්. ඉස්සර එහෙම, ඔය වගේ වැඩවලින් ඒ ගොල්ලන්ට හම්බවෙච්ච කොමිස් ගතමනාවන් හරි හොඳයිලු.

201. කොළඹ නගරයේ, විශේෂයෙන්ම කොළඹ 7 පාරවල් අනවශ්‍ය ලෙස 'වන් වේ' කරලා. මේ නිසා ඉන්ධන පුච්චගන වාහන වටේ දුවනවා. උදාහරණයකට බලන්න, බොරැල්ලේ සිට එන වාහනයක් හෝර්ටන් පෙදෙසින් වමට

මේට්ලන්ඩ් චන්ද්‍රවන්කයට හරවලා කුරුඳු වත්ත පොලිසිය ලඟට යන්න යනවා නම් එම වාහනය වම් පස ග්‍රෙගරි පාරට හරවා හැතප්ම 2-3 විතර පෙට්‍රල් පුච්චගෙන මේට්ලන්ඩ් ප්ලේස් හරහා පැමිණ මේට්ලන්ඩ් ක්‍රසන්ට් එකට නැවතත් වමට හරවන්න ඕන. මෙයට හේතුව මේට්ලන්ඩ් චන්ද්‍රවන්කය 'වන් වේ' කිරීම නිසා ග්‍රෙගරි පාර හන්දියේ සිට මේට්ලන්ඩ් පෙදෙස/චන්ද්‍රවන්කය හන්දියට තියෙන මීටර් 60 දුර, ඒ වාහනයට යන්න බැහැ.

202. රෙස්කෝස් එකේ මක්ඩොනල්ඩ්ස් එකේ ඉඳලා කටුගෙය ගාවට තියෙන දුර KM 1 ½ පමණ වුනත් වාහනේකට යන්න KM4 ක පමණ බොරු රවුමක් යන්න ඕන.

203. හවස වාහන තදබදය ඉතා අධික වෙලාවටවත් ගාලු පාරේ, බම්බලපිටිය පැත්තේ සිට කොටුව බලා යන එක් මං තීරුවක් කොටුව - පානදුර දෙසට යන වාහන වලට යාමට විවෘත කල යුතුයි. ඒ මන්ද, යන්න තියෙන එකම මාර්ගය වන ඩුප්ලිකේෂන් පාර වාහන වලින් හොඳටම පිරිලා ඉතිරිලා ගිහිල්ලා.

204. පාරවල් 'වන් වේ' කරන්න එපා කියනවා නෙවයි (ඉස්සර 'වන් වේ' කලේ කොටුවේ පාරවල් පමණයි), නමුත්, එය ඉතා කල්පනාකාරීව, කල යුතු දෙයක්. ආවට ගියාවට නොකළ යුතුයි.

205. සුද්දා පාරවල් නිර්මාණය කර වාහන ගමනාගමනය පිලියෙල කලේ කිසියම් සැලැස්මක් මතයි. දැන් සැලැස්මක් නැතුව පාරවල් 'වන් වේ' කරනවා. ත්‍රී රෝද රියදුරන්ට නම් හොඳයි. බස් මඟින් කිලෝමීටර් ගණන් පයින් ගාටනවා.

206. නිතරම පාරවල් 'මොනිටර්' කර, අවශ්‍ය නම් මං තීරු වසා දමා හෝ මාර්ග තදබදය අවම කිරීමට පොලිසිය/මාර්ග අධිකාරිය කටයුතු කල යුතුයි. සමහර සතියේ දිනවල උදේට වැලිකඩ සිට බත්තරමුල්ල මාර්ගයේ එක මං තීරුවක් වසා බත්තරමුල්ල - වැලිකඩ මාර්ගයේ වාහන සඳහා විවෘත කර දෙනවා. හොඳ ප්‍රශ්න විසඳීමක්.

207. කොටුවේ සුද්දගේ කාලේ දැමූ 'වන්වේ' නිතිය ඉතාම හොඳයි. අදත් හොඳට ක්‍රියාත්මක වෙනවා.

208. ගාලු පාර 'වන් වේ' කිරීම නිසා බොහෝ ව්‍යාපාරික ස්ථාන 'මැරී' ගියා.

209. පාරවල් 'වන් වේ' කිරීමෙන් බොහෝ විට අමාරුවේ වැටෙන්නේ අසරණ බස් මඟින්. ඔවුන්ට සමහරවිට බොහෝ අමතර දුර පයින් ගමන් කරන්න වෙනවා. වියපත් වැඩිහිටියන්, ළමුන් උස්සා ගෙන යන මවු වරුන් සහ අබාධිතයින් මේ නිසා තදබල අපහසුවට පත්වෙනවා.

210. පේරාදෙණිය කොළඹ මාර්ගයේ වාහන එක් දිශාවකට ගමන් කිරිම සඳහා වන නීතිය වෙනස් කල කල යුතුයි. ඒ මාර්ගයේ වාහන දෙපත්තටම ධාවනය කලොත් ගොඩක් මාර්ග තදබදය අඩු කරගන්න පුළුවන්.

211. ශ්‍රී දළදා වහන්සේ ඉදිරිපිට මාර්ගය වාහන ධාවනයට විවෘත කරන්න; එතන මාර්ග බාධක (හම්ප්ස්) සහ ස්ථිර මුර කපොල්ලක දමා. දැනට සිදුවන වැව රවුමෙන් වාහන හරවා හැරීම විශාල ප්‍රශ්න ඇතිකිරීමක්. එදා ශ්‍රී දළදා මාලිගයේ බෝම්බය පිපිරවීම මාර්ගය වසා තබා තිබුනත් කරන්න පුළුවන් කමක් තිබුනායි කියලයි පොලිසියේ අය කිව්වේ. අවශ්‍ය උපරිම ආරක්ෂාව, තාක්ෂනය (cctv ආදී), වේග බාධක හම්ප්ස්, සහ මිනිස් ආරක්ෂක බල යොදා ලබා ශ්‍රී දළදා මාලිගාවට ආරක්ෂාව දිය යුතුයි. 1990 ගණන් වල මැද වෙනකම්ම ඔය මාර්ගය වාහන ධාවනයට විවෘත කරලනේ තිබුනේ.

212. පිටකොටුවේ බැස්ටියන් පාරේ කඩ සිය ගානක්, සෙන්ට් ජෝන් මාළු මාර්කට්, සුප්‍රසිද්ධ මැනින් මාකට් ආදිය වෙනත් ප්‍රදේශ වලට රැගෙන යාම හෝ රැගෙන යාමට ලැහැස්ති වීම නිසා පිටකොටුව 'මැරෙනවා'. පිටකොටුව යනු අපගේ ප්‍රධාන බස් නැවතුම, කොටුව දුම්රිය ස්ථානය තිබෙන, ජනයා බොහෝ ගැවසෙන, කොළඹ නගරයේ ජනාකීර්නම තැනයි. එය ජනාකීර්ණවම තිබිය යුතුයි.

පිටකොටුව පාළු කර 'මරා' දැමුවහොත් එය මෝඩ අදහසක්. වෙනත් බොහෝ ව්‍යාපාරද 'මැරී' යනු ඇත.

213. පිටකොටුවේ නව පාවෙන සාප්පු සංකීර්ණය (එක සාප්පුවක් වත් පාවෙන්නේ නම් නැහැ), මේ ව්‍යාපෘතිය අද අසාර්ථක වෙලා වගේ. නමුත් හොඳට හදලා ගන්න පුළුවන්. එතන තියෙන බේරේ වැව, පිරිසිදුවට හදලා ගත්තොත් තියෙන සංචාරකමය වටිනාකම කියා නිම කරන්න බැහැ.

214. බැස්ටියන් පාරේ කඩ සිය ගානක් කඩලා, කෝටි ගානක් වියදම් කරලා හදපු මේ පාවෙන සාප්පු ව්‍යාපෘතිය අද මේ තරම් අසාර්ථක වෙන්නේ එදා ඒ පාරට ඇදලා දාපු මිනිස්සුන්ගේ සාපය වැදිලා වද්ද? මන්ද, සමහර මිනිසුන්ට විකල්ප වෙළඳ කුටි ලබා දී නැහැ.

215. අවුරුදු 100ට වැඩි කාලයක් ඒ ස්ථානයේ පැවති සෙන්ට් ජෝන් මාළු මාර්කට් එක එහිම තියාගෙන එතන අලුතින් පිහිටවපු රත්තරන් මධ්‍යස්ථානය හෙට්ටි විදිය අසල නව ගොඩනැගිල්ලක විවෘත කරන්න තිබුනා.

216. සෙන්ට් ජෝන් මාළු මාර්කට්, මැනින් මාර්කට්, පිටකොටුවේ පදික වෙළඳුන් ලෝක ප්‍රසිද්ධයි. මේවා පිටකොටුවටම ආවේනික වූ දේවල්. කොටින්ම පිටකොටුව පැවතුනේ එවන් දේ නිසායි. මේවා

පිටකොටුවෙන් ඉවත් කර ඇතට ගෙනියන්න විවිධ හොඳ හේතු තිබුනත්, ඒවා නැති කමින් පිටකොටුව නමැති අපේ වාණිජ මධ්‍යස්ථානයට හිඩැසක් එක් කර තිබෙනවා.

217. කලක් කදිමයට නඩත්තු කර පවත්වා ගෙන ගිය කොටුවේ 'පැරණි කච්චේරිය', නැවත තදින්ම අභාවයට ගිහින්. කුමාර විදියේ ඕලන්ද කෞතුකාගාරයද මීට වඩා උසස් තත්ත්වයෙන් තිබිය යුතුයි. එවිට මේවා සංචාරක තෝතැන් බවට පත් වේවි.

218. රජකාලේ, සුද්දාගේ කාලේ හදපු පැරණි, ලස්සණ ගොඩනැගිලි ජාතික උරුමයන් සේ සලකා රැක ගැනීමට නීතිමය පියවරන් ගත යුතුයි. රජයට අයත් ගොඩනැගිලි පමණක් නොව, පුද්ගලික ගොඩනැගිලි/ගෙවල් පවා ලැයිස්තු හදා සංරක්ෂණය කල යුතුයි. අනාගත පරපුරේ අභිවුර්ධිය තකා ඒවා කඩා බිඳ දැමීමට ඉඩ නොදිය යුතුයි.

219. කෝට්ටේ රාජධානියට අයත් සහ එය විසින් තැනූ, අදත් ඉතිරිව ඇති ගොඩනැගිලි, පුරාවස්තු, බලකොටු රාශියක් අප බලා සිටිද්දීම අපට අහිමිව යනවා.

220. පෞද්ගලික ඉඩම් හිමියන්ට වන්දි ගෙවා කෝට්ටේ රාජධානියට අයත් ගොඩනැගිලි, කොටුව අප ආරක්ෂා කර ගත යුතුයි.

221. කලින් පදික වෙළෙන්දන්ව සිට දැන් ඔවුන්ව පිටකොටුවේ බෝ ගහ පිටිපස ගාල් කර තිබෙන, ඉදිකර ඇති නව ගොඩනැගිලි ඉතා අඩු පහසුකම් සහිතයි, විශේෂයෙන්ම එළවලු/පලතුරු වෙළෙන්දන්ව දමා තිබෙන කොටස. හරියට අම්බලං වගෙයි. තද වැස්සක් ආවොත් හිරිකඩට වෙළෙන්දන් සහ ඔවුන්ගේ වෙළඳ භාණ්ඩ තෙමෙනවා. ඒ අයට තමන්ගේ බඩු තියාගන්න පමණක් නොවෙයි, එළවලු/පලතුරු හොදා ගන්න හොඳ ටැප් පද්ධතියක් වත් නැහැ. කඩවල එළියේ සේවකයෝ කුණු එළවලු තෝරනවා.

222. දැන් ඔන්න මල්වත්ත පාර මැදිනුත් ‘අම්බලමක් හදලා’ පදික වෙළෙන්දෝ දාන්න කියලා. ඒ පැත්තම කළුවර වෙලා ගිහිල්ලා. අවට කඩ සාප්පු වලටත්, ගොඩනැගිලි හිමියන්ටත් කරන අසාධාරණයක්, මොකද ඒවා මේ කඩවලට වැහෙනවා.

223. පිටකොටුවේ ඇතැම් හරස් විදී පදික වෙළෙන්දන් සඳහා නැවත විවෘත කර තිබෙනවා. ඒ අවට සාප්පු වලට පහරක් උනත්, සමහර පදිකයන්ට අපහසුතාවක් උනත්, පොදුවේ ගත්තොත් හොඳ දෙයක්. මිනිසුන්ට තෝර තෝරා අඩු මිලට බඩු ගන්න පුළුවන්. අනිත් ප්‍රදේශවලත්, මෙය ප්‍රවේශමින් නැවත පටන් ගන්න පුළුවන්. හැබැයි පදික වේදිකා බදු අරගෙන, පදිකයන් පාරට ඇද දමන පදික වෙළඳාම් නම් එපා. පොලිසිය යොදවා ‘මොනිටර්’ කිරීම් කරන්න පුළුවන්.

224. රේගු මුලස්ථානයේ සිට කොටුවේ YMBA දක්වා පයින් යන පදික වේදිකාවේ ලොකු ඉඩ ප්‍රමාණයක් සමහර වෙළඳ කුටි අල්ලාගෙන. මිනිස්සුන්ට පාරට බැහැලා යන්න වෙලා තියෙන්නේ. මඟී ආරක්ෂාවට තර්ජනයක්.

225. කලින් නිවැසියන්ගේ කාර් එකක් පමණක් ගිය කොළඹ 3, 5, 7 වටිනා ගෙවල් තියෙන මාවත්, බගතලේ, මේට්ලන්ඩ්, නිදහස් මාවත වගේ පාරවල්, අද තඩි බස්/ලොරි වලට පමණක් නොවෙයි කන්ටේනර් පවා යාමට හැකි පරිදි විවෘත කරලා. ඒ නිවෙස්වල වූ මුල්‍යාමය වටිනාකම් සහ ප්‍රදේශයේ තිබු සුන්දරත්වය මේ නිසා අහෝසි වී ගොසින්. නමුත්, ට්‍රැෆික් ප්‍රශ්නය විසඳන්න මේ දේවල් කරන්න වෙනවා.

226. ඇස් වාට්ටුවේ සිට එන වාහන, අඩුතරමින් බස් වත්, වෝඩ් ප්ලේස් එක දිගේ කෙලින්ම බොරැල්ල හන්දියට ඇවිත් (එතන දාස මධ්‍යස්ථානය ළඟ පාර තව පොඩ්ඩක් පළල් කල හැකියි) වර්ණ සඥයා මගින්, බොරැල්ල හන්දිය තුලින්, විසිර යාමට සැලැස්විය යුතුයි (අද වෝඩ් පෙදෙසේ, බොරැල්ල හරස් පාරේ මංසන්ධියේ සිට බොරැල්ල හන්දිය දක්වා ‘වන් වේ’ කරලා). මෙයින් මරදාන පාරේ තිබෙන උග්‍ර වාහන තදබදය ටිකක් හෝ අඩු කරගත හැකියි.

227. බොරැල්ල හන්දිය තරම් රථ වාහන තදබදය ඇති වෙනත් හන්දියක් නැති තරම්. බොරැල්ල හන්දියේ එලියට

පාර ලොකු කරලා මැගසින් පාරට යා කරනවලු, දෙමටගොට ඉඳලා එන වාහන වලට රාජගිරිය දෙසට යන්න, බොරැල්ල හන්දිය මඟ හැරලා; හොඳ වැඩක්. හැබැයි එලියට් පෙදෙස/කොටා පාර හන්දියේ අලුත් ට්‍රැෆික් ලයිට් හයි කලොත් වාහන වලට දකුණු පැත්තට හරවන්න, වාහන ප්‍රමාදය තවත් වැඩි වෙන්න යි. පුළුවන්.

228. කොටා පාරෙන් නගර සභාවේ සුපර් මාර්කට් එකේ ගේට්ටුවෙන් වම් අතට හැරිලා කනත්ත පාරට යන්න පුළුවන් විදියට අලුත් පාරක් හදන්න ඕන.

229. එදා කොළඹ 7 තනිකරම නිවැසියන් විසූ පෙදෙසක්. අද බොහෝ නිවෙස් කාර්යාල/ආපන ශාලා වෙලා බවට පත් වෙලා. එදා හැම ගෙයකම අක්කර ¼, අරික්කාල, වගේ විශාල ඉඩම් තිබුනා, අද පර්චස් 5-6 වගේ පොඩි කෑලි වලට කෑඩි ගිහින්. මෙයින් විද්‍යාමාන වන්නේ බස්නාහිර පළාතේ, විශේෂයෙන්ම කොළඹ ඇති ඉඩම් හිඟ කමයි.

230. රටේ ජනගහනය පාලාත් 9ම ව්‍යාප්ත විය යුතුයි. බස්නාහිරට පමණක් මිනිස්සු හිර කලොත්; මෙගාපොලිස් යටතේ රටේ වෙනත් ප්‍රදේශවල ජනයා බස්නාහිරට ගෙනාවොත්, දැන් තියෙන ප්‍රශ්ණ දෙගුණ, තෙගුණ වේවි. රටේ සෑම ප්‍රදේශයකම රැකියා අවස්ථා බිහි කල යුතුයි; බස්නාහිර පමණක් නොවෙයි.

231. කිසි ඇහිල්ලක් බැලිල්ලක් නැතුව හිල්ටන් හෝටලේ අසල, යුනියන් ප්ලේස්හි සළාකා/ඩෝමිනෝ පිඩසා (කලින් සිටි ඩිස්පෙන්සරි), පාර දෙපැත්තම තිබුණු බස් හෝල්ට් අයින් කළා. මරදානේ පැත්තේ සිට ටෙක්නිකල් හන්දිය පසු කර උසාවියට යන බස් මාර්ගය (171) නතර කළා. අද අලුත්කඩේ උසාවියට යන සෑම කෙනෙක්ම ටෙක්නිකල් හන්දියේ සිට උසාවියට පයින් යායුතුයි - km ¾ පමණ. නඩු හබ වලට යන අයට, තියෙන කරදර මදිවට.

232. දුර්වල මගී ප්‍රවාහන සේවා නිසා වැඩියෙන්ම බැට කන්නේ අපේ ජ්‍යෙෂ්ට පුරවැසියන්, අබාධිතයන්, පොඩි දරුවන් අරං යන අම්මලා වැනි අය. රටේ මිනිසුන් පෝලිම් සංස්කෘතියකට හරියට පුරුදු වී නැති නිසා (පෝලිම් පනින සංස්කෘතිය නම් හොඳට තියෙනවා), මෙවැනි, සමාජයේ දුර්වල අය, මහත් අපහසුවට පත් වෙනවා.

233. අප අමතක කරන්න හොඳ නැහැ අපේ ජ්‍යෙෂ්ට පුරවැසියන් නිසායි, ඒ කාලේ ඒ අය දුක් මහන්සි වී වැඩ කල නිසායි, අපේ රට මේ තත්ත්වයෙන් තියෙන්නේ.

234. ඉස්සර තිබු සමහර බස් මාර්ග අද අවලංගු කරලා හෝ නැත්තටම නැතිකරලා - 104 බම්බලපිටිය - වත්තල, කොටුව - සීවලී ලේන් (146) උදාහරණ. මෙවා ඉතා ජනාකීර්ණ බස් රූට් වෙලා තිබුනේ, විශේෂයෙන්ම 104.

'මරා' දැම්මට ඒවාට විකල්ප, ඒ මාර්ග භාවිතා කල මගීන්ට සපයලා නැහැ.

235. ජනගහනයේ වැඩි වීමක් සිදුවෙද්දී තියෙන බස් රූට් කැපීම නොව කල යුත්තේ ඒවා වැඩි දියුණු කිරීම සහ මහජන අවශ්‍යතා අනුව නව රූට් ඇතිකිරීමයි.

236. බස් මඟින් **2**වැනි පන්තියේ පුරවැසියන්ද? අදත් මේ රටේ **75% - 80%**ක් පමණ ජනතාව  ගමනාගමනය පිණිස භාවිතා කරන්නේ බස් ප්‍රවාහන සේවයයි.

237. ඔය අධිවේග නිසා ඒවාට පිවිසුම් මාර්ග සහ අසබඩ මාර්ගවල වාහන තදබද වැඩි වුනා. අධිවේග හැදීම නිසා හොඳ රබර් වතු දෙකට මැදින් කපා ගොස් තියෙන හැටි. පරිසර දූෂණය, උරගයින්, මොනරු  වගේ සත්තු විශාල පරිමාණයෙන් මැරෙන විදිය දැක්කහම දුක හිතෙනවා.

238. දැන් හුංගම, අම්බලන්තොට, හම්බන්තොට පැත්තේ ජනාකීර්ණ තැන් වල පවා මොනරු, වඳුරන් සහ වෙනත් දුර්ලභ කැලෑ සතුන් දකින්න ලැබෙනවා. ඒ, ඒ සතුන්ගේ වාසභූමි වූ කැලෑ එලි කර, විනාශ කරදැම්ම නිසායි.

239. බෙල්ලන්විල රක්ෂිතය බොහෝ දුරට එලි කිරීම, ඉඩම් ඇල්ලීම වැනි ක්‍රියා නිසා එහි සිටි වඳුරන්, රිලවුන් දැන් බොරලැස්ගමුව පැත්තේ පුද්ගලික වතුවලට පැන වගා හානි

කරනවා. රක්ෂිතයේ ඇලේ හිටපු කිඹුල්ලු අද නැතිම වෙලා යන තත්වයකට ඇවිල්ලා.

240. රජ කාලේ ඉඳන් තදින් ආරක්ෂා කල, මිල කල නොහැකි වටිනාකමක් ඇති, මුතුරාජවෙල රක්ෂිතය අද ගොඩාක් දුරට නැති වෙලා, වැඩියෙන්ම කටුනායක අධිවේගය නිසා. අනිත් පැත්තෙන්, තුඩැල්ල - බෝපිටිය/පමුණුගම පාරේ දෙපස මේ රක්ෂිතය නැතිවෙලාම වගේ ගිහිල්ලා - අද සීමාවී තිබෙන්නේ ඉතා කුඩා බිම් තීරුවලට පමණයි. දේශපාලනඥයයෝත් එහි ඉඩම් අල්ලා ගත්තා කියා ප්‍රවුර්ති පලවී තිබුනා.

241. කඩුවෙල, ජා ඇල ප්‍රදේශ දැන් පොඩි වැස්සකටත් යට වෙන්නේ කටුනායක අධිවේගය උදෙසා මුතුරාජවෙල විශාල වශයෙන් විනාශ කිරීම නිසාලු.

242. ඇමරිකාව, ඕස්ත්‍රේලියාව වගේ රටවල රජයේ එක ඉඩම් අඟලක් හරි හොරෙන් කොල්ලා කා තිබ්බොත් අවුරුදු 5න් එහා හිරේ.

243. හැමිල්ටන් ඇල සහ ඒ අවට ප්‍රදේශය මොනතරම් සුන්දරද? ඒත් අප අද ඇලකන්ද /හැඳල/මෝදර පැති වලින් යන්නේ නහය වහගෙන නේද? ඕලන්ද කාලයේ හැදූ මේ ඇල හොඳින් පිරිසිදු කර බලාගත්තොත් එය සංචාරකයන් අද්දවාගන්නා වූ කාන්දමක් වෙනවා නිසැකයි. එපමණක්

නොවෙයි, ඒ පළාත්වල වැසියන් නිරෝගීව තබා ගැනීමටත් උදවු වෙනවා.

244. කටුනායක අධිවේගය විවෘත කරන දවස්වල පාරේ තියා කිරිබත් කපා, දන්සැලක් කල අහිංසක මිනිහෙක් හම්බුනා. ඒ දවස්වල මිනිහාගේ සතුට ඉහ වහා ගිහිල්ලා. ලඟදි මිනිහාව හම්බුවෙලා ඇහුවා 'කී සැරයක් අධිවේගේ පාවිච්චි කලාද' කියලා, මිනිහා කියනවා 'එක සැරයක වත් නෑ සර්' කියලා.

245. අධිවේග භාවිතය විශාල ලෙසින් අඩු වෙලා බව වාර්තා වෙනවා, මිනිසුන්ට ඒ ගාස්තුව ගෙවන්න තියෙන අපහසුතාවය නිසා වෙන්න ඇති. අධිවේගවල මෝටර් ස්යිකල්, ත්‍රී වීලර් භාවිතයට ඉඩ දිය යුතුයි (කන්ටේනර් ට්‍රක් යන්න දෙනවා නම් ඇයි මේවාට යන්න බැරි?). ඒ මිනිස්සුන්ටත් මහඟු ප්‍රයෝජනයක් ලැබෙනවා පමණක් නොව, රජයට ලැබෙන ආදායමත් ඉහල යනවා.

246. ලොකු බස් අපේ ඉතා පටු පාරවලට ඔරොත්තු දෙන්නේම නැහැ. ගොඩාක් පාරවල බස් දෙකක් මාරු වෙන්නේ නූලක ඉඩ තියලා. වාහන අනතුරුවලට හොඳම අවස්ථාවක්.

247. ලොකු බස්, ලොරි, ටිපර් ආදී ලොකු වාහන පටු, වාහන සහ ජනයා විශාල ලෙස ගැවසෙන මාර්ගවල අධික

වේගයෙන් යනවා. බොහෝවිට ත්‍රී විලර්ස්/පොඩි ඇල්ටෝ වගේ වාහන  කුඩු පට්ටම් වෙලා යන්න මේකත් හේතුවක්.

248. ට්‍රැෆික් තද උනහම පේව්මන්ට් උඩින් මෝටර් සයිකල් පැදවීම අද සාමාන්‍ය දෙයක් වෙලාද? පොලිසියත් ගණන් ගන්නේ නැති පාටයි. පදික වේදිකාවේ ගමන් කරන්නාගේ ජීවිතය තදබල අනතුරේ. බැන්නහම මෝටර් සය්කල් කාරයෝ ගහගන්න එනවා.

249. අද පාපැදියකින් (පුෂ් බයිසිකලයක්) මහා පාරේ පැද ගෙන යනවා කියන්නේ නිසැකයෙන්ම මරුවාට අත වනමින් යාමකි. එදා පාරවල් පුරා පාපැදි පිරී තිබුනා. අද දියුණු රටවල තත්ත්වය නම් මෙයයි.  නගර ඇතුලේ මිනිස්සු පාපැදි පාවිච්චි කරනවා; ඒ සඳහා වෙනම මාර්ග හදා තියෙනවා.

250. මේ කිසිම ‘වැඩකට නැති’ පළාත් සභාවලින් මේ පුංචි රටට ඇති පලය කීම?

251. පළාත් සභා එන්න කලින් මේ රටේ පරිපාලනමය කටයුතු මැනවින් සිදු වුනා නේ.

252. අහිංසක සුළු ජාතින් මේවා ඉල්ලුවේ නැහැ; ඒ අයට ඕන මහ ජාතිය සමඟ සමඟියෙන් ජීවත් වෙන්න. නමුත් සමහර ජාතිවාදී නායකයෝ තම ජනතාවගේ නම විකුණා රට කඩන ඉල්ලීම් ඉල්ලනවා.

253. **1987** හඳුන්වා දුන් **13** වන සංශෝධනය තමයි මේ රටට ගොඩාක්ම වින කලේ. අපේ රටේ ස්වෛරීභාවයට තදබල පහරක්.

254. මුළු රටටම ඇඳිරි නීතිය දමලා, බස්/ගොඩනැගිලි ගිනි තියලා (වැරදි වැඩ), බලවත් මහජන අප්‍රසාදය මැදයි ඉන්දියාව සමඟ පළාත් සභා ඇතිකරන ගිවුසුම අත්සන් කලේ. එවකට හිටපු අගමැතිත් අරලිය ගහ මන්දිරයෙන් පිටතට අවුත් විරෝධය දැක්වූ ජනතාවට එක් වුනා කියලායි ආරංචි උනේ. එවකට සිටි, පසුව වෙඩි තැබීමකට ලක්ව අභාවප්‍රාප්ත වූ, ගරු වෙළඳ ඇමතිතුමා ගිවුසුම අත්සන් කරන උත්සවය වර්ජනය කළා.

255. රට පෙඩරල් කරන්න එපා කියලා කෑ ගහන අයට: **1987** හඳුන්වා දුන් **13** වන සංශෝධනයෙන් රටට ගෙනාවේ පෙඩරල් ක්‍රමයක්. දැන් මේ ඉල්ලන්නේ තවත් බලතල දීලා කොං-ෆෙඩරල් කරන්න කියලා කරන ඉල්ලීමක්.

256. **13** වන සංශෝධනය ගෙනාවත්, ඉඩම් සහ පොලිස් බලතල මධ්‍යම රජය තියා ගත්තා. නමුත් එක් පළාත් සභාවක් කටයුතු කරන්නේ ඒ අයට ඉඩම් බලතල ලැබිලා වගේ.

257. **2009** මැයි **19** වෙනිදා යුද්ධය දිනපු ගමන් බුද්ධිමත් නායකයෙක් නම් කරන්නේ ‘මේ රටේ තිබුනේ ත්‍රස්තවාදී

ප්‍රශ්නයක්, දැන් එක ඉවරයි' කියලා 13 වන සංශෝධනය අහෝසි කරලා දාන එකයි (පළාත් සභා ක්‍රමය එතනින්ම හාන්සියි). සියලු ජනතාවට සාමයෙන්, සෞභාග්‍යයෙන් ඉන්න නම් මධ්‍යම රජය විසින් සාධාරණ ලෙස රට පාලනය කරන ව්‍යවස්ථාවක් හැදිය යුතුයි. ඉන්දියාවට ගැලපුනාට (ඒ අය විසින් බලෙන් අපිට ස්ථාපිත කල 13 වන ව්‍යවස්ථා සංශෝධනය) මේ අපේ පුංචි රටට පළාත් සභා අවශ්‍ය නැහැ. අපේ රට පුංචි වැඩියි. සියළු ජාතින්, සාමයෙන්, සමගියෙන් එක ධජයක් යටතේ එක දේශයක ජීවත් විය යුතුයි.

258. ලංකාවටයි ඉන්දියාවටයි එකම පාලන ක්‍රමයෙන් කරන්න බැහැ. ලංකාවේ ජනගහනය කොටි 20යි, ඉන්දියාවේ කොටි 1200යි. තමිල්නාඩුවේ පමණක් කෝටි 66යි.

259. ඉන්දියාවේ ක්‍රමේ මෙහෙ කරන්න ගිහිං අපි අන්තිමටම එරිලා, නහය ළඟටම. පළාත් සභා නඩත්තු කරන්න (පඩි නඩි, වාහන. බොඩි ගාඩ්ස්, නිල නිවාස, කාර්යාල විදේශ සංචාර). කිසිම වැඩක් නොකරන පළාත් සභා වල (කරන වැඩ කලින් තිබු කච්චේරි/ප්‍රාදේශීය සභා මඟින් කල හැකියි), මේ දේවල්වලට වැය කරන්නේ මහජන මුදල් රුපියල් බිලියන් ගණනින්. ප්‍රාදේශීය සභා, මහා නගර සභා වලින් තමා මහජනයාට සේවයක් සිදුවන්නේ, පළාත් සභා වැඩක්ම නැහැ.

260. නමුත්, දැන් නම් පළාත් සභා අහෝසි කරන්න පුළුවන් වේය කියා හිතන්න අමාරුයි. අති දැවැන්ත වෘක්ෂයක් බවට එය පත් වෙලා. අහෝසි කරන්න පුළුවන් වෙලාවල් වලදී කලේ නැහැ විශේෂයෙන්ම **2009** සහ **2012** දී.

261. ලංකාවට වඩා **125** ගුණයෙන් විශාල වූ, මහාද්වීපයක් වූ, ඕස්ත්‍රේලියාවෙත් තියෙන්නේ පළාත් ආණ්ඩු **6**යි (අමතරව, ටෙරිටරි **2**යි). අපේ පුංචි රටේ පළාත් ආණ්ඩු **9**ක්. චන්දදායක ජනගහනය කෝටියක් වත් නැති සබරගමුව, ඌව, වයඹට වෙනම ආණ්ඩු! ඒ කියන්නේ වෙනම නීති පද්ධතීන්!

262. කුරුනෑගල වැව රවුමේ රජය සතු වටිනා, දර්ශනීය නිවෙස් දැන් පළාත් සභා නියෝජිතයන් පරිහරණය කරනවා, මොකද ඒවා සතු වයඹ පළාත් සභාවට.

263. ලංකාවට හරියන්නේ බලවත් වූ මධ්‍යම ආණ්ඩුවක්. සෝල්බරි ව්‍යවස්ථාව කදිමෙට මේ රටට වැඩ කළා. දැන් ව්‍යවස්ථාව අවුල් වූ නූල් බෝලයක් වගෙයි.

264. **1970**දි මුදියන්සේ තෙන්නකෝන් මහත්තයා නිකවැරටිය ආසනය දිනුවේ ශ්‍රී ලංකා, යූඑන්පී දෙකම පරද්දලා ස්වාධීන අපේක්ෂයෙක් ලෙස. තවත් හිටපු ස්වාධීන මන්ත්‍රිවරු තමයි ආර් ජී සේනානායක (කැළණිය),

ඩොනල්ඩ් ජේ රණවීර (මස්කෙළිය), විජයානන්ද දහනායක (ගාල්ල) වගේ මහත්වරු.

265. අද ආසනේකට කියලා මන්ත්‍රී වරයෙක් නැහැ. දැන් තියෙන ව්‍යවස්ථාවෙන් ස්වාධින මන්ත්‍රීවරයෙක් වෙනවා පමණක් නොව ස්වාධීනව, තනිවම චන්දෙ ඉල්ලනවත් බැහැ - මේවාටත් වඩා ප්‍රජාතන්ත්‍ර විරෝධී චන්ද ක්‍රමයක් වෙයිද?

266. ඒ දවස්වල ඔය මනාප තිබුනේ නැහැ. ආසනවලට අපේක්ෂකයෝ ඉදිරිපත්වෙලා වැඩි චන්ද ලබාගෙන පාර්ලිමේන්තු ගියා. ඉතා තියුණු තරග පැවතුනා. චන්දේ දිනන්න නම් චන්දේ ඉල්ලා ගෙන් ගෙට යාම ඒ කාලේ අනිවාර්යයයි. අති තියුණු සටන් වලින් පසුව චන්ද **45, 103, 300, 500** න් වගේ දිනපු මන්ත්‍රීවරු හිටියා. පරාජිතයෝ පරාජය පිළිගෙන නම්බුකාර විදියට ගෙදර ගියා. ඒ දවස්වල චන්ද දායකයෝ දන්නවා ඒ අයගේ මන්ත්‍රි හරියටම කවුද කියලා. නරක අයව ඊ ළඟට එන මැතිවරණයෙන් පරාද කර ගෙදර යවනවා. ලංකාව වගේ පොඩි රටකට හරියන්නේ මේ ක්‍රමයයි.

267. අද බොහෝ විට සල්ලිකාරයෝ දිස්ත්‍රික්කය පුරාම සල්ලි වියදම් කරලා මනාප අරගෙන පාර්ලිමේන්තුවට රිංගනවා. බලයට ආපු දා ඉඳලා ලබන චන්දෙ දිනන්න වියදම් කරන්න සල්ලි හොයනවා. ඒ අය ඉන්නකම් මේ

ප්‍රජාතන්ත්‍රවාදයට අහිතකර වූ ක්‍රමය වෙනස් කරන්න දෙන්නේ නැහැ.

268. එක් පළාත් සභා ආන්ඩුකාරවරයෙක් **2014**දි පමණක් මහජන මුදල් රුපියල් මිලියන **18.55** ක් වැය කර, පුද්ගලික තෑගී මිලදී ගෙන, තමන් දෙන තෑගී හැටියට දීලා. මැරුනහම, මිනිහගේ පිළිරුවක් එහෙමත් හදයි.

269. චන්දෙට ඉස්සෙල්ලා නොයෙක් පොරොන්දු දෙනවා. එහෙම කියලා චන්දෙ යදිනවා. දින්නට පස්සේ ඒ දේ හරියටම කරන්නේ නැහැ. කාවද මේ අය රවටන්නේ; තමන්ව දිනවපු චන්දදායකයින්ව. කුඩා දරුවන් මේවායින් ඉගෙන ගන්න පාඩම මොකක්ද?

270. බොරු කීම හොඳයි කියලා කියන එක මේ රටේ පාලකයෝ ඔප්පු කලේ ඔය 'හඳෙන් හරි ගෙනල්ලා හාල් නිකන් දෙන්නම්', 'ඇට අට දෙන්නම්' වගේ බොරු පොරොන්දු වලින්.

271. **1950** ගණන් වල පැය **24**න් රාජ්‍ය භාෂාවක් ඇතිකරලා රටේ නැති ප්‍රශ්න ඇති කරලා, දින කිහිපයක් ඇතුලත **u-** ටර්න් එකක් ගත්තා පෙඩරල් ක්‍රමයක් දෙනවා කියලා. ආපසු, හාමුදුරුවරු සත්‍යග්‍රහ කරන කොට ඒ පෙඩරල් යෝජනාව හකුලා ගත්තා. මේ අය දේශපාලනඥයයෝද, මඩේ හිටවපු ඉනිද?

272. **1983** ජාතිවාධි කෝලාහල ඇතිවුනේ එවකට හිටපු පාලකයන්ගේ අනුදැනුම මත කියලා සමහරු කියනවා. අහිංසක දෙමල මිනිස්සුන්ගේ ගෙවල් හොයාගෙන ගිහින් ගිනි තියලා තියෙන්නේ ග්‍රාමසේවක ලැයිස්තු අතේ අතිවලු.

273. එදා **1983** කල ඒ 'ගොන්' වැඩය නිසා අදත් අප ජාත්‍යාන්තරයේ විඳවනවා.

274. ජාතියේ පියා එදා කෘෂිකර්මාන්ත ඇමති සහ පසුව අගමැති අවධියේ බිහිකළ පදවිය, ශ්‍රී පුර, ගල් ඔය, ගෝනගල, අරන්තලාව, කනතලේ, කන්දකඩුව වැනි ගොවි ජනපද නොවන්න අප අද විදේශ වලින් සහල් ගෙන්වනවා මහා පරිමාණයෙන්. එතුමා නැතිනම්, මායිම් ගම් කියන ගම් පටන් ගැනෙන්නේ අනුරාධපුර, පොලොන්නරුව, අම්පාර වගේ තැන් වලින්.

275. එතුමා එදා දකුණේ (ගාල්ල, මාතර) මිනිස්සුන්ව එදා පදිංචි කරන කොට ඊට තදින්ම විරුද්ධවූ මාක්ස්වාදී නායකයෝ කිවේ 'යන්න එපා එහේ කාක්කෝ තරම් ලොකු මැලේරියා මදුරුවෝ ඉන්නවා' කියලා.

276. **1972** දී මැරෙනකොට තමන්ගේ බැංකු පොතේ රුපියල් **350**ක් පමණක් තිබු හිටපු අගමැති කෙනෙක් හිටියා.

277. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු නිරතුරුවම වෙනස් කරන ලියවිල්ලක් නොවිය යුතුයි. ‘බල්ලන්’, ‘පූසන්’ සඳහා වූ පනත් නම් නිරතුරුව වෙනස් කලාට කමක් නැහැ.

278. ඇමරිකාව, බ්‍රිතාන්‍යය, ඕස්ත්‍රේලියාව, සිංගප්පූරුව වැනි දියුණු රටවල් ඒ අයගේ ආණ්ඩුක්‍රම ව්‍යාස්වස්තාව මේ අපේ විදියට වෙනස් කරන්නේ නැහැ.

279. **1972**දි අත තැබුව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධන අද දිනයේත් ඉවර නැනේ. අද අපි ඔක්කොම අනාගෙන, බෙල්ල ලඟට එරිලා ඉන්නේ. දැන් **20**වෙනි සංශෝධනය ලඟට ඇවිල්ලා. ගිලෙන්න තව පොඩ්ඩයි වගේ තියෙන්නේ.

280. ලී ක්වාන් යූ (සිංගප්පූරුව) සහ ජෝන් හවර්ඩ් (ඕස්ත්‍රේලියාව), දෙන්නම කිවුව දෙයක් ‘බලන්න ශ්‍රී ලංකාව දිහා, ඒ අය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරලා ආමරුවේ වැටුන අය, අප ඒ අයගෙන් පාඩමක් ඉගෙන ගත යුතුයි’.

281. තවත් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් දැන් හදා ගෙන යනවලු. ආණ්ඩුව පෙරලුනොත්, අලුතින් එන අය තව එකක් හදාවි. මේකේ නිමාවක් නැහෙනේ. ගෙදරක් හැදුවට පස්සේ ෆවුන්ඩේෂන් වෙනස් කරනවද?

282. එක් පළාත් සභාවක මන්ත්‍රීවරු පිටරට යනවලු සවාරියක්, ඒ පළාත් සභාවේ සල්ලි වලින්. ඒ පළාතේ ඉස්කෝල ළමයිට පුටු මේස සහ රෝහල් වාට්ටු ප්‍රතිසංසකරණය කරලා, ඇම්බියුලන්ස් එකක් හෝ දෙකක් අරගෙන, ගම්වල වලවල් තියෙන පාරවල් ටිකක් කොන්ක්‍රීට් කරලා දාන්න තිබුනා නේද ඔය සවාරියට වියදම් කරන සල්ලි වලින්. යන්නම ආස නම් තමන්ගේ සල්ලිවලින් යන්න.

283. මහනුවර මහ නගර සභාවේ මන්ත්‍රීවරුන් 20 ක් සහ නිලධාරි කණ්ඩායමක් චීන රටේ සංචාරයක් සඳහා දිවයිනෙන් බැහැරව ගියේ 2016 ජුනි මාසයේදී.

284. ඉස්සර අමාත්‍යංශයකට වෙන් කරන මුදල් වලට අත තියන්න පුළුවන් අමාත්‍යංශයේ ලේකම්තුමාට පමණයි, ඇමතිට බෑ. අද ඔක්කොම ඇමතිට යටයි වගේ. මහජන කටයුතු සඳහා වෙන්කරන මුදල් අද ඇමතිලා පිටරට සවාරි (තම හෙන්වයියන් සමඟ), භෝජන සංග්‍රහ, ගෙදර විදුලි බිල/ජල බිල ගෙවන්න පවා පාවිච්චි කර තිබෙනවා.

285. ඉස්සර රජයේ වැඩ කෙරුනේ දෙපාර්තමේන්තුවලින්. අමාත්‍යංශ තිබුනේ ඉතා පොඩි ආයතන හැටියට. අද දෙපාර්තමේන්තුවලට තැනක් නැහැ, සෑම දේම වගේ වෙන්නේ අමාත්‍යාංශයෙන්.

286. **1948** ශ්‍රී ලංකාවේ ප්‍රථම රජයේ කැබිනට් මණ්ඩලය සමන්විත වුනේ සාමාජිකයන් **18** දෙනෙක්ගෙන් විතරයි. අද? **1970** මැතිණිගේ කැබිනට් මණ්ඩලයට අයත් වුනේ **21** දෙනායි.

287. ශ්‍රී ලංකාව මෙන් **120** ගුණයක් විශාල ඕස්ත්‍රේලියාවේ කැබිනට් මණ්ඩලයට අදත් ඉන්නේ සාමාජිකයන් **20** දෙනෙක්විතරයි.

288. රජය ශක්තිමත් කරගන්න කියලා තමයි හැම මන්ත්‍රී කෙනෙකුටම වගේ කැබිනට්/රාජ්‍ය/නියෝජ්‍ය ඇමතිකම් දෙන්නේ. ශක්තිමත් රජයක් අවශ්‍ය බව ඇත්ත, නමුත්, ජනතා නියෝජිතයන් හැටියට මන්ත්‍රීවරු දැනගන්න ඕන තමන්ගේ පුද්ගලික අභිමතාර්ථයන්ට පෙර රට, ස්වකීය ප්‍රතිපත්ති, ජනතාවට දුන් පොරොන්දු ගැන හිතන්න.

289. කැබිනට් මණ්ඩලය ඉතා විශාල වීම නිසා ඒ අය නඩත්තුවට අති විශාල මහජන මුදලක් වැය කරන්න වෙනවා. කට්ටිය වැඩි වුනහම ඇතුල අවුල්, පාලනය කරගන්න අපහසුයි. කැබිනට් රහස් ලෙහෙසියෙන් එලියට ‘ලීක්’ වෙනවා. හොරකම්/අක්‍රමිකතා කරන අයට ලෙහෙසියි.

290. මැති ඇමතිවරු සීමාවක් නැතිව පිටරට සංචාරය කරනවා. අමාත්‍යංශවල මුදල් වලින් පිටරට හෝටල වල

මත්පැන් බිල් පවා ගෙවා තියෙනවා. මේවා ඉහලින්ම සොයා බලා නවත්වන්න ඕන දේවල්.

291. දේශපාලනඥයන්ගේ වංචා දූෂණ හොයනවා නම්, සිය විරුද්ධවාදීන් හෝ තමන් සමඟ තරහා අයගේ පමණක් වංචා දූෂණ හොයනවා නම් ඒකත් වංචාවක් සහ දූෂණයක්. ආණ්ඩුව ඇතුලේ ඉඳන් වංචා දූෂණ කරන අයවත්, කොයිතරම් බලවත් උනත්, කොයි තරම් තද මිතුරන් උනත්, අල්ලන්න ඕන.

292. වංචා දූෂණ කරපු දේශපාලනඥයන් විශේෂ වංචා දූෂණ කාර්යාංශ වෙත අරගෙන යනවා, හොඳ දෙයක්. හැබැයි නඩු පවරා වැරදි කරුවන්ව හිරේ යවන්න ඕනා. කොච්චර කල් බලං ඉම්මුද? කෙරෙන දේවල් නොවෙයි කියලායි ගොඩක් දෙනෙක් කියන්නේ.

293. දේශපාලනඥයින් ස්වකිය බිරියන්, දරුවන්, ඥාතින් සිය පුද්ගලික ලේකම්ලා, සම්භන්ධීකරන ලේකම්ලා වගේ කරගන්නවා. සමහර අයට සංස්ථා සභාපතිකම්/අධ්‍යක්ෂකම් අරං දෙනවා. ඒ වගේමයි ලිංගික අල්ලස්. මේවා වංචා දූෂණ වලට ඉනිමං තැනීම්. තහනම් කල යුතුයි. හඳුන්වා දුන් නව ආචාර්යධර්ම පද්ධතියෙන් මේ තහනම පැනවිය හැකියි.

294. වංචා දූෂණ, අල්ලස් ගණන් ගන්නේ නැති හෝ ඒවායේ බරපතලකම අවතක්සේරු කරන අය බොහෝ විට තාන්න මාන්න ලැබුනොත් ඒ වගේ දෙවල් කරන අය.

295. රටේ ජනතාවට ස්වකිය කැමැත්තෙන් ඕනෑම තැනක ජීවත්වීමේ අයිතිය තියෙන්න ඕන.

296. බොහෝමයක් රජයේ කාර්යාල වලට ගියහම එහි නිලධාරින් කටයුතු කරන්නේ වැඩේ කරලා දෙන්න නෙවි, වැඩේ නොකෙරෙන්න. සුළු වැඩකට අපිව තුන් හතර වතාවක් බොරුවට ගෙන්වනවා. මේ එම නිලධාරීන් ඔවුන්ගේ ‘බලය’ අපට පෙන්වීමක්. උඩින්ම හොඳ නායකත්වයක් පෙන්වනවා නම් මේ අඩුපාඩු ‘ටක්’ ගාලා හදා ගත්තැකි, දැන් පඩිත් වැඩි කරලා තියෙන හන්දා.

297. දූෂණ, වංචා තිබුනට කමක් නැහැ, ඒවාත් එක්ක රට දියුණු කරමු කියන සංකල්පය මුලාවක්. දූෂණ, වංචා හරියට කිරි කලයට ගොම එක් කළා වගේ.

298. දූෂණ, වංචා නොමැති රටක් ලොව නොමැති තරම්. නමුත් දියුණු රටවල ඒවා ‘සංස්කෘතියක්’ බවට පත්වී නැහැ. තවද, අහු උනොත් නිතිය අකුරටම ක්‍රියාත්මක වී ඒ අයට දැඩි දඬුවම් දෙනවා, හිරේ යවනවා.

299. දූෂණ, වංචා කරන කෙනා ඒ දේවලට ඇබ්බැහි වෙනවා, හරියට අබිං කෑ කෙනා වගේ. ඒ අයගෙන් තමන්ගේ වැඩ කොටස/රාජකාරිය හොඳින් ඉටු වේ යයි කවදාවත් බලාපොරොත්තුවන්න බැහැ. කොටින්ගෙන් හොරට සල්ලි අරන් සිමෙන්ති, කටුකම්බි, කම්බි ඇණ උතුරට ගෙනියන්න දී, ඒවායින් හැදූ බිම් බෝම්බවලින් තමන්ම මැරුණු වංචනික හමුදා නිලධාරින් සිටියාලු.

300. රටේ දුප්පත් කමට/ඉදිරියට නොයාමට තවත් හේතු කිහිපයක් තමයි අපරිපාලනය, අකලමනාකරණය, නාස්තිය, උකටලිභාවය සහ ආත්මාර්ථකාමිත්වය.

301. දුප්පත් කම නැති කිරීමට නම් පාලකයන් තුල දුප්පත්කමට නිවැරදි හේතු සහ දුප්පත්කම තුරන් කරන නැණවත්, බුද්ධිමත් මාර්ග දැන සිටිය යුතුයි. ‘දුප්පත්කම තුරන් කරමි’ යන දැඩි කැපවීම සහ මතය ඔවුන් තුල තිබිය යුතුයි; එය මන්ත්‍රයක් මෙන් නිතර කිව යුතුයි.

302. රට පාලනය කරන්න හැම ඇමති කෙනෙකුටම ලක්ෂ 300/400 බෙන්ස් කාර් එකක් අවශ්‍ය නැහැ. සෝභන අවශ්‍ය නැති, ආත්ම විශ්වාසයෙන් වැඩ කරන, නිහතමානි ඇමතිවරයෙක් නම් ත්‍රීවිලයෙන්/මොරිස් මයිනරයෙන් හරි රාජකාරි කරන්න වැඩට යයි. මිනිස්සු ආදරයෙන් ඒ අයව වැළඳ ගන්න හැටි බලාගන්න පුළුවන් එක ඇමතිවරයෙක් හරි ඒ විදියට හැසුරුනොත්.

303. ඇමතිතුමා ලාභ,මිල අඩු වාහනයකින් නම් වැඩට එන්නේ එයා යටතේ ඉන්නේ ලේකම්ලා, සභාපතිලා, ඩිරෙක්ටර්ලත් මිල අඩු වාහන වලින් එන්න වෙනවා; රජයේ මුදල් බිලියන ගණන් ඉතිරි වෙනවා. නමුත් මෙවැනි ‘නිර්භීත’ පියවරන් ගන්න පුළුවන් ඇමතිලා අප අතර ඉන්නවද?

304. ගාල්ලේ දහනායක මහත්තයාට කාර් එකක් තිබුනේ නැහැ, බස් එකෙන්මයි ගමන් බිමන් ගියේ. අනිතිමට ස්වාධීනව තරඟ කරලා යුඑන්පි, ශ්‍රී ලංකා දෙගොල්ලම පරද්දලා දින්නා.

305. රුපියල් ලක්ෂ 400 ගානේ ඇමතිවරු 90ට විතර වාහන අරං දෙන්න නම් අපිට ගහන බදු තව ගොඩක් ඉහල දාන්න වෙයිනෙ.

306. වාහන අවශ්‍ය අමාත්‍යවරුන්ට රුපියල් කෝටි ගණන් වටිනා අති සුඛෝපභෝගී වාහන වෙනුවට, පහසුකම් ඇති, නඩත්තුවට විශාල වියදමක් නොයන, ශ්‍රී ලාංකාවේ (හෝ ඉන්දීය/චීන) නිෂ්පාදිත, අඩුමිලට ලබාගත හැක එකම මාදිලියේ වාහනයක් සියලුදෙනා වෙත ලබා දිය යුතුයි.

307. පත් වෙච්ච දා ඉඳලා පිට රටම සවාරි ගහන ඇමතිවරියක් ගැන වාර්තා පල උනා. නායකයන්ටයි බනින්න ඕන, හරියට කණ්ඩායම හදාගන්න බැරි නම්.

308. මේ රටට ඇතුළුවන දොරටුව (gateway) මන්නාරමයි. ශ්‍රී ලංකාවේ තලෙයිමන්නාරම සිට දකුණු ඉන්දියාවේ ධනුස්කොඩියට කීම 20 ගානයි තියෙන්නේ. සමහර කාලවලදී සමහර තැන්වල මුහුද කොපමන නොගැඹුරුද කියනවනම්, ඇවිදගෙන එන්න පුළුවන්. බොහොම දුකසේ ජීවත්වන අවතැන්වූ සිංහල පවුල් 50 ගානක් කිසිම උදවු උපකාරයක් නැතිව, දුකසේ, මන්නාරමේ ඉන්නවා. තමන් අවට ලස්සන ගෙවල්, ගෙමිදුල් සමඟ හැදෙන හැටි මේ අයට පේනවා. ඒත් මේ ගොල්ල බොහෝ දෙනෙක් තාම ඉන්නේ ටකරන් මඩු වල.

309. මඩකලපුවේ 'මංගලගම' ඉන්න දෙමල කථා කරන සිංහලයන්ගේ තත්ත්වය අති ශෝචනියයි. මේ අයට උදවු කරන මඩකලපුව වාසි, සංඝයාවහන්සේ පොලිස් අත් අඩංගුවට පවා පත් උනා.

310. හරියට අධ්‍යාපන ක්‍රමය නැත්නම් රටක බුද්ධිමත් ජනතාවක් බිහිවන්නේ නැහැ.

311. එක් මහා නගර සභාවකට දවල් 2ට විතර යන්න (විශේෂයෙන්ම, එහි නගර නිර්මාන සෙක්ෂන් එකට), සේවක, සේවිකාවෝ කී දෙනෙක් මේසෙට ඔළුව ගහගෙන නිදිද බලන්න. තව කිදෙනෙක් පත්තරේ බලනවද කියලා බලන්න.

312. 'සිංහල අයිතීන්' බෞද්ධ අයිතීන්' අද තහනම් වචන වෙලාද?

313. ශ්‍රී ලංකාවේ ජනගහන සංඛ්‍යාලේඛන, විශේෂයෙන්ම කොලඹ සීග්‍ර ජනගහන වෙනස්වීම් දිහා බැලුවහම සිංහල නමැති ජන කොටසේ ජනගහන ව්‍යාප්තිය සෙසු ජන කොටස් හා සසඳන විට අඩුයි කියා පිළිගන්න වෙනවා.

314. එදා කොළඹ නගර සභා සිමාවේ 70% පමණවූ සිංහල ජනගහනය අද 40% වත් නැති තරම්වත්ද? මේ වෙනස ඇතිවී තිබෙන්නේ අවුරුදු 30 ක් වැනි කෙටි කාලයක් ඇතුලතදිලු.

315. අපේ රටේ තට්ටු මාලිගා වල ජීවත්වෙන, නැව් වගේ වාහන වල යන, මාස දෙක තුනකට වරක් බටහිර විදේශ සංචාරය කරන අයට අපි ගරු කරනවා, කට ඇරලා 'සර්' ගානවා. නමුත්, සමහරෙක් ඒ අය ඒ සල්ලි හොයා ගත්තේ දූෂණ, වංචාකරලා, පරිසරය විනාශ කරලා නේද කියන එක අප ගණන් ගන්නේ නැහැ. අහිංසක, දහඩිය මහන්සියෙන්, සාධාරණ විදියට එදා වේල සොයා ගන්න මිනිහෙකුට 'සර්' ගාන එක ඊට වඩා සැපයි.

316. හොරකම් කල දේශපාලනඥයන් සිරේ නොයවන රටක්, ශ්‍රී ලංකාව. ඉන්දියාවේත් හිරේ යවලා තියෙනවා. බිම් මට්ටමේ පාක්ෂිකයෝ ගහ බැන ගනිද්දී, පක්ෂ දෙකේ

දේශපාලනඥයන් තරු පහේ හෝටලවල එකට කනවා බොනවා. ඕකට කියන්නේ 'නුඹ මගේ පිට කසාපන්, මම නුඹේ පිට කසන්නම්' කියලා (ටික කලකට රිමාන්ඩ් භාරයේ සිටීම (ඒකත් බොහෝ වෙලාවට රෝහලක), සිරේ යාමක් නොවෙයි).

317. බොහෝ දේශපාලනඥයන් රිමාන්ඩ් කල පසු බන්ධනාගාර රෝහල් ගත වෙනවා. මෙයින් රටේ ජනතාව ඉගෙනගන්නා පාඩම හොඳ දෙයක් නොවෙයි.

318. සමහරවිට ආණ්ඩුවකට වෙනවා දක්ෂ ව්‍යාපාරිකයෙක් සාර්ථක බිස්නස් එකක් කරන විදියට රට කරන්න. අනවශ්‍ය වියදම් කපා හැර, රටට උපරිම ආදායම් එන මං සොයා ඒවා වර්ධනය කරන්න ඕන. තියෙන ණය ගෙවා අයවැය හිඟයක් වෙනුවට සංචිතයක් හදා ගන්න උත්සහ ගන්න ඕන.

319. යුරෝපීය මත්ස්‍ය අපනයන තහනම ඉවත්වීම හොඳයි. ඒත් ලෝකෙටම දෙන්න තරම් මත්ස්‍යය සම්පතක් අපට තියෙනවද? පරණ ධීවරයන්ගෙන් අහලා බලන්න අපේ මුහුදේ මත්ස්‍යය සම්පත දැන් ඉස්සර වගේ නැහැ, හොඳටම අඩුවෙලා.

320. සුද්දන්ට කන්න දෙන්න ඉස්සෙල්ලා අපේ රටේ මිනිස්සුන්ට හොඳට කන්න අළුත් මාළු තියෙන්න ඕන, අඩු මිලට. නැහැ නේද?

321. උතුරේ ඉන්දීය ධීවර මංකොල්ලයට ස්ථිරසාර පිලියමක් හොයා ගන්න රජයන්ට බැරි ඇයි? මෙයින් වසරකට අපට වන පාඩුව ඇමරිකන් ඩොලර් බිලියනය පන්නනවා කියලයි සමහරු කියන්නේ. ඉන්දියාව නම්‍යශීලි නැත්නම්, ICJ (International Court of Justice) එකේ නඩුවක් දාන්නයි තියෙන්නේ. ඕස්ත්‍රේලියාව එවැනි නඩුවක් දැම්මා තම ඉතා හිතවත් රටක් වන ජපානයට විරුද්ධව (තල්මස් දඩයමට විරුද්ධව). ජපානය මුකුත් කිවේ නැහැ.

322. ලෝකයේ හොඳම තේ නිෂ්පාදනය කරන්නේ අපේ ශ්‍රී ලංකාවේ. ඒත්, 'ටී ඩස්ට්', 'ස්වීපිං තේ' වලින් අපේ 'ලෝකල් මාකට්' එක පිරිලා.

323. වස විස නැති ආහාර නිෂ්පාදනය නගා සිටුවීම සහ ප්‍රචලිත කිරීම ඉතාම හොඳ දෙයක්, ඒ දේවල් වෙනුවෙන් වැඩ කරන්නන්ට රටේ ප්‍රණාමය පිරිනැමිය යුතුයි.

324. කෘමි නාශක, රසායනික පොහොර මුළුමනින්ම නැතිව වී ගොවිතැන් කරන්න පුළුවන් කීම ප්‍රායෝගික නොවන බව හැමදාම වී ගොවිතැන් කරන ගොවි මහතුන් දන්නවා, කියනවා. ආවේගශීලිව කරන, වගකීමෙන් තොර මේ ප්‍රකාශ; ඒ වගේම පොහොර සහනාධාරය නොදීම

වැනිදේ මඟින් වර්ෂ ගණනනාවක් එක දිගටම ගොවිතැන් කරගෙන එන ගොවියන් අතරමං වෙන්න පුලුවන්. දැනටමත් අඩාල වී ඇති වී ගොවිතැන නැත්තටම නැතිවෙන්න පුළුවන්.

325. කෘමි නාශක, රසායනික පොහොර නැතිව, මහා පරිමාණයෙන් සැම වසරකම වී ගොවිතැන් කරන්න පුළුවන් කීම හරියට මැලේරියා/ඩෙංගු මදුරුවාව දුන් ගහලා මර්ධනය කරන්න පුළුවන් කියනවා වගේ වැඩක්.

326. රජ කාලේ එහෙම කළා කියා (කෘමි නාශක/රසායනික පොහොර නැතිව), මේ 21 වන සියවසේද එසේම කල යුතු/හැකි යයි කීම බුද්ධිගෝචර නොවේ.

327. කුඹුරකට ඉතාම හානිදායි කෘමින් වර්ග, වල් පැල වර්ග බොහෝයි. වසර ගණනාවක් වගා කිරීම (ශාක මඟින් සාරය උරා ගැනීම ආදිය), සෝදා පාළුව නිසා පස් ඉතා නිසරු වෙනවා. රසායනික පොහොර නොයොදා මේවා නගා සිටුවන්න බැහැ.

328. කාබනික පොහොර හොඳයි, ඒත් රසායනික පොහොර වලින් කෙරෙන කාර්යය කෙරෙන්නේ නැහැ.

329. කෘමි නාශක/රසායනික පොහොර නොයොදා කාබනික/කොම්පෝස්ට් වැනි ද්‍රව්‍යය භාවිතයෙන් ආහාර නිපදවීමට වඩාත් ශ්‍රමයක් සහ කාලයක් වැය වෙනවා. මහා පරිමාණයෙන් අක්කර සිය ගණන් කුඹුරු ගොවිතැන් කරන ප්‍රදේශවල වසරක් හෝ දෙකක් කෘමි නාශක/රසායනික පොහොර නොයොදා වගා කරන්න පුළුවන් වේවි (ඒ ද්‍රව්‍යවල බලපෑම තවමත් පසේ/පරිසරයේ තිබෙන නිසා). ඒ නිසා හැමදාම ඒවා නොයොදා වගා කරන්න කීම ප්‍රායෝගික සහ තර්කානුකුල නැහැ.

330. හැමදාම කෘමි නාශක/රසායනික පොහොර නොයොදා කුඹුරු හෝ වෙනත් ගොවිතැන් කරන්න බැහැ. කෘමි/වල් නාශක, නිසරු පස් අප හිතනවාට වඩා ගැඹුරු ප්‍රශ්න. ඒවාට රසායනික ප්‍රතිකර්ම අවශ්‍යයි. මුළු ලෝකයේම තත්ත්වය එයයි.

331. ගොයම් මකුණා කුඹුරු යායවල් වලට කරන්නේ අතිමහත් විනාශයක්. ගොයම් කරල් පිටින්ම විනාශ කරනවා. පැල මැක්කා, ගොක් මැස්සා, දුඹුරු පැල කීඩැවා, කොළ හකුලන දළඹුවා වැනි කෘමින්ද ප්‍රධාන පෙලේ ගොයම් පල්බෝධකයි. රජ කාලේ නොතිබුණු මේ ප්‍රශ්ණ විසඳිය හැක්කේ කෘෂිරසායනික ද්‍රව්‍ය වලින් පමණයි. විශේෂයෙන්ම අක්කර සිය ගණන් විශාල වෙල් යායවල. වල් පැල රජ කාලේ මෙන් වතුර බැඳීමෙන් පමණක් අද මර්ධනය කරන්න බැහැ. අද, ගොවි මහත්වරුන්ට ඕන අඩු කාලයක් තුල උපරිම ප්‍රතිපල ලබාදෙන ගොවිතැන් ක්‍රම.

වසර ගණනාවක් එකම භූමියේ වගාවන් කරන කොට ඒ පස නිසරු වෙනවා. ඒ පස සරු කිරීමට නම් රසායනික පොහොර යෙදිය යුතුයි. කුඹුරු පමණක් නොවෙයි අනෙක් වගාවන්ටද බලපාන්නේ මේ මුල ධර්මයමයි.

332. සමහර පස් වල පැලෑටි වලට අවශ්‍ය සියලුම පෝෂනයන් ඇති අතර ක්ෂුද්‍ර ජීවීන් මගින් අර්ධ පාෂාන ජීරනය කර පැලෑටි වලට උරා ගැනිමට අවැසි ලෙස රසායන ද්‍රව්‍ය සකස් කෙරේ. මේ නිසා කිසි කරදරයක් වස විස නැති අහාර (එළවලු/පලතුරු/ධාන්‍ය) සකසා ගත හැකියි. නමුත් බොහෝ ස්ථාන වල ආර්ථික බෝග ලෙස වැවීමට සුදුසු පසක් නැත. රසායනිකයන්ම යෙදීමටම සිදුවේ.

333. කාබනික පොහොරම පමණක් යොදන්න කියන අය, දන්නවද ඒවා හදන්නේ මොනවායින්ද කියා? අක්කරයක වානිජ වගාවක් සඳහා අවශ්‍ය කාබනික පෝර සැදීමට තව අක්කර කීයක් කැලය වැවිය යුතුද? අපට එහෙම වවන්න ඉඩම් තිබේද?

334. අද නගරවල කොම්පෝස්ට් යැයි කියා විකුණන්න තිබෙන්නේ බොහෝ විටම ඉවතලන කුණු එකතු කර ජීරණය වූ කාබනික, අකාබනික ද්‍රව්‍යයි. ඉතා සුළු පිරිසක් පමණක් නියම ශාක ද්‍රව්‍ය , දිරුකොහුබත්, ඩොලමයිට්, පිරිසිදු කාබනික අපද්‍රව්‍ය , හිතකර බැක්ටීරියා ආදී එකතුවක් මිශ්‍ර කර කොම්පෝස්ට් සාදති. නගරයේ කුණු දිරු

කොම්පෝස්ට් යනු අති භයානක බැර ලෝහ, පොලිතීන්, විස ද්‍රව්‍ය අඩංගු එකතුවකි. ඒවා යොදා ගෙවත්තේ වගා කිරීම කොහේවත් යන විස සිරුරට එක් කර ගැනීමකි. ඊට වඩා හොඳයි කෘෂි රසායනික පොහොර?

335. බොහෝ ගොවි මහතුන් පිළිගත් ආරක්ෂිත ආවරණ නොපැළඳගෙන කෘෂි රසායන, රසායන පොහොර සමඟ වැඩ කරනවා. ඉතාම නරකයි. පිළිකා/හුස්ම ගැනීමේ/වකුගඩු රෝග හැදෙනවා.

336. ආසනික්, කිවුල් ජලය සහ කුඹුරු පස කියන තුනම එකතු වෙලා වකුගඩු රෝගය හැදෙන බව එදා කිවූ අය අද හේතුව ආසනික්, කැඩ්මියම්, ග්ලයිෆොස්පටේ (රවුන්ඩ් අප්) ආදීය යයි කියා, තවත් නොයෙක් කාරක එකතු කරනවා සහ හේතු දක්වනවා. හරියටම හේතුව මේකයි (උදා:බොන ජලයට මේ දේවල් මිශ්‍ර වෙලා), කියා කියන්න පුළුවන් ලොව පිළිගත් විද්‍යාඥයින්, මේ පිළිබඳව කල යුතු සම්පූර්ණ පරීක්ෂණ වලින් පසුව එලි දක්වන වාර්ථා අනුවයි. එවැන්නක් අද වෙනතුරු හරියට වෙලා නැහැ. ආවට ගියාට විශේෂඥයන්, විද්‍යාඥයින් නොවෙන අය කරන ප්‍රකාශ වලින් වෙන්නේ ප්‍රශ්නය විසඳීම නොව තව තවත් උග්‍ර වීමයි. වකුගඩු රෝග හැදීමට විවිධ හේතු සාධක තියෙනවා; එකක්ම පමණක් යයි කියන්න අපට තියෙන විද්‍යාත්මක සාක්ෂි කවරේද?

337. හොඳ, බුද්ධිමත්, තීක්ෂණ නීති උපදෙස් නොතකා තත්ත්වයෙන් අඩු නීති උපදෙස් උඩ ජාත්‍යාන්තර ගිවුසුම් අත්සන් කිරීම නිසා අපට ඩොලර් බිලියන් ගණන් ගෙවන්න වෙලා. හෙජින් ගිවුසම හොඳ උදාහරණයක්. මෝඩකමකට මිස එවැනි ගිවුසුමක් අත්සන් කරන්නේ නැහැ.

338. ග්‍රීසිය ආර්ථික අතින් පෙරලෙන බව දැන දැන කෝටි ගණන් ශ්‍රී ලංකාවේ මහජන මුදල් ආයෝජනය කරන්න ඔලුව හෝන්දු මාන්දු වෙන්න ඕන.

339. 'එයාර් ලංකා' ගිවිසුමේ අඩු පාඩු නිසා බෝම්බ වලින් විනාශ වූ අපේ ගුවන් යානාවලට ගෙවූ රක්ෂණ වන්දි මුදල් ගියේ අපට නොවේ එවකට එයා ලංකා පාලනය කල විදේශ ගුවන් සමාගමකට. අද ශ්‍රී ලන්කන් එයා ලයින් එකට එකම ගුවන් යානයක්වත් අයත් නැහැල්ලු, කුලියට අරන් දුවන්නේ.

340. බොහෝ බටහිර රටවල අපට අයත් ව තිබු 'ලැන්ඩින් රයිට්ස්' එයා ලංකා පාලනය භාර දීමත් සමඟ අන් අය අයිති කර ගත්තා. සිඩ්නි, මෙල්බර්න්, හිත්රෝ, චාර්ල්ස් ඩි ගෝල් උදාහරණලු.

341. අද තිබෙන දරන්න බැරි විදේශ ණය නිසා අපි ඒ ණය පොලි ගෙවන්න තවත් විදේශ ණය ගන්නවා. මේක පුද්ගලයෙක් බංකොලොත් වෙනවාට සමාන දෙයක්. ග්‍රීසිය බේරාගන්න යුරෝපිය ප්‍රජාව සිටියා, අපට ......?

342. ඉන්දියාව සහ චීනය අපට දෙන මුල්‍යමය ආධාර අප ඉතා අගේ කල යුතුයි.

343. ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන් පිරිසක් දැන් ඕස්ත්‍රේලියාවේ ඉන්නවා. ඉස්සර, 1990 මැද භාගයේ, සිඩ්නි, මෙල්බර්න් ඉඳන් කෙලින්ම කොළඹට ප්ලයිට් තිබුනා. මෙය ඕස්ත්‍රේලියාවේ ඉන්න ශ්‍රී ලාංකිකයන්ට විශාල පහසුවක් උනා. ඒ නිසා, බොහෝ යුරෝපය බලා යන සංචාරකයෝ ශ්‍රී ලංකාවේ නතර වෙලයි ගියේ. අද අපේ අය පැය ගණන් ආසියානු රටවල ගුවන් තොටුපලවල තපිනවා. අපට අහිමිවූ යුරෝපිය සංචාරක මඟ සිංගප්පූරුව, හොංකොං, බැංකොක්, KL වගේ රටවල්/නගර ඩැහැ ගත්තා. මේවා නැවත ස්ථාපිත කර ගැනීමට කලින් තිබු රජයන් අසමත් වුනා.

344. 1949 දී ඕස්ත්‍රේලියාව සිය ක්වන්ටාස් ගුවන් සේවය ආරම්භකර ප්‍රථම (මංගල) ගුවන් යානය බ්‍රිස්බන් සිට ලන්ඩන් දක්වා යැවුවා. එය නැවත්වුවේ කොහිද? සිංගප්පූරුව, හොංකොං, බැංකොක් හෝ ක්වාලා ලම්පූර් නොවේ ..... කොළඹ, ශ්‍රී ලංකාවයි. අද ක්වන්ටාස් ලංකාවට එන්නෙවත් නැහැ.

345. ඕස්ත්‍රේලියාවේ සිට ලන්ඩනයට යන කෙටිම ගුවන් මාර්ගය ඇත්තේ කොළඹ ශ්‍රී ලංකාව හරහා යයි කියනවා.

346. මුළු ලෝකෙටම ණය වෙලා බොරු මෙගා හෝ ඒ වගේ වෙනයම් ප්‍රොජෙක්ට් පටන් අරං කරන වැඩ වලින් වෙන්නේ මුළු රටම අගාධයට යාමයි. ඉපදින්න ඉන්න පරම්පරා ගානක් අපි  තව තව ණය කාරයෝ කරනවා. ආර්ජන්ටිනාව, ග්‍රීසිය වගේ රටක ආර්ථිකය මුලුමනිම කඩා වැටෙන්න එච්චර අමාරු උනේ නැහැ, වැඩි කාලයක් ගියෙත් නැහැ.

347. අපේ ප්‍රධාන වැවිලි අපනයන තේ, රබර් සහ පොල්. මේ වැවිලි කර්මාන්ත අද ඉතා දුර්වල වෙලා, ක්‍රමයෙන් අභාවයට යන බවක් තමයි පේන්න තියෙන්නේ.  සුළු වගා හිමියන් වගා අතහැර ගස් ගලවා ඉඩම් විකිණීමට පටන් ගෙන ඇති බව සමහර දිස්ත්‍රික්ක වලින් වාර්ථා වෙනවා (මේ නිසා කඳු නායයෑම් පිළිබඳවද විශාල අවදානම් ඇති වෙනවා).  දැන් පොහොර ගබඩාවලින් පොහොර අලෙවි වෙනවා අඩුයි.

348. පොල් වගාව දැනටමත් පරිහානියකට ලක් වී ඇති අතර පොල් කර්මාන්තය ආශ්‍රිතව රැකියා කල විශාල පිරිසකට රැකියා අහිමිවෙලා. සාරවත් පොල් වගාවක් පවත්වාගෙන යාම සඳහා සිදුකල යුතුම පොහොර දැමීම, පාංශු බාදනය වැලැක්වීම, වල් පැල මර්ධනය වැනි නඩත්තු කටයුතු දැන් කරනවා අඩුයි.  කුඩා පොල් වතු හිමියන් අධික කැඩුම් කුලී හා අධික එකුතු කිරීමේ වියදම් නිසා පොල් කැඩීම නවතා වැටෙන පොල් පමණක් අහුලා කීයකට හෝ

විකුණා දමනවා. කොහුමෝල් පමණක් නොව පොල් තෙල් මෝල් සෑහෙන ප්‍රමාණයක් වැහිලා ගිහිල්ලා.

349. හැමදාම 'සිලෝන් ටී' කියලා අපේ කළු තේ ලෝක වෙළඳ පොලට ගිහින් මහාපරිමාණයෙන් විකුන්නන්න අමාරුයි. 19 වන ශතවර්ෂයේ තේ විකුනපු විදියට මේ 21 වන ශතවර්ෂයේ තේ විකුනන්න බැහැ. ලොව නූතන තරුණ පරම්පරාව බොන්න කැමති රස්නේ ඇති පාන වලට වඩා ශිතල බිමයි. අයිස් ටී හොඳට ඉස්තරම්ම තත්ත්වයෙන් නිෂ්පාදනය කරලා, හොඳට මාර්කට් කරලා, ලෝක වෙළඳපොළට දැම්මොත්, කොකා කෝලා ඒකාධිකාරය පවා කඩන්න පුළුවන්. රජයන් අත දෙන්නේ/අත ගසන්නේ නැතිව පුද්ගලික අංශයට මේ දේවල් තනියම කරන්න බැහැ.

350. ලෝකෙන් වැඩිම තේ අපනයන කරන සහ හොඳම තේ නිපදවන රට ශ්‍රී ලංකාවයි. කොළඹ ජාත්‍යාන්තර ලෝක තේ වෙන්දේසි වෙළඳපොළක් (ලන්ඩනයේ වගේ) අද වෙනතුරු බිහි නොකළේ මන්ද කියා සිතාගන්න අපහසුයි.

351. කෝපි වවා රට හදන්න පුළුවන්. හාපිටිගම් කෝරලේ තමයි කෝපි වවන්න ඉස්තරම්ම ප්‍රදේශය. හරියට කලොත්, අපට කොපි වලින් ස්වයංපෝෂිත වී කෝපි පිටරටින් ගෙන්වීමට යන අධික විදේශ විනිමය ඉතිරිකර ගත හැකි වෙනවාට අමතරව කෝපි අපනයෙන්

කෝටි ගණන් මුදල් මහා භාණ්ඩාගාරයට එක් කරගන්නත් පුළුවන්.

352. කුරුඳු යනු හොඳ කුළු බඩුවක්,ඖෂධයක් වගේම බෙහෙත් සහ රූප ලාවන්‍ය නිපදවීමට ගන්නා ප්‍රධාන අමු ද්‍රව්‍යයක්. පිළිකා නාශකයක්. කාලයක්, (15/16 වෙන සියවසේ), එය රත්තරං වලටත් වඩා වටිනවා කියා කිවා. ලෝකයේ හොඳම සහ වැඩියෙන්ම කුරුඳු නිපදවන රට ශ්‍රී ලංකාවයි. මෙය අපට 'අවියක්' ලෙස භාවිතා කරලා ලෝකේ කුරුඳු අපනයනය කරන සහ කුරුඳු මිළ පාලනය කරන ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත්වෙන්න පුළුවන්.

353. ලෝකයේ කුරුඳු වෙන්දේසි පොලක් ලංකාවේ පිහිටවිය හැකියි, ලංඩනයේ තේ වෙන්දේසි පොල වගේ. එවිට, මෙහි සිටින සහ මෙහි පැමිණෙන කුරුඳු ගැනුම්කරුවන් ගණන වැඩි වේවි.

354. හොර, බාල මැණික් (කෘතිම ගල්/විදුරු ගල්) වෙළඳපොළට නිකුත් කරලා ශ්‍රී ලංකාවට ලොව හොඳම මැණික් නිපදවන රට යන ගෞරවාන්විත නාමය ඉදිරියේදී නැති කරගන්න පුළුවන්. ලෝකයේ විශිස්ටතම නිල් මැණික් ගල් ලැබෙන්නේ ශ්‍රී ලංකාවෙන් බව මුළු ලොවම දන්නවා. බ්‍රිතාන්‍යයේ කේට් කුමරිය අදත් පළඳින්නේ ශ්‍රී ලංකාවේ නිල් මැණික් ඔබවපු රන් මුදුවක්.

355. තුම්මුල්ලේ, රේස් කෝස් පාරේ ලක්සළ ආයතන ලක්සනට පවත්වාගෙන යනවා. කවුද කියන්නේ රජයට පුද්ගලික ව්‍යාපාර කරන්න බැහැ කියා. නියම පාලකයෝ පත් කරනවා නම් රජය කියලා නැහැ, ලාභ ලබන ව්‍යාපෘති පවත්වා ගෙන යන්න පුළුවන්.

356. හැකි තරම් විදේශ විනිමය (ඩෝලර්, යුරෝ, යෙන්, පවුම් වැනි) අප රටට ගෙනෙන ව්‍යාපාරවලට අත හිත දිය යුතුයි (අපනයන භාණ්ඩ නිෂ්පාදනය වැනි). ඔය ත්‍රීවීල් එළවලා, රූප ලාවන්‍ය කරලා රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලැබුනත්, රටට රිජුව විදේශ විනිමය නම් ලැබෙන්නේ නැහැ, නැත්නම් ටිකයි.

357. නමුත් රටේ ආර්ථිකය ඉදිරියට ගෙනයාමට ත්‍රී වීල් විශාල සේවයක් කරනවා, විශේෂයෙන්ම බස්/දුම්රිය මගී ප්‍රවාහන සේවා දුර්වල මේ අවධියේ.

358. ආණ්ඩුව **2016** වාහන බදු වැඩි කිරීමේදී වැඩිම ප්‍රතිශතයක් වැඩි කර තිබුනේ ත්‍රීවීල් රථවලට. හොඳ දෙයක් නොවේ. රුපියල් ලක්ෂ **6**ක සීමාවේ තිබූ ත්‍රීවීල් රථයක් රුපියල් ලක්ෂ **9-10**ත් අතර මිලකට, එනම් **80%**කින් මිල වැඩිවුනා ඉදිරියේදී ඉතා උග්‍ර ත්‍රීවීල් හිඟයක්, විශේෂයෙන්ම කොළඹ, එන්න පුළුවන්. මෙයින් වෙන්නේ රටේ ආර්ථික වර්ධනය තදින් අඩාල වීමයි. ඒ වගේම ත්‍රීවීල් ගාස්තුත් ඉහල යයි.

359. අද අපි විදේශ බැංකුවලට, දේශීය බැංකුවලට ඔක්කොම ගත්තොත් ඩොලර් බිලියන 60ට කිට්ටුවෙන්න ණයයි හෝ ඊටත් වැඩියි. ධනවත් ඕස්ත්‍රේලියාවත් ලෝකෙට ණය ඩොලර් බිලියන 100ට අඩුයි. පහුගිය දවස්වල ඔක්කොම සෙල්ලම් දැම්මේ ඔය ගත්ත ණය වලින්. මේවා ගෙවන්න පරම්පරා කියක් යයිද? මැතිණී 77 රට බාර දෙනකොට විදේශ ණය ඩොලර් 0යි.

360. 2015/16 (මුල) අතර පමණක් අප ඇමරිකන් ඩොලර් බිලියන 6ක පමණ විදේශ ණය අරං තියෙනවා කියලයි කියන්නේ. තව ඉදිරියට ගන්න යනවා, විශේෂයෙන්ම කලින් ගත්ත ණය වල පොලී ගෙවන්න.

361. ඔය බිලියන ගණන් ණය අරගෙනත් උද්ධමනය පහතට ආවේ නැනේ, වැඩි වුනා මිසක්. රැකියා විරහිත භාවයේත් අඩුවක් නැහැ.

362. උද්ධමනය මේ ඉහල යන ආකාරයට රුපියල් 10,000 නෝට්ටුත් ලඟදිම එන්න ඕන.

363. තිරිඟු අපේ රටේ ඇටයක් වත් වවන්නේ නැහැ. නමුත් පාන්පිටි වලින් හදන කෑම වලට අපි වහල් වෙලා. මේ නිසා අප බිලියන ගණන් වැය කරනවා තිරිඟු පිටි ආනයනය කිරීමට. සෑම ආපන ශාලාවකම තිබෙන්නේ තිරිඟු පිටි වලින් සෑදූ පාන් හෝ ඒ ආශ්‍රිත ආහාර. ඇයි අපේ රටේම වැවෙන සොයා, සෝගම්, මුන්, කවුපි, මෙනේරි,

කුරක්කන්, හාල් පිටි වලින් නිපදවන ආහාර, කඩවල පාන්/ෂෝර්ට් ඊට්ස් සෑදීම සඳහා භාවිතා නොකරන්නේ? ඇයි එවැනි දේශිය පිටිවර්ග වලින් සාදන කෑම කෑමට අප හොර? ඒ වගේමයි ඛනිජ තෙල් වලට අපේ තියෙන යටත් වීම. එක තෙල් බින්දුවක් නොනිපදවන අපි ඩොලර් බිලියන් ගණන් බලශක්ති ආනයන වෙනුවෙන් වැය කරනවා. මෙවන් ආර්ථික රාමුවක ඉඳගෙන රට පෝසත් කිරීම ඉතා අපහසුයි, අපනයන ආදායම බොහෝ සෙයින් වැඩි නොකර. නමුත්, කල හැකියි. සිංගප්පූරුව දිහා බලන්න.

364. අද තිරිඟු පිටි වලට අප තදින්ම ඇබ්බැහි වෙලා. මේක විදේශ අධිරාජ්‍ය වාදීන් යටතේ සිටි කාලයේ අප පුරුදු වූ දෙයක්. තිරිඟු ඇටයක් වත් හදන්නේ නැති මේ රටේ අපි මේ තරම් තිරිඟු වලට වහල් වීම ඉතාම නරක දෙයක්.

365. රටේ රාජ්‍ය නායකයා අඩු තරමින් මසකට දෙවරක්වත් රටේ පිළිගත් රූපවාහිනි මාධ්‍යයක් තුලින් සම්මුඛ සාකච්චාවකට, රටේ ප්‍රශ්න පිළිබඳව, තදින් ප්‍රශ්ණ කිරීමකට බඳුන් කල යුතුයි. මාධ්‍ය කිහිපයක් එකවර ගෙනල්ලා ‘හාඩ් ටෝක්’ සම්මුඛ සාකච්චා කරන්න බැහැ. එක් එඩිතර මාධ්‍යවේදියෙක් සමඟ රාජ්‍ය නායකයා ‘හාඩ් ටෝක්’ සම්මුඛ සාකච්චාවන්ට එන්න ඕනා.

366. ඇත්තම කියනවනම් කරන්න තිබුනේ ගාල්ල වරාය ලොකු කරලා, හොඳ මාර්කටින් කැම්පේන්ස් කරලා ජාත්‍යන්තර මුහුදේ යන නැව් එහාට ගන්න බලන්න.

මොකද හම්බන්තොටට වැඩිය ගාල්ල, දවසකට නැව් **1,000**ට වඩා ගමන් කරන ජාත්‍යන්තර දක්ෂිණ මුහුදු මාර්ගයට හුහක් ළඟයි. සිංගප්පූරුව, හොංකොං වගේ රටවලින් නැව් බිස්නස් කඩලා අපට ගන්නවා කියන්නේ ලේසි පහසු දෙයක් නොවෙයි; හැබයි කරන්න පුළුවන්. ගාල්ල කියන්නේ රජ කාලේ ඉඳන් තිබ්බ වරායක්. පෘතුගීසි යාත්‍රා **9**ත් මුලින්ම ගොඩ බැස්සේ ගාල්ල වරායට (පෘතුගීසින් එන්න පරම්පරා දෙකක කාල පරිච්ඡේදයකට පෙර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සිය පරෙවි සංදේශයේ **84**වැනි කවියෙන් ගාලු පුරය වර්ණනා කර තිබුනේ එහි 'සාප්පුවල මුතු, මැණික්, රත්තරන් ප්‍රදර්ශනයට තබා තිබූ අයුරින් කෙනෙකුට සිතෙනුයේ මුළු මහත් මුහුදු පත්ලම හරා ඇද්දෝයි' කියායි).

367. ලොකු ලොකු වෘතීන් මහජන සුභ සෙත පතා රෙගුලාසි පනවා, මනා ලෙස සැලසුම් සහගත කිරීමට රජයන් බයයි. මොකද ඒ වෘර්තීන් සතු අධි බලසම්පන්න භාවය නිසා. මේ අඩුපාඩුව නිසා තැලෙන්නේ අහිංසක ජනතාව.

368. එංගලන්තය, ඕස්ත්‍රේලියාව, ඇමෙරිකාව වගේ රටවල වෛද්‍ය, නීති වැනි ක්ෂේත්‍රවල යෙදීමට ඉඩ දෙන්නේ වාර්ෂිකව නිකුත් කරන බලපත්‍රයක් මතයි. බලපත්‍රය දීමට පෙර රක්ෂණයක් ලබා පෙන්වීම අත්‍යාවශ්‍යයි. නව බලපත්‍රයක් දෙන්නේ එම වසර තුල

වැඩිදුර අධ්‍යාපනය ලැබූ බව පෙන්වන සාක්ෂි ඉදිරිපත් කලොත් පමණයි. මේ ක්ෂේත්‍රයන්හි නව දියුණුවීම්, වෘතිකයන් මුහුණ පාන ප්‍රායෝගික ගැටළු ආදිය මේ නොකඩවා ලබන අධ්‍යාපනය නිසා ලැබෙනවා. ලංකාවේ මේ කිසිවක් නැහැ; වාර්ෂික බලපත්‍ර/රක්ෂණ කියා දෙයක් නැහැ. කොටින්ම බොහෝ වෛද්‍යවරු (විශේෂඥයන් නොවේ), නීතින්ඥයන් මුදල් ලබාගෙන රිසිට් පතක්වත් නිකුත් කරන්නේ නැහැ.

369. චැනල් ක්‍රමය හොඳයි, විශේෂඥය වෛද්‍යවරයෙක් ඉක්මනින් හම්බවෙනවා. ඒත්, තමන්ගේ එදිනෙදා දොස්තර (GP) විසින් නිර්දේශ කරලා, විශේෂඥය වෛද්‍යවරයා වෙත යොමු කරනවා වගේ නැහැ. GP මොනිටර් කරනවා නම් ලෙඩා තනිවෙන්නේ නැහැ, මොකද ලෙඩාගේ වෛද්‍ය වාර්ථා තියෙන්නේ GP ළඟ. සමහර ලෙඩ්ඩු වැරදි විශේෂඥය වෛද්‍යවරයෙක්ව චැනල් කරන්න පුළුවන්, තවත් ප්‍රශ්නයක් තමන්ගේ GPගෙන් පසුව අහන්න ආවහම වැඩක් නැහැ මොකද විශේෂඥය වෛද්‍යවරයා වෛද්‍ය වාර්තා GPට යවන්නේ නැහැ, එයා ළඟ තියාගන්නෙත් නැහැ; රෝගියා ළඟ තියෙන ටික පමණයි. සමහර රෝගීන් වෛද්‍ය වාර්තා නැති කරගන්නවා. GP කෙනෙක් ඉන්නවානම් සේරම එයාගේ ෆයිල් එකේ/කොම්පුටරයේ එක් රැස්ව තියෙනවා.

370. දොස්තර කඩ මෙන් අධ්‍යාපන කඩත් අද ප්‍රබල වෙළෙඳ ව්‍යාපාරයක්වෙලා. හිනා පිරුණු කටවල් සහිත දේශපාලනඥයින්ගේ පින්තූර සහිත බැනර් වගේ දැන් ටියුෂන් ගුරුවරුන්ගේ පින්තූර බැනර්වල වල ගසා 'ටියුෂන් කඩ' අවට ප්‍රදර්ශනය කරනවා.

371. මේ සමහර අයට ගුරු වෘත්තියේ යෙදෙන්න අවශ්‍ය මූලික සුදුසුකම් වත් නැහැ.

372. ටියුෂන් කඩ අද අධ්‍යාපනය මුළුමනින්ම වගේ වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කරලා. ඉස්සර මෙන් නොව සිංහල, ඉතිහාසය, බුද්ධාගම වැනි විෂයයන්ටත් අද අනිවාර්යයෙන්ම ටියුෂන් ගන්න වෙලා. ටියුෂන් පන්තිවලට රුපියල් දහස් ගණන් මාස්පතා ගෙවන්න ඕන. රජයේ/පුද්ගලික අංශයේ සේවයේ යෙදී සිටින මවුපියන්ට දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ටියුෂන් පංතිවලට මුළු පඩියම වගේ දිය කරනවා හැරෙන්නට එදා වේලවත් හරියට කන්නවත් නෑ.

373. විවධ දක්ෂතා පෙන්වූ ළමයින්ගේ රූප පාසැලෙන් පිටත විශාල බිල්බෝර්ඩ්, කට් අවුට් වල ගහලා ප්‍රදර්ශනය කරනවා, හරියට පොප් සංගීත ශිල්පීන් වගේ. මේවා නිසා ඒ ළමයින් දක්ෂතාව පෙන්වූ අධ්‍යාපන/ක්‍රීඩා කටයුත්ත පමණක් නොව අධ්‍යාත්මික දියුණුව පවා සමහරවිට අඩාල වෙන්න පුළුවන්. පාසැලේ අනිත් ළමයින්ට මේවායින් අසාධාරණ සිද්ධ වෙන්න පුළුවන්. ළමයින්ට ඒ අයගේ ළමා

විය අහිංසක ලෙස ගෙවන්න ඉඩ හැරිය යුතුයි. බොහෝ දක්ෂ ළමයි අනවශ්‍ය (බාල) ප්‍රසිද්ධියට කැමති නැහැ - තමන්ගේ කාමරය තුලට වී පොතක් පතක් බලා ඉන්න/කොම්පුටරයේ වැඩ කරන ළමයි. පාසැලේ/විදුහල්පති/ගුරුවරන්ගේ නම් පුම්බා ගැනීම සඳහා පාසැලේ ළමුන්ව වෙළඳ භාණ්ඩ කරගන්න හදනවනම් ඒ වාට ඉඩ දීම වැරදියි. මෙයින් වෙන්නේ ඒ හොඳ ළමයිනුත් තමන් වෙළඳ භාණ්ඩ බව ලෙසට සිතීමයට පුරුදු වීමයි.

374. පාසැල් වල අති විශිෂ්ට ප්‍රතිපල ගත් ළමුන්, පාසැල් ශිෂ්‍ය නායකයින්/නායිකාවන් සමහර දේශපාලනඥයින් කොළඹට ගෙන්වා ඒ අය වෙනුවෙන් තේ පැන් වගේ සාද පවත්වනවා. අනවශ්‍ය දේවල් මේවා. පාසැල් ළමුන්ට තියෙන්නේ පාසැලේ පාඩම්/බාහිර ක්‍රියා කටයුතු හොඳට කර හොඳ ශිෂ්‍යයන් වශයෙන් කාලය ගත කිරීම මිස දේශපාලනඥයින් හමුවීමට යාම නොවෙයි (ඒවාට කාලය පස්සේ එනවා). පාසැල් ළමුන් පුළුවන් තරම් දේශපාලනඥයින්ගෙන් ඈත් කර තබන තරමට හොඳයි.

375. දේශපාලනඥයින් විසින් අදක්ෂ, අසාර්ථක ළමුන් ගැන පුද්ගලිකවම සොයා බලා ඒ අයගේ අනාගතය හොඳ වෙන ක්‍රියාමාර්ග දෙමවුපියන් සහ දෙගුරුන් සමඟ සාකච්චා කර ක්‍රියාවට නඟනවා නම් එහි කිසි වරදක් නැහැ.

376. **10** සහ **12** වසර විභාග ඉතා හොඳින් පාස් වුනත් විශ්වවිද්‍යාලයට නොතෙරුන තරුණ ළමයෙක් රජයේ හෝ

පෞද්ගලික අංශයේ රැකියාවක් සොයා ගැනීමට දරන ලද අනේක විධ උත්සාහයන් අසාර්ථක වීම නිසා (ඇගේ දෙමව්පියන්ට කිසිම දේශපාලනඥ සහායක් තිබුනේ නැහැ), ඇයව ඕස්ත්‍රේලියාවේ විශ්ව විද්‍යාලයක ඉගෙනුමට හැරියා (ඉතා අමාරුවෙන්). අපට 'එපාවූ' ඇය ඕස්ත්‍රේලියාවට කවදා හෝ ඉමහත් වාසි ගෙනෙන කෙනෙක් වෙනවා නොඅනුමානයි.

377. ගුණාත්මක හොඳ අධ්‍යාපනයක් ලැබූ, උ/පෙල ඉහළින්ම සමත් සිසුන්ට ප්‍රමිතිගත උසස් මට්ටමේ දේශීය පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයකින් වෛද්‍ය උපාධියක් ලබා ගැනීමේ හැකියාවක් තිබීම වරදක් නෙවෙයි. විදේශ විශ්වවිද්‍යාල වලින් වෛද්‍ය උපාධි ලබා ගත් අය අද රජයේ රෝහල්වල වෛද්‍යවරු හැටියට රැකියා කරනවා, අදාළ දේශීය වෛද්‍ය විභාග ද සමත්වීමෙන් අනතුරුව.

378. සයිටම් වහන්න කියන අය වැනලින් නවත්වන්න කියන්නත් ඕන.

379. ලෙඩාට 5ට එන්න කියලා වැනල් දොස්තර 7ට එනවානම් ඒවටත් කෑ ගහන්න ඕන.

380. දකුණේ තියෙන හොඳම බීච් එකක් නැතිකරලා නැව් අඩුවෙන් එන වරායක්, එතකොට වල්අලි, මොනරු, සිවල්ලු, වඳුරෝ ඉන්නා වටිනා කැලේ කපලා ප්ලේන්

අඩුවෙන් එන ගුවන් තොටුපොළක්, වසර ගනාවක් කොළඹ මැද, විහාරමහාදේවි උද්‍යානය අද්දර තිබු තිබුණු දර්ශනීය නොමැඩිස් ක්‍රිකට් තන නිල්ල සහ එතන තිබුන ගහ කොළ එතැනින් ඉවත් කරලා ඔපරා අඩු ඔපරා ශාලාවක්, අලි ඉන්න රුස්ස මහා කැලේ කපලා තියෙන ජාත්‍යාන්තර ක්‍රිකට් පිටි මදිවට තවත් අලුත් එකක් (මේ මහින් දඹුල්ල වහලා දාලා වගේ තත්ත්වයක්); මේවා හදනවාට වැඩිය ප්‍රයෝජනවත් නැද්ද ඔය ගත්ත විදේශ ණය වලින් අඩුම තරමින් මිනිස්සුන්ට සුවපහසුව ඇතුව යන්න අළුත් බස් ටිකක්, අළුත් කෝච්චි පෙට්ටි ටිකක් අරන් දැම්මනං. දිනපතාම මොන තරම් දුකක් විදිනවද කියලා දන්නේ ඒ බස්, කෝච්චි වල පොඩිවී, තෙරපී යන මිනිස්සු පමණයි.

381. **1940/50** ගණන් වල යුරෝපීය රටවල කොළඹ නගරය හැඳින්වුයේ උද්‍යාන නගරය (garden city) යනුවෙන්. එදා කොළඹ තිබු ක්‍රීඩා පිටි වලින් **30%** පමණ අපි අද නැති කරගෙන ඒ තැන්වල ‘කොන්ක්‍රීට් වනාන්තර’ හදලා.

382. එදා, හවසට තරුණයෝ එකතුවී ෆුට් බෝල් ගහපු හයිඩ් පිටියත් (දැන් නම වෙනස් කරලා) මේ ලඟදි තවත් පුංචි කරලා නැවත හදලා තියෙනවා දැක්කා. දැන් එතන තියන්න පුලුවන් දේශපාලන මිටීම් පමණයි වගේ.

383. තවමත් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන්නේ දැනට වසර 100 පමණ සිට ඕලන්දයේ සිට ගෙන්වන දුම්රිය ටිකත් පතයි. අධික මිලක් ගෙවා මේ ටිකට් පත් කඩදාසි ඕලන්දයෙන් ගෙන්වා ගන්නේ. මේ පරිගණක අවධියේ ටිකට්පතක් කොම්පුටරය මඟින් එවලේම නිකුත් කරන වැඩ පිළිවෙලක් සැකසුවොත් නරකද, මුදල් විශාල ප්‍රමානයක් මේ රටේ ඉතිරි වෙනවා නේද? හොඳ පරිගණක දැනුමක් ඇති පාසැල් සිසුවෙක් උනත් අවශ්‍ය ‘සොෆ්ට්වෙයාර්’ එක නිපදවලා දෙයි.

384. දැන් වසර 40ක් විතර ඉඳලා කියනවා අපේ රටේ කෝච්චි විදුලිබලය මඟින් ක්‍රියා කරන්න හදනවා කියලා. මේ අතින් ඉන්දියාව, බංග්ලාදේශය අපට වඩා ගොඩාක් දුර ගිහින්. ඔය අධිවේග වලට යට කල මහා ධන ස්කන්ධය කෝච්චි විදුලි බලයෙන් දුවන්න යෙදෙව්වා නම් ඩීසල් සඳහා යන විශාල වියදම ඉතිරිකර ගන්න ලැබෙනවා පමණක් නොවෙයි පරිසර දූෂණය අඩු, මීට වේගයෙන් යන දුම්රිය සේවයක් අපට ලබා ගන්න තිබුනා.

385. සමහර රජයේ කාර්යාල තවමත් වැඩ කරන්නේ අතින් ලියන පොත්/ලෙජර්/ටයිප් රයිටර් වලින්. මේවාත් එක්ක ලොකු දුරක් යන්න බැහැ - 20 වැනි ශත වර්ෂයේ තාක්ෂණය දැන් හරියන්නේ නැහැ. නිලධාරින් නව තාක්ෂණය දන්නේ නැහැ කියන එක පිළිගන්න අමාරුයි. මොකද බොහෝ ඒ අය ගෙදර ගියාම තමන්ගේ කොම්පුටරයෙන් වැඩ කරනවා.

386. ජපානය වැනි දියුණු රටවල අද විශ්ව විද්‍යාල වල සියලු අධ්‍යාපන කටයුතු ලැප්ටොප් පරිගණකයේ මිස කඩදාසි වල සටහන් කරන්නේ නැහැ. විශ්ව විද්‍යාල නිබන්ධන පරිගණකයෙන් කරනවා පමණක් නොව ඒවා ඉදිරිපත් කරන්නේද අන්තර්ජාලය හරහා මිසක් ගුරුවරයාට මුහුණ දීලා නොවෙයි. හොඳ වුණත් නරක වුණත් මේක තමයි ලෝකයේ අනාගතය; අපිත් මේවාට පුරුදු වෙන්න ඕන. ඉන්දියාවේ සෑම පාසැල් සිසුවෙකුටම ලැප්ටොප් පරිගණයක් ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙනවා.

387. සමහරු කියනවා ණය ගත්තහම මොකද, ණය දෙන අය ඉන්නවනම් කියලා. දැනටමත් අපේ ආදායමින් බහුතරය යන්නේ අප ගත් ණය අධි පොලී සහිතව ආපසු ගෙවන්න. VAT 11% සිට 15% දක්වා වැඩි කරන්න උනෙත් මේ නිසායි කියා කියනවා. අපේ ආදායමට වඩා වියදම වැඩියි, ඒ කියන්නේ ණය ආපසු ගෙවා ගන්න බැහැ; තවත් ණය නොගෙන. එනම්, රට 'බංකලොත්' වීමක්. ඕනෑම දේක සීමාවක් තියෙනවා, ණය ගැනීමෙත් එහෙමයි. අපේ ඉදිරි පරම්පරා කියක් උකසට තියලාද අපි මේ ණය ගන්නේ?

388. දැන් දිගට හරහට IMF එකෙන් US$ බිලියන 1.5 වගේ ණය ගන්නවා. ඒ නිසා ඒ ගොල්ල කියන විදියට රටේ ආර්ථිකය හසුරවන්න වෙනවා. අභිංසක දුප්පතාගේ තියෙන

සහනාධාරයත් කපන්න කියලයි ඒ අය බොහෝ වෙලාවට අපට කියන්නේ.

389. රටක ලොකුම සහා මහා පරිමානයේ මත් කුඩු ගෙන්වන්නෝ, මත්පැන් නිෂ්පාදකයෝ, මත්පැන් විකුනන්නෝ, කප්පන් මුදලාලිලා, ඉඩම් මංකොල්ල කාරයෝ, අයුක්ති සහගත ඩිල් කාරයෝ, ජනතාව පැහැර ගෙන යන්නන් ඒ රටේ සමහර මැති ඇමතිවරු ඇතුළු දේශපාලනඥයන් නම් ඒ රටට දෙයියන්ගේම පිහිටයි.

390. තිතට මත යටතේ, ඌව පළාත් සභාව තුල පමණක් බාර් ලය්සන් 33ක් දීලා තියෙනවා. බොහෝමයක්ම දීලා තියෙන්නේ පාර්ලිමේන්තු සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට.

391. ඇත්තෙන්ම තමන්ගේ සහෝදර රට වැසියන්ට තම බාර් මඟින් බොන්න දීලා මුදල් හම්බ කර ගන්න දේශපාලනඥයන්ට තම චන්ද දායකයන්ගේ මුහුණ නැවත බැලිය හැකිද? ඒ අයගේ බාර් හින්ද මිනිස්සු බේබද්දෝ වෙනවා - රෝගීන් වෙනවා. දරු පවුල් පිටින් පවුල් ආගාධයට යනවා. පවුලේ පරිහානිය ලඟා කර දෙනවා කියන්නේ රටේත් පරිහානිය.

392. දක්ෂ, මහන්සි වී වැඩ කරන ජනතාව සොය සොයා ඔවුන් නගා සිටුවීමට, උඩට ඒමට අත දීම/ අවස්ථා සලසා දීම, රජයක් විසින් කල යුතු දෙයක්. ඒ වගේම සමාජයේ

ඉතාම අසරණ, අහිංසක ජන කොටස් වෙත සහණ ලබාදීමද රජයක පරම වගකීමක්, සහ යුතුකමක්.

393. කුමන විධියේ සහ මට්ටමේ වංචා, දූෂණ, පාගා, නීති විරෝධී කොමිස්, අයථා පත්වීම් සහ වෙනත් හොර සහ සදාචාර විරෝධී වැඩ වලට අනුබල දෙන හෝ ඒවා දැක දැක ඇස් පියා සිටින රජයක් මඟින් කිසිදාක ඒ රටේ උපරිම සංවර්ධනයක් බලාපොරත්තු වෙන්න බැහැ.

394. වංචාවට, හොරකමට හිත ගිය කෙනා යන්න බලන්නේ ඒ පාරෙමයි. ඒ අයව වෙනස් කරන්න, හදන්න හරිම අමාරුයි. ඒ අය රටට විතරක් නොවේ තම ඥාති, හිත මිතුරනුත් පාවා දෙයි, අයථා ක්‍රම මඟින් මුදල් උපයීමට. රට බෙදන්න හදන ත්‍රස්තවාදීයෙක් එක්ක උනත් ගනුදෙනු කරයි, අයථා විධියට මුදල් උපයන්න පුළුවන් නම්.

395. හොරකම් කරන නිලධාරියෙකුට හොරකමක් විභාග කරන්න දුන්නොත් ඒ අය ඒ හොරකම බරපතල වරදක් හැටියට සලකන්නේ නැහැ. මොකද ඒ අයත් හොරකම් කරන නිසා, වෙනත් හොරකමකුත් සුළු දෙයක් හැටියටයි ඔවුනට පෙන්නේ.

396. අනුන්ට හොරා හොරා කිය කියා රට පුරා යන සමහර අය එහෙම කියන්නේ තමන්ගේ හොරකම් වහගන්නයි. පික්

පොකට්කාරයා පැනල දුවන්නෙත් හොරෙක් හොරෙක් කිය කියානේ.

397. අදත් අපේ රටේ දිගටම රාජ්‍ය යාන්ත්‍රනය තුල හොරකම්, දූෂණය, වංචාව, අපරිපාලනය, අකාර්යක්ෂමතාවය රජකරන්නේ සමාජයේ ඒ දේවල් වැරදියයි කියන, තදින්ම ප්‍රතික්ෂේප කර ඒ පිළිබඳව හඬක් නොනැගීම නිසායි. අපේ රටේ තදින්ම ඒ දේවල් ප්‍රත්ක්ෂේප කරන සංඛ්‍යාව 25%ක් පමණ වෙන බව පේනවා; නමුත් දියුණු රටවල එය 90%ක් පමණ වෙනවා.

398. අපේ රටේ බොහෝ දෙනෙක් හිතන්නේ/කියන්නේ, 'ඕවා වැරදි දේවල් තමයි, හැබැයි නවත්තන්න බැහැ' කියලා (එහෙම කියන බොහොම අය අවස්ථාව ආවහම ඒ දේම කරනවා (උදාහරණයක් ලෙස, පගාව දීම (ගැනීම නොවේ). මෙයට හේතුව වැරදි දේ කිරීම අද තදින්ම සමාජය තුල නිදන්ගත වෙලා හින්දා.

399. අපේ මාධ්‍යය දැන් දියුණුයි. නමුත්, බොහෝ විට හොරකම්, දූෂණය, වංචාව, අපරිපාලනය, අකාර්යක්ෂමතාවය වැනි වැරදි දේ පිළිබඳව මාධ්‍යයන් විසින් කරන සටන් අවසානය තෙක් ගෙනියන්නේ නැහැ. බොහෝ විට සටන පටන් ගෙන අත් හැර දමනවා. මෙයට ප්‍රධාන හේතුවක් වන්නේ නොපෙනෙන දේශපාලන හස්ත

අපේ බොහෝ මාධ්‍යයන් හැසිරවීමයි/මාධ්‍යන්ට බලපෑම් කිරීමයි.

400. මාධ්‍යය ආයතන දෙස ඉතා තියුණු ලෙසින් සොයා බැලීමේදී පෙනී යන්නේ සමහර ඒවා ස්වාධීන බවට පෙන්වන්න හැදුවත්, එසේ නොවන බවය. ඒවා කිසියම් ගැතිවූ දේශපාලනමය මතයක්/ස්ථාවරයක් දරන බව කියන්න පුළුවන්.

401. ජනමාධ්‍යවේදීන් තම නිල නිවසට කැඳවලා ඉතා ඉහල මිල ගණන්වල මත්පැන් වලින් පිරුණු විශේෂ සාද සූදානම් කරන ඇමතිවරු ඉන්නවා. මේ වියදම් කරන්නේ මහජන මුදල්ද? මාධ්‍යවේදීන්ව ව්‍යංගාර්ථයෙන් තමන්ගේ සාක්කුවට දා ගැනීමක් නොවේද මේ?

402. දරුනු ත්‍රස්තවාදීන්ට (හිටපු) අපේ ජ්‍යෙෂ්ට SPලට පවා සැලියුට් ගහන්න වෙනවා නම් ඒ රටට දෙයියන්ගේම පිහිටයි.

403. අවංක ඇත්තම සිඟන්නන්ට, අන්ත අසරණ දුප්පතුන්ට නොමිලේ එක කෑම වේලක් හරි දිනපතා ලබාදෙන ක්‍රමයක් සකස් කරන්න ඕන.

404. සිඟන්නන්ට අපේ බොහෝ අය ලෝබ නැතුව, සල්ලි විසි කරනවා. ඒක හොඳයි. නමුත් ඇහුවහම කියන්නේ

හිඟන්නෝ බොරු කරන්නේ කියලා. ඇත්ත හිඟන්නන් බොහෝ ඉන්නවා.

405. දවල්ට පන්සල්, පල්ලි, කෝවිල් වල එළියේ මිනිස්සු /ගෑනු ඇන ගහගෙන බලන් ඉන්නවා කවුරුහරි ගෙනත් දෙන බත් පාර්සලය ගන්ඩ. දුර්වර්ණ, වෙහෙසුණු මුහුණු ඇති මොවුන්ගෙන් සමහරෙකු තුල හොඳින්ම බැලු විට පෙනී යනවා, විද්‍යාමාන වෙනවා, යටගියදවස ඒ අය විරාජමානව සිටි බවක්. මේ අය ගැන රාජ්‍ය මට්ටමින් සොයා බලන්න, පිළිසරණ වෙන්න කිසිවෙක් නොමැතිවීම ඉතා අභාග්‍යයක්.

406. අද සියලු දේශපාලනඥන්ට, උසස් රජයේ නිලධාරීන්ට නිල නිවාස/ රාජ්‍ය වාහන ලබාදෙන පිස්සුවක් තියෙනවා, පළාත් සභාවල පවා. කිසිම රටක නැති වරප්‍රසාද මේ අපේ දුප්පත් රටේ දේශපාලනඥයන්ට/උසස්ම නිලධාරීන්ට.

407. පදවිය අහිමි වූ පසුත් රාජ්‍ය වාහන/නිල නිවාස භාර නොදී ඒවා තමන් සතුව තියාගන්නා දේශපාලනඥයන් සිටින සහ අසුවූ පසු ඔවුනට විරුද්ධව නිතිය ක්‍රියාත්මක නොකරන එකම රට ශ්‍රී ලංකාවද?

408. රජයේ නිලධාරින් දැන් හොඳ වැටුප් ගන්නවා, නිරන්තර පඩි වැඩි කිරීම් මත. එකවර රුපියල් 10,000කින්

පඩි වැඩි කළා. ඒ හා සමාන්තරව ඒ අයගේ නිෂ්පාදකතාවය වැඩි උනාද? උකටලී භාවය නැති උනාද? තවමත් බොහෝ රජයේ ආයතන වල ටෙලිෆෝන් කෝල් එකක්වත් 'ආන්සර්' කරන්නේ නැහැ, 'ආන්සර්' කලත් විස්තර කියන්නේ නැහැ. නිලධාරින් අහිංසක මහජනයාට සේවය කිරීම නොව 'හයිරන්' පෙන්වන තැන් තියෙනවා, සමහර තැන් වල සේවය පතා එන ජනතාව රාජ්‍ය සේවා නිලධාරින් දකින්නේ කරදර කාරයෝ හැටියට. පඩි වැඩි නම් වංචා දූෂණ, අල්ලස්, තවදුරටත් කරන්න ඕන නැහැ. වෘත්තිය සමිති සමඟ රජය සම්මුති වලට එළඹෙන්න ඕන ඒ අය ඉල්ලන ප්‍රතිලාභ දෙන්න නම් නිෂ්පාදකතාවයේ, පලදායිතාවයේ දියුණුවීම් ඒ අය පෙන්වන බවට ('එන්ටර්ප්‍රයිස් බාර්ගේනින්').

409. අන්තිමටම ණය වෙලා, ණය බරින් අන්තයටම එරී, මිරිකී ඉන්න වෙලාවේ එක පාරම රජයේ සේවකයන්ගේ වැටුප, විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප රුපියල් 10,000කින් වැඩි කළා. දැන් මාසේ අන්තිමට පඩි ගෙවා ගන්නේ කොහොමද කියලා රජය ඔලුව කසනවා.

410. දරා ගන්න බැරි, වියදම් අධික රාජ්‍ය සේවය නඩත්තු කරන්න අහිංසක මිනිස්සුන්ගේ පරිප්පු, සීනි, පාන් ගෙඩියේ මිල වැඩි කරනවා.

411. අද රාජ්‍ය සේවකයයි, පෞද්ගලික අංශයේ සේවකයයි අතර වැටුප්, දීමනා, පහසුකම් ආදිය බැලුවහම විශාල විෂමතා තියෙනවා.

412. ප්‍රශ්නය තියෙන්නේ මොන සුදුසු කම් තිබුනත් රාජ්‍ය සේවයේ රැකියාවකට ඇතුළුවෙන්න යතුර තියෙන්නේ බොහොම වෙලාවට දේශපාලනඥයයා අතේ. මෙයින් වෙන්නේ නුසුදුසු අයට ඇතුලට යාමට හැකියාවත්, ඇතුලේ ඉන්න හොඳ අයවත් නරක් කිරීමට ඒ අයට ඇති හැකියාවත්ය.

413. කොච්චර පඩි වැඩි කලත් මදියි මදියි කියා උද්ඝෝෂණ කරනවා නම්, ඒකත් අසාධාරණයි.

414. මන්ත්‍රී චිට් එකෙන් රැකියා දෙන එක පුරුදු කලේ එක බලවත් ඇමති කෙනෙක් **1960** මුල් ගණන්වල, අද ඒ කුඩා පැලය මහා වෘක්ෂයක් බවට පත් වෙලා.

415. ශ්‍රී ලංකා මුහුදේ තෙල්/ගෑස් සම්පත් විශාල ලෙස තියෙනවා. මේවා නිකන් සල්ලි බවට පත් වන්නේ නැහැ. විශාල කැපකිරීමක් කරලා, මේවා සොයාගෙන, නිවැරදිව ජාත්‍යාන්තරයේ අලෙවි කරලා, රට පෝසත් කිරීම දක්ෂ රජයක කාර්යයක්. පෝසත් රටවල් පෝසත් වෙලා තියෙන්නේ එහෙමයි, නිකම් ඉඳලා නෙවෙයි. අවාසනාවකට වගේ දේශපාලනඥයන්ට අපේ තෙල්/ගෑස් සම්පත් මතක් වෙන්නේ චන්ද කාලෙට පමණයි. මිනිසුන්ට බොරු සිහින මවා මවා පෙන්වනවා, තියෙන සම්පත් වලින් මහඟු ඵල ප්‍රයෝජන ගන්නේ නැහැ.

416. ශ්‍රී ලංකා මුහුදේ තෙල්/ගෑස් සම්පත් ගොඩට ගෙන සල්ලි කර රට සමුර්ධිමත් කරන බව කිවේ 1970 ගණන් වල මුල් භාගයේ සිටයි. අදත් ඒ සින්දුවම ගහනවා, හැබැයි ක්‍රියාවට නංවා පෙන්වන්න පුළුවන් ජගතෙක් මේ වනතුරු ඇවිත් නෑ. මොකද, වසර ගනනාවක් කැපවීමෙන් යුතුව, ඒකාකාරිව, හොඳ බුද්ධියෙන් කල යුතු වැඩක්.

417. ලංකාවේ ඉතා වටිනා ඛනිජ සම්පත් තියෙනවා. මේවා හරියට 'ටැප්' කරලා ආර්ථිකය වර්ධනය නොකර ගැනීමයි වරද. පුල්මුඩේ වෙරළේ ඉල්මනයිට්, වයඹ පළාතේ මිනිරන්, මොණරාගල යකඩ, මන්නාරමේ ගෑස් සහ තෙල් උදාහරණ කිහිපයක් පමණයි.

418. වෙන්නප්පුව පැත්තේ වලවල් වලින් පෙට්‍රල් මතු වුනා, සොයා බැලීමක් කලේ නැහැ.

419. මන්ත්‍රිවරු පොලිසි වලට ඕඩර් දෙන එක පුරුදු කලේ සබරගමුව පැත්තේ හිටියේ තරමක් චන්ඩි පාහේ ප්‍රබල මන්ත්‍රිවරයෙක්ලු 1970 මැද ගණන් වල වගේ. අහිංසක පොලිස් නිලධාරින් මොන තරම් අසාධාරණ ස්ථාන මාරුවීම් වලට ලක් වෙන්න ඇද්ද, මන්ත්‍රී ඕඩර් පිලිනොපැදීම නිසා. මේවා තවමත් සිදු වෙනවා නේද?

420. මන්ත්‍රීට දඬ කොලයක් නීතියට අනුව ලියූ නිසා රාජකාරිය හරියට ඉටු කල, නමුත් සේවය අහිමි වූ පොලිස් කොස්තාපල් වරයෙක් හිටියා.

421. හොරකම් අද රටේ හැමතැනම, හැමවෙලාවකම. ජනතාවට තියෙන එකම පිළිසරණ පොලිසියයි. ඒ අයත් හොරු අල්ලන්න උනන්දු නැත්නම් ජනතාවට වෙන කාගේවත් සරණක් නැහැ.

422. ඇතැම් දේශපාලනඥයෝ/රාජ්‍ය නිලධාරින් අද දවසෙත් කැත නැතිව වංචා, අපරාධ, දූෂණ කරනවා. රාජකාරිය අවංකව, අව්‍යාජව කරන්නේ නැහැ. ඉතින් කොහොමද රටක් හැටියට ඉදිරියට යන්නේ?

423. ලෝකයේ රටවල් දියුණු තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඉදිරියට යද්දී අපි ශ්‍රී ලාංකිකයින් බොහෝ විට අඳුරටම ගමන් කරනවා දැකීම මහත් කනගාටුවක්.

424. මෙ 21 වෙනි ශත වර්ශයේත් තවම පොලිස් ස්ථානවල, රෝහල්වල, රජයේ කාර්යාලවල බොහොමයක් වැඩ කෙරෙන්නේ පරණ අතින් ලියන ක්‍රමයන් මඟින්. පරිගනක මඟින් වැඩ කරනවා දකින්න ලැබෙන්නේ කලාතුරකින්.

425. මෙයට මූලික හේතුවක් පාසල් වලින් පිටවෙන දරුවන්ට පරිගණක භාවිතය බැහැ. ඒ, පාසැල් වලට පරිගණක ලබා නොදීම සහ ඒ සම්බන්ධ පුහුණු ගුරුවරු නොසිටීම. ළමුන් අතර පරිගණක දැනුම වැඩි කිරීම සඳහා වූ හොඳ රාජ්‍ය ප්‍රතිපත්තියක් විය යුතුයි. විදුලියවත් නැති පාසල් තියෙද්දී පරිගණක ගැන මොන කතාද?

426. හැම හන්දියකම තමන්ගේ විශාල කට් අවුට්, බිල් බෝර්ඩ් ගහගන්න දේශපාලනඥයෝ (චන්දේ කාලෙනුත් පස්සේ) දැන ගන්න ඕන ඔය බලෙන් ලබා ගන්න හදන ප්‍රසිද්ධිය, තමන්ගේ තියෙන ප්‍රසිද්ධියත් නැති කර දානවා කියලා.

427. චන්දේ නොමැති කාලවලත් මන්ත්‍රීවරුගේ/ඇමතිවරුන්ගේ දැවැන්ත කට් අවුට් බිල්බෝර්ඩ්, බැනර් ගහලා තියෙනවා. බොහොමයක් ඒ අයට සුභ පතලා නැත්නම් ස්තුති කරලා. මහා විකාර තත්ත්වයක්. පරිසරය අපවිත්‍ර කිරීමක්. ඒ අයගේ අනුදැනුම නොමැතිව මිස මේවා වෙන්න බැහැ.

428. කටුනායක ගුවන් තොටුපොලෙන් එලියට එනකොටම ලොකු කට් අවුට් එකක් ගහන්න ඇත්තේ එම දේශපාලනඥයා නොදැනුවත්ව වෙන්න ඕන.

429. කන්න නැතිව හෝ කන්න හිඟ කම නිසා අනන්තවත් මිනිස්සු, ළමා ළපටි අපේ රටේ මැරිලා තියෙනවා, ඉදිරියටත් මැරෙයි. මේවා බොරු කියලා බැහැර කරනවා නම් එය එසේ මියගිය අයටත් කරන නිගාවක්. පොඩි දරුවෝ කිරි, පෝෂ්‍ය ආහාර නැතිව මන්ද බුද්ධික වෙලා අන්ත දුප්පත් පවුල්වල අදත් ඉන්නවා. මේ අය මුල්ලකට තල්ලුකිරිම නොව ඒ දෙස යථාර්තවාදීව බැලීමට/කථා කිරීමට අප එඩිතර විය යුතුයි.

430. කවදාවත් හිරවෙච්ච බස් එකක, කෝච්චියක යන්නේ නැති, ඩිෆෙන්ඩර්, පොලිස් රථ ආරක්ෂාව මත අනික් මිනිසුන් පැය ගණන් රස්තියාදු වෙන ට්‍රැෆික් ජෑම් වටෙන් පන්නාගෙන යන, බොඩි ගාඩ්ලා පිරිවරා ගත්, සාමාන්‍ය හෝටලයකින් නොව තරු පහේ හෝටල් වලින් පමණක් කෑම කන, කවදාවත් පොළකින්/සමුපකාරයකින් හෝ හෝ සිල්ලර කඩයකින් බඩු ගන්නේ නැති, මහා වැස්සේ වතුරෙන් බ්ලොක් වෙච්ච කානු තියෙන පාරවල කුඩ ඉහලාගෙන, ඇඳුම් දණහිස ළඟට නමාගෙන යන්නේ නැති දේශපාලනඥයෙකුට කවදාවත් මිනිස්සුන්ගේ දැවෙන ප්‍රශ්ණ ගැන අවබෝධයක් ගන්න බැහැ; ජනතාවගේ ප්‍රශ්ණ විසඳන මාර්ග ඒ අය දන්නේත් නැහැ.

431. කිසිම ආදායමක් නැති, අතේ සතේ නැති, එහෙත් ආත්ම ගෞරවය නිසා සිඟමන් යැදීමට අකමැති අය ඒමට සිටිනවා. ඔය බොරු වියදම්, වංචා, පාගා, අල්ලස්, රජයේ

වියදමින් යන බොරු විදේශ ගමන්, අනවශ්‍ය නිල වාහන/ නිල නිවාස, බොඩි ගාඩලා, සෙක්‍රටරිස්ලා, හොර අඹුවන්ට දෙන දේශපාලන පත්වීම් ආදිය නැවැත්වුවහොත් ලංකාවේ අන්ත දුප්පතුන් උදෙසා දියුණු රටවල මෙන් හෝ ඊටත් වඩා හොඳ ඩෝල් (රැකියා විරහිත දීමනා) ක්‍රමයක් සැකසිය හැකියි, ආබාධිතයන් සඳහා වූ ඉතා හොඳ සහනාධාර ක්‍රමයක් ඇති කල හැකියි.

432. අප රටේ කිසියම් වූ හොඳ සමාජ සුභ සාධන වැඩ පසුතලයක්/වැඩ පිළිවෙලවල් තියෙනවා, නමුත්, කිසිම ප්‍රතිලාභයක් නොලැබෙන අන්ත අසරණ දුගී දුප්පත් අය එමටයි අපේ රටේ. රාජ්‍ය නොවන සංවිධානද මේ අයට වඩාත් සංවිධානය වී පිහිට වීමට ඉදිරිපත් විය යුතුයි.

433. සමහර අය විශ්‍රාම වැටුප් දෙකක් ගන්නවා, නැතිවූ ස්වාමියා හෝ බිරිඳගේ එකත් සමඟ. මෙය අසාධාරණයි.

434. ඔය නව ගුවන් තොටුපොළවල්, වරායවල්, ක්‍රිකට් පිටි, ඔපරා හෝල්, හොඳ වැඩ වෙන්නත් පුළුවන්, නොවෙන්නත් පුළුවන්. නමුත් දැන්වත් කරන්න තියෙන්නේ ඒවා හරියට 'මාර්කට් කරලා' රජයට ඒවා මඟින් විදේශ සහ දේශීය විනිමය එන විධියට පාලනය කරන්න. දන්නේ නැත්නම් ඒවා සුදු අලි බවට පත්වෙනවා. උගත්, දක්ෂ අය ඒ කාර්යයන් සඳහා පත් කල යුතුයි.

435. 'මට මගේ ආධාර කරුවන්ට රක්ෂා දෙන්න පුළුවන් ඇමතිකමක් නෙවෙයි හම්බ වූනේ' කියා එක් ඇමතිවරයෙක් අඩාපාලි කියනවා. මේකෙන් මේ අය කියන්නේ රජයේ රැකියාවක් ලබා ගැනීමට නම් චන්ද කාලයේදී දේශපාලනඥයයෝ පස්සේ ගිහින් ඒ අයට වැඩ කිරීමයි අවශ්‍ය කියන එකයි; අධ්‍යාපනික සහ වෘත්තිය සුදුසකම් වෙනුවට.

436. සුදුස්සාට සුදුසු තැන්, රජයේ රැකියාවන් දීමේදී දිය යුතුයි.

437. උගතුන් කොන් කරන සමාජයකට අනාගතයක් නොමැත.

438. යුද්ධ අවසාන කාලේ අපේ යුධ හමුදාව ලෝකේ හොඳම යුධ හමුදාවයි. ලෝකේ හොඳම පොලිස් සේවය අපේ ලංකාවේ පොලිස් සේවය බවට පත් කරන්න අපහසු වන්නේ නැහැ. පොඩ්ඩක් සේවය තුල තියෙන නරක 'සංස්කෘතික' ගති, ලක්ෂණ ඉවත් කරගැනීමයි අවශ්‍ය. ලොකු, පොඩි නිලධාරීන් තුල හොඳ සේවයක් ඇතිකිරීමට ඇති කැපවීම, උවමනාව සහ බොහෝ දෙනා තුල ඇති හොඳ හිත ගැන නම් කිසිදු සැකයක් නැහැ.

439. සුළු සොරකම්, සුළු අපරාධ කියලා බැහැ; මුලටම ගොස්, කෙසේ හෝ අපරාධ කරුවන් අල්ලා දඩුවම් දෙන්න ඕන.

440. යහපාලනය කියන්නේ එක් අයහපත් පාලන ක්‍රමයක් ඉවත් කරලා තවත් අයහපත් පාලන ක්‍රමයක් ස්ථාපිත වීම නොවේ.

441. දේශපාලනඥයයන් රජයේ ආයතනවල රැකියා පත්වීම් දීම, වීට් නිකුත් කිරීම/ටෙලිෆෝන් පණිවිඩ දීම හෝ ඒ පිලිබඳව වෙනයම් බලපෑම් ඇති කිරීම සහමුලින්ම නතර කල යුතුයි.

442. රටේ ජනාධිපතිතුමා කොටුවේ ජනාධිපති මන්දිරයේ වාසය කල යුතුයි. රටේ අගමැතිතුමා අරලියගහ මන්දිරයේ වාසය කල යුතුයි. රාජ්‍ය ප්‍රධානී නිළ නිවෙස් හිතු මතේ වෙනස් කරන්න ගියොත් රාජ්‍ය යාන්ත්‍රණය පිළිබඳව ජනතාව තුල ඇති විශ්වාසය සහ ගෞරවය පළුදු විය හැකියි.

443. විවෘත තරඟ විභාගයකින් අනතුරුව රජයේ සේවයට සේවකයන් (පියන්ලා පවා) බඳවා ගත යුතුයි. පියන් කෙනෙකුට, අවම වශයෙන් OL හෝ සමත්ව සිටිය යුතුයි.

444. අවම තරමින් 25% කට පමණ වූ භූමි ප්‍රදේශයක් මේ රටේ එක් ජන කොටසකට එහි ඉඩමක් මිලදී ගෙන, නිවෙස් තනා තම පවුල් සමඟ ජීවත්වීමට නොහැකි නම්, එය ඔවුන්ට සිදු වන මහඟු අසාධාරණයකි.

445. රජයක් විසින් මිනිසුන් කිසිම ප්‍රදේශයක බලෙන් පදිංචි කල යුතු නැහැ. නමුත්, තම කැමැත්තෙන් කිසියම්

පලාතක ජීවත්වීමට යන අය වැලැක්වීමත් වැරදියි, විශේෂයෙන්ම වාසය කිරීමට සුදුසු ඉඩම් ඇති ප්‍රදේශ සොයා.

446. යුද්ධයෙන් පසු, 2010දී, උතුරේ අවතැන් වූ, දෙමළ කතා කරන, ඒ අයගේ පරම්පරා ගනණාවක් කලින් උතුරේ පදිංචිව සිටි, සිංහළ පවුල් 150ක් පමණ නියෝජනය කරන පිරිසක්, නැවත උතුරේ පදිංචි වීම සඳහා ඉඩම් ඉල්ලා මාස ගණනාවක් යාපනය (පරණ) දුම්රිය ස්ථානයේ කඳවුරු බැඳ ගෙන සිටියා. මන්ද, කලින් ඔවුන් සිටි ඉඩම් දැන් වෙනත් අය අල්ලාගෙන සිටින නිසා. කිසිම උදවු උපකාරයක් නොකළ රජය ඔවුන් ආපසු දකුණට යා යුතුයයි කිවා; ඒ සඳහා බස් ලබා දුන්නා. ඒ මිනිස්සු බොහෝ දෙනෙක් 'පරාජිතවී' නැවත දකුණට ආවා. උතුරේ නතර වූ අය අද ඉතා දුකසේ ජීවත් වෙනවා; සමහරු තවම ඉන්නේ ටකරං මඩු වල, එහෙම නැත්නම් බාගෙට බිත්ති බැන්ද ගෙවල් වල - රැකියාවක් වත් හරියට නොමැතිව. නැවත එන්න බලාගෙන දකුණට වී සිටින අය විශාල ගණනක්.

447. 1983 ජුලි කලබල අවධියේදී දහස් ගණනක් වූ උතුරේ සිංහලයෝ නාග විහාරයට කැඳවලා, එතනින් බස් වල සහ ලොරිවල දාලා දකුණට පිටත් කර හැරියා; ඒ අයගේ ආරක්ෂාවටය කියා. ඒ අයගෙන් ඉතා සුළු පිරිසකුයි නැවත යාපනයට දැන් පැමිණ සිටින්නේ. පසුගියදා යාපනයවිද්‍යාලයේ සිංහල සිසුන්ට පහර දීම උඩත්, එම විශ්ව විද්‍යාලයේ ඉන්න සිංහල සිසුන්ගේ ආරක්ෂාවට කියා

යාපනයෙන් ඒ අය ඉවත් කර, එම විශ්ව විද්‍යාලය සිංහල සිසුන්ගෙන් තොර එකක් බවට පත් වෙන්න බොහෝ දුරට ඉඩ තියෙනවා. මේ දේවලින් ජය ගන්නේ බෙදුම්වාදීන්.

448. අප රටේ ඉතාම දැවෙන ප්‍රශ්නයක් නම් වැසිකිලි අපද්‍රව්‍ය බැහැර වන ඩ්රේනේජ් පද්දති අඩුම තරමින් ප්‍රධාන් නගරවලවත් - ගාල්ල, ශ්‍රී ජයවර්ධන පුර, අනුරාධපුර, මහනුවර, ත්‍රිකුණාමලය, යාපනය, දෙහිවල ගල්කිස්ස වැනි ප්‍රදේශවල ඇති කිරීම අත්‍යාවශ්‍යයි. නිවාසවල වැසිකිලි වලවල් කැපීම වැසිකිලි අපද්‍රව්‍ය ප්‍රශ්නයට හොඳම විසඳුම නොවේ. බොහෝ ජල පෝෂිත, වතුර බොන ලිං මේවා නිසා අපයෝජනය වෙනවා. වර්ෂා කාලවල බොහෝ වැසිකිලි වලවල් උතුරා යනවා. සුද්දාට පින්සිදු වන්න කොළඹට අගනා ඩ්රේනේජ් පද්දතියක් තියෙනවා. කොලඹ වැසියෝ වැසිකිලි වලවල් කපන්න, ඒවා හිස් කරන්න දුක් කරදර වෙන්න ඕන නැහැ.

449. කොළඹ ඩ්රේනේජ් ක්‍රමය නිසා වැසිකිලිය සහ බොන ලිඳ බය නැතුව එක ළඟම තියා ගන්න පුළුවන්. ලිදේ වතුර වැසිකිලියෙන් අපවිත්‍ර වෙන්නේ නැහැ.

450. වලවල් කපන්නේ නැතුව ෆ්ලෂ් කලාම ටොයිලට් කසල ඩ්රනේජ ක්‍රමයට ගහ ගෙන යන ක්‍රමයක් හදනවනා නම් මිනිසුන්ට එය ඔය මෙගා පොලිස් 10ට වඩා වටිනවා. කලින් කීවාක් මෙන්, අඩු තරමින් ප්‍රධාන නගරවලවත්.

451. වැසිකිළි අපද්‍රව්‍ය ළිං වලට කාන්දුවීම නැවත්වීම ඉතා අපහසුයි, විශේෂයෙන්ම වර්ෂා කාලයේ. ගියාඩියා, ඊ කෝලයි බැක්ටීරියා වැසිකිළි අප ද්‍රව්‍යවල තිබෙනවා. මේවායින් මිනිසුන් ලෙඩ වෙනවා පමණක් නොව ඔවුන්ගේ ආයුෂ කෙටි වෙන්න පුළුවන්. සියලු බොන ළිං මේ බැක්ටීරියා සඳහා 'චෙක්' කර ක්ලෝරීන්/බ්ලීච් වැනි බැක්ටීරියා නාශක යොදා එම ළිං ජලය පිරිසිඳු කල යුතුයි. රජය උදවු කල යුතුයි.

452. වැසිකිළි හැරුනහම කුස්සිවල සින්ක් වලින් සහ නාන කාමරවල සින්ක්/ෂවර් වලින් එන අප ජලය, තවද වර්ෂා ජලය, කුස්සිවල ඝන අපද්‍රව්‍ය ආදිය නිවෙස් වලින් ඉවත දැමීම/බැහැර කිරීමට ක්‍රම වේද නොමැතිව මිනිසුන් අපමණ දුක් පීඩා විඳිනවා. අසල්වැසියන් නිරතුරුවම බහින් බස් වීම්/අඬ දඹර ඇති කරගන්නවා. මිනී මරාගෙන පවා ඇති. මේ ප්‍රශ්ණ නිසා විකුණා ගත නොහැකි බවට පත්ව ඇති වටිනා ඉඩම් බොහෝයි. ප්‍රාදේශීය සභා, නගර සහ මහා නගර සභා මේ දැවැන්ත ප්‍රශ්න වලට විසඳුම් සෙවීම සඳහා මීට වඩා උත්සුක විය යුතුයි. මේ ප්‍රශ්න බොහෝ නිවෙස් හිමියන්ට තනිව විසඳා ගන්න බැහැ. මේවා පළාත් පාලන ආයතන මඟින් විසඳිය යුතු ප්‍රශ්න - අප ද්‍රව්‍ය, පිරිසිඳු ජල පෝෂිත වලට මිශ්‍ර නොවී බැහැර වීම පිණිස සැලසුම් සහගත ලෙස බෝක්කු, අගල්, කානු කැපීම් පුද්ගලික ඉඩම් හිමියන්ට කරන්න පුළුවන් දේවල් නොවෙයි; රාජ්‍ය ආයතන වලට මිස.

453. ප්‍රධාන නගරවල ඩ්රේනේජ් පද්ධති ඇති කිරීමට රජයන් උත්සුක නොවන්නේ ඒවා දුෂ්කර මුදල් වියදම් ව්‍යාපෘති නිසා සහ චන්ද දිනීමට නම් කොන්ක්‍රීට් මාලිගා තනා පෙන්නිය යුතුය යන රැවටිලි කාර වූ ප්‍රතිපත්ති නිසා.

454. කුණු ගඳ ගහන මහජන වැසිකිලි, නගරවල අපද්‍රව්‍ය පිරි ඇළවල්, කානු, බෝක්කු, අපිරිසිඳු හෝටල්, බස්/දුම්රිය ආදිය අප 3 වැනි ලෝකයේ රටක් බවට සාක්ෂාත් කරන දේවල් කිහිපයක් පමණයි. කුණු ගඳ ගහන ස්ථාන අසල ජීවත්වන මිනිසුන් ඒ දුගඳ එක්ක ජීවත්වෙනවාට අමතරව බොහෝ ලෙඩ රෝග වලට ගොදුරු වෙනවා. කුඩා ළමුන් විශාල ලෙස රෝගී වෙනවා. රජයේ වටිනා මුදල් වැය කරන්න ඕනේ මේ වගේ දැවැන්ත ප්‍රශ්න විසදන්නයි. නැතුව, දේශපාලනඥයන්ට සමහරවිට තම පවුල, දැසි දැස්සෝ, හොර අඹුවන් පවා අරං ගුවන් යානවල 1වැනි පන්තියේ සිට අරං විදේශ සවාරි ගහන්න නෙවෙයි. මේවා ඉහලම මට්ටමෙන්, නායකත්වය ප්‍රයෝගිවකම පෙන්වීමෙන්, විසඳිය යුතු වූ බරපතල ප්‍රශ්ණ.

455. පාරේ ඉන්න, හිසට හෙවනක් නැති, හිඟන්නන්ට ඉන්න ‘නිවාස ගම්’, බඩගින්නේ ඉන්න ඒ අයට දවසට එක වේලක් හරි නොමිලේ දෙන ‘දිනපතා ආහාර දන්සැල්’ රජය මඟින් හෝ රජය මැදිහත්වී/ආධාර මත ස්වේච්ඡා ආයතනවලට කරන්න පුළුවන් දේවල්. අපේ රටේ මේ දේවල් කරන්න පුළුවන් ආර්ථික ශක්තියක් තියෙනවා, රටේ

ජනතාවට ලොකු ඕනා කමකුත් තියෙනවා. දේශපාලනඥයන් සහ උසස් රජයේ නිලධාරින් විසින් කරන වංචා, දූෂණ, නාස්ති, නිරපරාද වියදම් නැත්නම්.

456. බොහෝ වැහි වතුර කාණු වලට ගෙවල්වල ටෝයිලට් හරවා ඇති බව පේනවා. ඒ කාණු වලින් මිනිස් අපද්‍රව්‍ය ගඳ වහනය වන්නේ ඒ හෙයින්. මහජන සෞඛ්‍යය පරීක්ෂකවරු/පරිසර පොලිසිය මේවා සම්බන්ධව සොයා බැලිය යුතුයි.

457. යම් දවසක නල මඟින් ගෑස් ගෙවල් වලට සපයන ක්‍රමයක් සකස් කරන්න වෙනවා. හැමදාම සිලින්ඩර වලින් මේ වැඩේ කරන්න බැහැ. නමුත් ඉතා මිල අධික, වියදම් වැඩි ව්‍යාපෘතියක්.

458. සාධාරණ අරගල උදෙසා ස්ට්‍රයික් කලාට කමක් නැහැ, නමුත්, ඒ සහෝදරවරුත් සාධාරණ වෙන්න ඕන. රටත් ජනතාවත් ඇපයට තියන ස්ට්‍රයික් හොඳ නැහැ. ඒ වගේම රජයක් ස්ට්‍රයික් කාරයන්ට බය වෙලා සාධාරණ නොවන ඉල්ලීම් (අසධාරන පඩි වැඩි කිරීම්, සුබෝප භෝගී දීමනා) වැනි දේ දෙන්න ගියොත් ආර්ථිකයම කඩා වැටෙන්න පුළුවන්.

459. ඉවක් බවක් නැතිව සෞඛ්‍යය සේවාවේ විවිධ තරාතිරමේ අය ස්ට්‍රයික් කිරීම නිසා අහිංසක රෝගීන්

මියගොස් තිබෙනවා. එවැනි ස්ට්‍රයික් හුදු ආත්මාර්ථකාමී ක්‍රියා.

460. සැප වාහන (ඩියුටි ෆ්රී) අවශ්‍යයි කියා අහිංසක රෝගීන් අමතක කර සෞඛ්‍යය සේවකයන් වැඩ වර්ජනය කරනවානම් එය දුශ්ශිල ක්‍රියාවක්.

461. රටේ ඕනෑම තැනක ඕනෑම කෙනෙකුට ජීවත්වීමේ අයිතිය ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී තිබෙනවා.

462. ඉඩම්වලට හොර ඔප්පු ලිවීම මහා ව්‍යසනයක් වෙලා. ආර්ථිකයට මරු පහරක්. ඕස්ත්‍රේලියාවේ වගේ පරිගණකමය ඉඩම් හිමි බලපත්‍ර ක්‍රමයක් ලංකාවේ ඇති කිරීමට ඕස්ත්‍රේලියා රජය වරක් උදව් කිරිමට ඉදිරිපත් උනා. මුදලුත් වෙන්කර තැබුවා. එවැනි ක්‍රමයක් ඉතා අවශ්‍යයි, දැනට සිදුවෙන මහා පරිමාන ඉඩම් වංචා නැවත්වීමට. ඉල්ලුවොත් ඕස්ත්‍රේලියාව උදව් නොකරන එකක් නැහැ.

463. දැන් ඉඩම් විකුනන්නේ ගැනුම්කරුගේ නීතින්‍ඥයවරයා විසින් සාදන ඔප්පුවකින්. පාර්ශව දෙකටම නීතින්‍ඥයන් සිටිනවා නම් ගොඩාක් හොඳයි. දැන් ක්‍රමයේ ගොඩාක් අඩුපාඩු තියෙනවා. බොහෝ වෙලාවට ඔප්පුවේ ඉඩමට සඳහන් කරන තිබෙන සීමාවන් (පුද්ගලයන්ගේ නම්) පවා දැන් වෙනස් වෙලා.

464. බස්නාහිර පළාතේ ඉඩම් වලට නොර්වේ ආධාර මත පරිගණකයෙන් රජයෙන් නව ඉඩම් ඔප්පු නිකුත් කිරීමක් සිදු වුනා. හොඳ වැඩක්. මෙය නැවත පටන් ගත යුතුයි.

465. රටක සෞඛ්‍යය ඇමතිතුමෙක් ලෙඩ උනාම පිටරට රෝහලකට ප්‍රතිකාර ගන්න යනවානම් සමහරු ඒකෙන් එම රටේ සෞක්‍යය සේවය ගැන උපකල්පනයන් ඇති කරන්න පුළුවනි.

466. ලෝකෙන් හොඳම වෛද්‍යවරු/හෙදියෝ බිහිවුනේ අපේ රටෙන් කියලා ඒ දවස්වල කථා උනා; එංගලන්තය බලාගෙන හිටියේ අපේ වෛද්‍යවරු/හෙදියෝ බිලි බා ගන්න. දැන් ඕස්ත්‍රේලියාව ඒක කරනවා.

467. නිවාස ප්‍රශ්නය විසඳීමේ වැඩි බර පෞද්ගලික අංශය කරගහන්න ඕන. මේ සඳහා දැනට වඩා අඩු පොලියට නිවාස ණය නිවාස ඉදිකරන අයට ලබාදෙන්න ඕන. සිමෙන්ති, ලී, වානේ කම්බි වැනි නිවාස සෑදීමට අවශ්‍යම ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉතා අධිකයි, මේවායේ මිල අඩු කල යුතුයි.

468. අපේ කැලෑ කපා ස්වාභාවික පරිසරය සහ කාලගුණය වෙනස් කරනවාට වඩා හොඳයි අපට අවශ්‍ය ලී ප්‍රමාණයක් පිටරටින් ගෙන්වීම.

469. ඉස්සර දැව සංස්ථාවෙන් වනාන්තර අක්කරයක් කපනවා නම් කැලෑ දෙපාර්තමේන්තුවෙන් ඒ ගමන්ම අක්කර 2ක් වත් කැලේ වවනවා. අද?

470. විදේශිකයන්ට සින්නක්කර ඉඩම් මිලදී ගැනීමට ඉඩ දුන්නොත් ශ්‍රී ලංකාවාසීන්ට කොළඹ, ගාල්ල, මහනුවර වැනි මහ නගර ප්‍රදේශවලින් ඉඩමක් මිලදී ගන්න තියා ඒ ගැන හිතන්නවත් බැරි වේවි. මේවා ලෝකයේ බොහෝ රටවල නොකරන වැඩ.

471. උතුරු මැද පලාතෙන් පහලට රටේ ජනගහනය පැතිරීම තීව්‍ර වීම නිසා ඒ පළාත් 7 අද බොහෝ ජනාකීර්ණ වෙලා. ඉඩම් හිඟ වීම නිසා අද බොහෝ විට පවුලකට පර්චස් 7-10 වැනි ඉඩමක සිය නිවස හදා ගන්න වෙලා, ඉස්සර පර්චස් 25 -30න් නිවසක් සදා ගැනීමේ පුරුද්දට එදිරිව. පර්චස් 2න් ගෙයක් කොම්පඤ්ඤවිදියේත්, පර්චස් 1න් ගෙයක් බම්බලපිටියේත් හදා ගත් මහත්තයෙක් සහ නෝනා කෙනෙක් සිටියා.

472. සුවෙන්, සතුටින් සිය පවුල සමඟ ජීවත්වීමට කැමති කවුරුත් බලන්නේ ඉඩ කඩ තිබෙන ඉඩමක ගෙයක් හදා ගෙන, ගස් වැල්, පලතුරු ටිකක් එහි වවාගෙන, බල්ලෙක් පූසෙක් ඇතිකරගෙන, නිහඬ, නිසල, පරිසර හිතකාමී ජීවතයක් ගෙවීමටයි. මෙවැනි තත්ත්වයන් උදා කරදීම උදෙසා රාජ්‍ය ආයතන තම ප්‍රතිපත්ති සකස් කර ගත යුතුයි.

473. තමන්ගේ ජීවිතය පර්චස් 6 වගේ සුළු වපසරියකට කොටු වුනහම 'පුංචි පවුල රත්තරං' සංකල්පයත් ඉබේටම ක්‍රියාත්මක වෙලා.

474. නමුත්, අද පාර්ලිමේන්තුවල දේශපාලනඥයෝ වැඩි කාලයක් යොදවන්නේ තමන්ගේ පුද්ගලික අයිතිවාසිකම්/ලැබීම් ගැන, තම පක්ෂයේ තත්ත්වය නඟා සිටුවා ගැනීම වැනි වැඩ සඳහායි. පාර්ලිමේන්තුවල අඳුරු මුළු වල, කොරිඩෝර් වල, සමහරු දමන ඩීල් වලින් රටට කෙසේ වෙතත් ඒ දේශපාලනඥයන්ට නම් මහත් සෙතක් සැලසෙන බවයි කියන්නේ.

475. 2013/14 වසර තුලදී ඕස්ත්‍රේලියාව් පාර්ලිමේන්තුව පනත් 590ක් සමත් කර ගත්තා, ලංකාවේ?

476. මහා නගර වැසියන්ට නල මඟින් ගෑස්, ෆයිබර් ඔප්ටික් තාක්ෂණයෙන් අධි වේගී ඉන්ටර්නෙට් පහසුකම් දිය හැකි නම් ඉතා අගෙයි, එහෙත් මේවා කරන්න නම් රටක් ගොඩාක් පොහොසත් වෙන්න ඕනා. අපට එහෙම වෙන්න පුළුවන් හැකියාව සහ අවස්ථා තියෙනවා.

477. දියවන්නා පාර්ලිමේන්තු සභා වාරයක බොහෝ විට ඉන්නේ යන්තම් සන පූර්ණය ඉක්මවා යන මන්ත්‍රී සංඛ්‍යාවක්. මෙය හොඳ දෙයක් නොවෙයි. චීන නියෝජිත කණ්ඩායමකුත් මෙය මෑතකදී පෙන්වා දුන්නා. දියුණු

රටවල පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරු ඒ සභා ගැබේ නිතරම ඉන්නවා.

478. හරියට කලොත් අවුරුදු 7ක් ඇතුලත ලංකාව ධනවත් රටක් බවට පත් කරන්න හැකියි - සිංගප්පූරුව, දකුණු කොරියාව, තායිවානය වැනි සම තත්වයේ ධනවත් රටක් (මලයාසියාවට එහා). හැබැයි කැඳ හැලියක් වගේ 100ට වැඩි කැබිනෙට්ටුවක් තියාගත්තොත් එවැනි වැඩ කරන්න අමාරුයි.

479. 100ට එහා පැත්තේ කැබිනෙට් තියාගෙන රට පාලනය කරන්න ගියොත් විදේශීය ආයෝජකයෝ එන්නේ නැහැ. කවුරුත් දන්නවා එතකොට රජය කියන්නේ කැඳ හැලියක් කියලා.

480. වෙන රටවල් 20ක් පමණ කැබිනෙට්ටුවකින් පාලනය කරන්න පුළුවන් නම් ඇයි අපේ රටේ විතරක් බැරි?

481. පරාජය වූ දේශපාලනඥයන් විට් ක්‍රමයෙන් නැවත පාර්ලිමේන්තුවට පැමිණ ඇමතිකම් දැරීම ප්‍රජාතන්ත්‍රවාදී නොවේ.

482. ඔය විට් මන්ත්‍රී ක්‍රමය අහෝසි කරලා දාන්න ඕන. ප්‍රජාතන්ත්‍ර විරෝධියි.

483. සමහර දේශපාලනඥයන් හැමදාම ඇමතිලා, මොන පක්ෂය බලයට ආවත්. මහා පුදුම තත්ත්වයක්, ලංකාවේ පමණද මේ තත්ත්වය?

484. පාසලක සාමාන්‍ය දැනීම ප්‍රශ්නයක් තිබුනලු අද පාර්ලිමේන්තුවේ කොතරම් ඇමතිවරු ඉන්නවද කියලා. ලමයි 30දෙනා උත්තර 30ක් ලියල තියෙනවා. ටීචර් ඔක්කොටම හරි දැම්මලු. ඇයි කියලා ඇහුවහම කීවාලු කවුරුවත් හරි ගණන දන්නේ නැහැ කියලා.

485. අවුරුදු 20 ගණන් එක දිගට ඇමති පදවි, රජයේ උසස් නිලතල දරන අය ඉන්නවා. මේ තත්ත්වය හොඳ නැහැ. අලුත් අදහස් ඇති, නැවුම්, තරුණ දේශපාලනඥයන්, රාජ්‍ය නිලධාරින් ඉන්නවා, ඒ අයට ඇමති, උප ඇමති, ස්ථිර ලේකම් වැනි දොරවල් විවෘත කර දිය යුතුයි. වෙනස් වන ලෝකයේ තාක්ෂනය/ගෝලීයකරණය ආදිය පිළිබඳව හොඳින් දැනුම තිබෙන, නව පරපුරේ සිතුම් පැතුම් හඳුනන, අල්ලස්/දූෂණ විරෝධීන් උසස්, වැදගත් තනතුරු සඳහා පත් කල යුතුයි.

486. චන්දයකට පස්සේ විරුද්ධ පක්ෂයෙන් 'ගෙම්බෝ' වාගේ ආණ්ඩු පක්ෂයට පනින නව ප්‍රවනතාවක් ඇතිවී තිබෙනවා. මෙකට 'සැලුන් දොර' කියාත් කිවා. ඒසේ පනින්නේ තමන්ට ආවේනික වූ පැහැදිලි දේශපාලන ප්‍රත්පත්තියක් නොමැති අයයි. මැති, ඇමති, තානාන්තර

බලාගෙන; පුද්ගලික ලාභ ප්‍රයෝජනයට. තමන්ට චන්ද දීපු චන්දදායකයන්ට ගෞරව නොකිරීමක්.

487. මේ පැනිලි පනින අය පමණක් නොව ඒවාට අනුබල දෙන අයත් වැරදියි. ජනතාව තුල පක්ෂ දේශපාලනය, දේශපාලනඥයන් පිළිබඳව විශ්වාසය නැතිවී යනවා.

488. ශක්තිමත් ආණ්ඩුවක් තිබීම හොඳයි; නමුත්, ඒකට, සුළු බහුතරයක් තිබ්බත් ඇති. 20 – 30 ගණන් මන්ත්‍රීවරු 'බා ගන්න' ඕන නැහැ. ආණ්ඩුවක් කරන්න 2/3 බලය අවශ්‍යම නැහැ.

489. රජය නිවාස හද හදා ජනතාවට තැටියක තබා පිරිනැමීම නිවාස ප්‍රශ්නයට විසඳුම නෙවෙයි. එය හරියට හිල්වූ බාල්දියකට වතුර වක්කරනවා වගේ වැඩක්. එක නිවාස නැති පවුලකට නිවසක් පරිත්‍යාග කරන කොට තව නිවාස අහිමි පවුල් 10ක් අලුතෙන් ලියාපදිංචි වෙනවා. ඔය විධියට මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. අනික බොහෝ දුරට සුදුසුකම් නැති අයටයි පසුගිය කාලයේ නිවාස ලැබී තිබෙන්නේ කියලා බව දැනගන්න ලැබී තිබෙනවා. සහස්‍ර පුර ඉන්නවාලු නිවාස දෙක තුන අයිති අය එහිත් ෆ්ලැට් ලැබ්බව. දුප්පත්ම මිනිස්සු මඟ හැරෙනවා.

490. හැබැයි, නිකන් දෙන නිවාසයේ අගයක් නැහැ. නිවාස ලාභීන්ද විශාල අයුරින් ශ්‍රමයෙන් සහ මුදලින් දායක විය යුතුයි. මොකද මේවා මහජන මුදල් නිසා.

491. රජයක් නිකං ගෙවල් හදලා දෙන්න බාර ගත්තොත් ඒක හරියන වැඩක් නෙවෙයි. උසුලන්න පුළුවන් වියදමකුත් නොවෙයි, මතක තබා ගත යුතු වන්නේ රජයත් බොහෝ දුරට මේ වියදම් කරන්නේ අධි පොලියට ගත් විදේශ ණය.

492. එදා 1980 ගණන් වල 'ගම්උදා', 'උදාගම්'; මඟින් වරිච්චි/කටු මැටි ගහපු අයට ඒ අයගේ ඉඩමේම අලුත් ගෙවල් හදා දුන්නා, ඒක වෙනස්, හොඳයි.

493. මෝටර් රථ දෙකක හිමි කාරයෙක්, අති පොහොසත් මිනිහෙක් 'මුවදොර උයන' අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියේ, රජයේ ෆ්ලැට් එකක් ලබා ගෙන තියෙනවා කියලා කියනවා.

494. කල යුතු වන්නේ රජය විසින් නිවාස සාදා අඩු කුලියට නිවාස නැති, අඩු ආදායම් ලාභීන්ට කුලියට දෙන්න. වසර 7 – 10 ක් පමණ ගිය පසු ඒ අයට සාධාරණ මුදලට ඒ ගෙවල් මිලදී ගැනීමට සහනදායි ක්‍රමවේදයක් සකස් කරන්න.

495. කළයි කියා පෙන්වන්න සහ/හෝ ආවට ගියාට නිවාස ලබා දීමෙන් හෝ ලොකු සංකාාලේඛන පෙන්වා අප රටේ අද ඉතා උග්‍ර වූ නිවාස ප්‍රශ්නය විසඳිය නොහැකියි.

496. කලින් හැදූ ෆ්ලැට්වල තීන්ත ටිකක් තවරා තමන්ගේ රුව සමඟ ලොකු බෝඩ් ගහගෙන, අළුත් නිවාස සංකීර්ණයක් විවෘත කළා කියලා පෙන්වීම හුදු ජනතාව රැවටීමක් පමණයි.

497. සමහර, නැවත ප්‍රතිසංස්කරණය කල රජයේ ෆ්ලැට් වල එක ෆ්ලැට් එකකට වියදම් කරලා තියෙන්නේ ලක්ෂ 2ක් නැත්නම් 3ක්ලු , ඒත් ලක්ෂ 6 කට විතර බිල දාලා පෙන්නලා තියෙනවා කියලා ආරංචියි.

498. නගර සභා, මහා නගර සභා සහ රජයේ ආයතන උනත් පෝසත්, ධනවත් අය ඉන්න ප්‍රදේශවලට තමා වැඩියෙන් කරන්නේ. ඒවායේ පේමන්ට් 'පේව්' කරනවා, දවසකට දෙවරක් සමහර පැතිවල පාරවල් අතු ගානවා, කැඩිච්ච පාරවල් ඉක්මනට හදනවා, දිනපතා ලොරි වලින් කුණු එකතු කරනවා. දුප්පත් ප්‍රදේශවලට කුඩම්මාගේ සැලකිලි. හැමෝම වරිපනම් බදු ගෙවන්නෝ නොවෙම්ද?

499. කොළඹ නගරය දැන් ඉස්සරට (1990/2000) වඩා ලස්සනයි, ඒක බොහොම හොඳ දෙයක්. ඒත් කොළඹ දිළිඳු ප්‍රදේශ - තොටළඟ, මට්ටක්කුලිය, වනාතමුල්ල, කොටහේන, ග්‍රෑන්ඩ්පාස්, වනාතමුල්ල ගිහින් බලන්න අන්තිමයි. කිසි දියුණුවක් වෙලා නැහැ. කාණු ජරාවලින් පිරිලා, කුණු ගඳ ගහනවා. තැන තැන කුණු ගොඩ ගහලා. කාක්කෝ මේ කුණු අනිත් ප්‍රදේශවලට අරං යනවා.

500. අද කොළඹ නගරය පිරිසිඳුව තබා ගැනීමට අබාන්ස් සේවකයෝ ඉතා හොඳින් මහන්සිවී තම රාජකාරිය කරනවා. ඒ අයට අපගේ ප්‍රණාමය.

501. නාගරිකව ජීවත්වෙන දුප්පත් මිනිසුන්ගේ ගෙවල්, කඩ කඩලා මිනිස්සු ගහලා පන්නලා නව ව්‍යාපෘති කරනවා නම් ඒ මිනිස්සුන්ට ඒ නගරය තුලින්ම සාධාරණ වාසස්ථාන, කඩ කාමර ආදිය ලබා දිය යුතුයි. බැස්ටියන් පාරේ මිනිස්සුන්ගේ කඩ කඩලා එලවපු හැටි දැක්කාහම දුක හිතුනා, සමහර මිනිස්සු අවුරුදු 20ට වැඩිය එක ස්ථානයේ හිටපු අය. සමහර මිනිස්සු පාර මැද ඉඳලා එදා සාප කළා.

502. නගරවල පාරවල්, කඩ සාප්පු, බස්/කෝච්චි නැවතුම් පල වල් අපිරිසිඳු, අපවිත්‍ර නම් අපට ඒ ප්‍රදේශ සංචාරක පාරාදීස බවට පත් කරන්න බැහැ. කවුරුත් කැමති පිරිසිඳු, ලස්සණ පරිසරයකට යන්න.

503. අද ලෝක සංචාරක කර්මාන්තය ඉතාම තරඟකාරියි. ලොව රටවල් 200ක් පමණ තම රටට සංචාරකයන් ඇද්ද ගැනීමට කල හැකි බොහෝ දේ කරනවා. අනිත් රටවලට යන සංචාරකයන් ශ්‍රී ලංකාවට කඩලා ගන්න නම් අපේ යටිතල පහසුකම්, පිරිසිඳු කම මීට වඩා බොහෝ ගුණාත්මයෙන් වැඩි වෙන්න ඕන.

504. ලක්ෂ සංඛ්‍යාත ගණනින් විදේශ සංචාරකයන් මේ රටට ගෙන්වා ගැනීමට නම්, වරක් පැමිණි සංචාරකයන් නැවත නැවතත් ගෙන්වා ගත යුතුයි. අපේ ප්‍රධාන නගර වල පිරිසිඳු බව, ආපන ශාලා, වැසිකිළි වැනි පොදු පහසුකම්, මගී ප්‍රවාහන සේවා මීට වඩා බොහෝ දියුණු විය යුතුයි.

505. කොළඹ සහ වෙනත් ප්‍රසිද්ධ නගරවල තිබෙන ගරා වැටුණු සහ අබලන්වූ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර තීන්ත ගා නව එළියක් ලබා දෙනමෙන් ඒ ගොඩනැගිලි අයිතිකාරයන්ගෙන් රජයන් ඉල්වා සිටින්න ඕන.

506. කොළඹ සහ වෙනත් ප්‍රධාන නගරවල හොඳ, පිරිසිඳු වැසිකිළි පද්ධති පහුගිය දවස්වල ගොඩ නැගුනා, ගොඩාක් හොඳ දෙයක්. රුපියල් 10ක් වගේ මුදලක් දෙන්න වෙන උනත් එවැනි පහසුකම් ඇති කිරීම ඉතා වැදගත්. හිඟන්නෝ වගේ දුප්පත් මිනිස්සුන්ට නිකං ප්‍රසිද්ධ වැසිකිළි පාවිච්චි කිරීමට වවුචර් ක්‍රමයක් හදන්න ඕන, නැත්නම් ඔවුන් නගර කිලුටු කරනවාමයි. ස්වභාව ධර්මයාගෙන් එන අවශ්‍යතා මිනිසුන්ට තියෙන බව රජයන් අවබෝධ කර ගැනීම හොඳයි. සමහර නගර තාම තියෙනවා එකම පොදු වැසිකිළියක්වත් නැහැ. මිනිසුන් තමන්ගේ අවශ්‍යතා ඉටු කරගන්නේ කෙසේද, විශේෂයෙන්ම කාන්තාවන්? සමහර පොදු වැසිකිළි තිබෙන බව මිනිස්සු දන්නෙවත් නැහැ, අදාළ සඥ්යා, නාමපුවරු සවි කර නැති නිසා.

507. රුපියල් 10ක් අයකරන සමහර පොදු වැසිකිලි තියෙනවලු ඉතා අපිරිසිදු. ඒවාට හොඳ වැසිකිලි බලා ගන්නන් පත් කල යුතුයි.

508. බොහෝ දූරස්ථ කෝච්චි වල වැසිකිලි පහසුකම් තියෙනවා. නමුත් මගීන් සතුටින් වැසිකිලි පාවිච්චි කරන්නේ ඒවා පිරිසිදු නම් පමණි. උදාහරණයක් වශයෙන් කොළඹ - යාපනය ඉන්ටර්සිටි දුම්රිය - වැසිකිලි පහසුකම් ඉතා හොඳයි. නමුත්, සවස 430ට පමණ කොළඹින් පිටත්වෙන උඩරට මැණිකේ, කොළඹ - නුවර. දුම්රියේ නම් වැසිකිලි අන්තිමයි, මිනිස්සු ඒවාට යනවත් ඉතා අඩුයි.

509. සවස 730ට කොළඹ කොටුවෙන් පිටත්වෙනවා ගාල්ලට සිග්‍රසාමී දුම්රියක්. පිරිසිදු කමින් නම් අන්තිමයි. වැසිකිලි ළඟ අසුනක් ගෙන දිගටම ගාල්ල බලා ගියොත් ඒ මගියා රෝගියෙක් වේවි. ඒ දුම්රියේ සමහර අඳුරු මැදිරිවල ඇති මලකඩ කාපු ජනෙල් හරියට ඇර ගන්න වත් බැහැ.

510. යාපනයට කෝච්චියෙන් ලඟදි ගියා. එදා ශබ්ධ විකාශනයෙන්, සිංහලෙන්, කෝච්චිය පැමිණී බව නම් කිවුවේ නැහැ.

511. සීගිරිය මොන තරම් විශ්මිතද? සමහරු කියනවා ලොව 8වෙනි පුදුමය කියලා. මේ තරම් වැදගත්

නිර්මාණයක් අප රැක ගන්නවා මදි; මුළු ලොවටම කියන්න ඕන සිගිරිය ගැන.

512. සීගිරියේ බඹර ප්‍රශ්නය වහාම ස්ථිරසාර ලෙස විසඳිය යුතුයි. අද සිගිරිය තරමටම එහි බඹර ප්‍රශ්නය සමහර විදේශ සංචාරක වෙබ් ජාලාවලින් කථිකා වෙනවා. අපට හොඳ දෙයක් නොවෙයි.

513. අධික වැස්ස සමයක, මෑත කාලයේදී (1960 ගණන් වලදී), සීගිරියේ වතුර මල් ඉහලටම අහසේ නැඟ ක්‍රියාත්මක උනා කියලා ඕස්ත්‍රේලියාවේ පිලිප් ඇඩම්ස්, හිත මිතුරු ABC මාද්‍යය වේදියා, කිවා.

514. සීගිරියේ ගල මුදුනටත් එදා අප වතුර ගත්තා. අද, අපට ඉතා අගනා, වටිනා, වැහි වතුර ටික පාලනය කර ගන්න බැරිව, පරිස්සම් කර ගන්න බැරිව ඒවා කුඹුරු උඩින්, පාරවල් දිගේ, පුද්ගලික ඉඩම් උඩින් මහා පරිමාණයෙන් වාන් යවනවා.

515. ඉතා හොඳට පොලිෂ් කරපු, කාශ්‍යප රජුගේ මුහුණ බලන ගල් කන්නාඩිය තවම තියෙනවා සීගිරියේ.

516. එදා අනුරාධපුර රාජධානි සමයේ (මීට අවුරුදු 2500ට පමණ පෙර - බටහිර ශිෂ්ටාචාරයන් කොළ අතු ඇඳගෙන ගල් ගුහාවල සිටි අවධියේ), අපේ නිවෙස්වල ජල මුද්‍රිත

වැසිකිලි තිබුනා, නිවෙස්වල නාන්න වතුර මල් තිබුනා. නගර දිනපතා ජල බට මගින් සේවකයින් විසින් පැමිණ පවිත්‍ර කළා.

517. පිරමිඩ් වලටත් වඩා උසයි අපේ සමහර ඉපැරණි චෛත්‍යයන්. මේවා ගැන, අපේ ඉපැරණි, උසස් ශිෂ්ටාචාරය ගැන ලෝ වැසියන් දන්නවා මදි.

518. අපේ අනුරාධපුර ශිෂ්ටාචාරය, හයිඩ්‍රෝලික් වාරිමාර්ග තාක්ෂනය, පොළොන්නරුවේ ගල් විහාරය සහ අනෙක් නටඹුන් විශේෂයෙන්ම වටදාගේ, අවුකන සහ සමාධි බුදු පිළිම, විවිධ අගනා පොකුණු, මිසරයේ පිරමිඩ් ශිෂ්ටාචාරය තරම් හෝ ඊටත් වඩා උසස් සහ දියුණුයි. මේවා ජාත්‍යාන්තරව මිට වඩා ‘මාර්කට්’ කරන්න ඕන. මුළු ලොවම ඇවිල්ලා මේවා බලන්න ඕන. ලෝවැසියන් පුදුමයෙන් පුදුමයට පත් වේවි.

519. මිගමුවට කියන්නේ පුංචි රෝමය කියලා. සංචාරක පාරාදීසයක් කරන්න පුළුවන් ප්‍රදේශයක්. ලුවිස් ප්ලේස් අවට ප්‍රදේශයේ ඇති කැතිඩ්‍රල් වැනි දැවැන්ත කතෝලික පල්ලි දකින සංචාරකයන් විශ්මිත වෙනවා. මේවා ලොව පුරා දැන ගන්න සලස්වන්න ඕන.

520. මිගමුව කලපුව, ලෙල්ලම පැත්තේ ගිහිල්ල බලන්න. පාලම උඩ වැනි තැන් කුණු ගඳ ගහන ප්‍රදේශ. යාපනයේ

කලපුව ඉතා හොඳින් නඩත්තු කර තිබෙනවා. කුණු පොදක් නැහැ.

521. තිතක් වැනි පුංචි ලංකාව ඇමරිකාව, බටහිර , චීනය , ඉන්දියාව, දකුණු අප්‍රිකාව හෝ ලෝකයේ කිසිම රටක ගැත්තෙක් නොවී සියලු රටවල් සමඟ සාමයෙන්, සහයෝගයෙන් සතුටින් සිට සැමගෙන් උදව් ගෙන, අපේ ආර්ථිකය හදා ගන්න ඕනේ.

522. ඇමරිකාව, එංගලන්තය, රුසියාව මේ සැම රටකම කිල්ලෝටවල හුණු තියෙනවා. ඕවා අපට හදන්න/ඉවත් කරන්න බැහැ. අපට විරුද්ධව ආ ජාත්‍යාන්තර කුමන්ත්‍රණ නවත්තා ගන්නේ නැතුව ඒවා අවුල් කරගත්තේ අපි. නිකං රටවල් තරහා කරගත්තා.

523. චීනය නමැති කූඩයට පමණක් සියලු බිජු (බිත්තර) දමාගෙන රට දියුණු කිරීමට තැත් කිරීම අනුවන කමක්. චීනය ඓතිහාසිකව අපට සිටින ඉතාම හොඳ කළණ මිතුරෙක්. චීනය ඉදිරියේදීත් අපේ හොඳම මිතුරෙක්. එකේ කිසි සැකයක් නැහැ. සැම රටකින්ම උපරිම සහය ගන්න ඕන, අඩුම තරමින් අමනාපකම් ඇති නොකර සිටීමට තරම් ප්‍රවේශම් වෙන්න ඕන. පසුගිය කාලවල එවැන්නක් සිදු වුනේ නැහැ.

524. ඉන්දියාවේ ඉන්න බිලියන 1.2 ජනගහනයට භාණ්ඩ සහ සේවා සපයලාම අපට ධනවත් රටක් වෙන්න පුළුවන්; මේක ඉන්දියාවට අප රට පාවාදීමක් හෝ අවනත වීමක් නොවේ, අපේ රට පෝසත් කරන බුද්ධිමත් ආර්ථික වැඩපිලිවලේ කොටසක්. මේකට කියන්නේ 'ලංකාව ඉන්දියාවේ හොංකොං' විය යුතුයි කියලයි. ඉන්දියාව පාවිච්චි කරලා අපි පෝසත් වෙනවා, හරියට චීනය පාවිච්චි කරලා හොංකොං පෝසත් උනා වගේ. එහි කිසි වරදක් නැහැ.

525. ඉන්දියාවේ බිලියන 1.2 ජනගහනයක් ඉන්නවා. මේ අය තදින්ම තේ බොන අය. ඒ වගේම, අපේ රටේ වගේ නොවෙයි, ඉන්දියාවේ හොඳ, විශිෂ්ට තත්ත්වයේ තේ නිෂ්පාදනය වෙන්නේ නැහැ. හරියට කථා කරලා ඉන්දියාවට අපේ රටෙන් තේ සපයන්න අවස්ථා උදා කරගත්තොත් එය ඩොලර් බිලියන් ගණනක ව්‍යාපාරයක් ඇති කරගන්න පුළුවන්.

526. ඉන්දියාව අපේ රට තුල ඒ අයගේ භාණ්ඩ වලින් 'ෆ්ලඩ් කරාවි, ඒක නතර කරන්න අමාරුයි. දැනටමත් ඒ දේ වෙනවා. අපිත් අපට පුළුවන් භාණ්ඩ වලින් ඉන්දියාව 'ෆ්ලඩ්' කරන්න ඕන. අපට අපනයන භාණ්ඩ වර්ග නැතිකමයි/අඩුකමයි තියෙන ලොකුම ප්‍රශ්නය. අපේ ඉන්දියාවට යවන අපනයන භාණ්ඩ වැඩි කරගන්න ඕන.

දැනට යවන ප්‍රධාන භාණ්ඩය ප්‍රති අපනයන කල ඉන්දුනීසියා පුවක් නේද?

527. ඉන්දීය සේවකයන් මෙහි ගෙනවිත් ඔවුනට රැකියා ලබා දීම, විශේෂයෙන්ම කම්කරු රැකියා, අප රටේ අයට රැකියා අවස්ථා අහිමි වීමක්.

528. සාර්ථක ආණ්ඩුවක් සඳහා නම් ආණ්ඩුවේ තනතුරු සඳහා පත් කරන අය ඉස්තරම්ම, වඩාත්ම සුදුසු, උගත් අය විය යුතුයි. වැඩක් කරන්න හරියට බැරි, වන්ධිභට්ටකම ප්‍රධාන තේරීම් සාධකය ලෙස පත්වීම් සඳහා සලකයි නම්, ඒ රජයේ කටයුතු අසාර්ථක වීම නිසා අයහපත් ප්‍රතිපල, විපාක විඳින්නේ අහිංසක ජනතාවයි.

529. නුසුදුස්සන් රජයේ සේවයට පත් කලොත් (තරාතිරම විභාග නොතියා, හුදු දේශපාලනඥයන්ගේ ලැයිස්තුවකට අනුව), අපට ලැබෙන්නේ අදක්ෂ, අකාර්යක්ෂම, උකටලී රාජ්‍ය සේවයක්.

530. දේශපාලනඥයන් තම කාර්ය මණ්ඩලයට පවුලේ අය පත් කරගැනීම, තමන් යටතේ ඇති අමාත්‍යාංශවලට එවැනි පත්වීම් කරගැනීම නව සංකල්පයක්, මෙය ඉතා වැරදි දෙයක්. හොරකමට තෝතැන්නක්.

531. ඉතා කදිම කොස්ගම අවි ගබඩාව වත් රැක ගන්න අපට බැරි වුනා. අපේ නොසලිකිල්මත් බව නිසා වටිනා අවි ගබඩාව, එහි ගබඩා කර තිබු  වටිනා අවි සමඟ අළු දූවිලි බවට පත් වුනා. ඔයිට කලින් විදූලි බල මණ්ඩලයේ වටිනා ට්‍රාන්ස්ෆෝමර් ආදිය නොසලිකිල්මත් බව නිසා විනාශ කර ගත්තා.

532. සාලාව ගින්නෙන් විනාශවුනු උණ්ඩ හා පතරොම් වල වටිනාකම රුපියල් බිලියන 18 කට අධික බව කියනවා. කිසි උසස් නිලධාරියෙක් ඉල්ලා අස් වුණේවත් නැහැ නේද?

533. නඩු කල් යාම විශාල් ප්‍රශ්නයක්. පවත්නා නීති ක්‍රමය, පාර්ශව උකටලිතතා සහ උවමනාවෙන්ම නඩු කල් යවා ගැනීමට යොදා ගන්නා විවිධ උපක්‍රම මේ සඳහා හේතු සාධක වෙනවා. දුක් විඳින්නේ අහිංසක, නඩුවට සම්බන්ධ වුවෝයි.

534. ලෝකයේ සමහර රටවල් තියෙනවා මාස ගණන්, සමහරවිට අවුරුදු ගණන් වහින්නේ නැති. නමුත් අපේ මේ පින්බර දිවයිනට ඕන තරම් වහිනවා, විශේෂයෙන්ම තෙත් කලාපයට. වැරැද්ද, මේ වැටෙන මහා ජල කන්දරාව සුරක්ෂිත කර ගන්න අප දන්නේ නැහැ, ඒ ගැන හිතන්නේ නැහැ.

535. අපේ මේ පින්බර රට අධි වර්ෂාව ලැබෙන රටක්. තෙත් කලාපයට ලැබෙන වර්ෂාව ලෝකයේ ඉහලම වර්ෂා පතනයක්. සමහර විට සති මාස ගණන් අහස කඩා වැටෙන්න වහිනවා. නමුත් ඊට මාස කිහිපයකට පස්සේ නියන් කාලය අවාහම කුඹුරු මැරෙනවා, වතුර/ලයට් කපනවා. මේ අපට ලැබෙන මහා වැසි ජල කඳ වියලි කාලයේ ප්‍රයෝජනයට ගැනීමට සුරක්ෂා කර ගත යුතුයි. අලුතින් වැව්, ජලාශ, පොකුණු හදා ගන්න ඕන; වැඩි වතුර බැහැලා යන මනා ක්‍රම වේද සමඟ. කොළඹ උනත් එහම කලොත් කොච්චර අමතර සිසිලසකුත් ලැබේද?

536. දියුණු රටවල හැම ගෙදරකම වැසි ජලය ගබඩා කරන ටැංකි තියෙනවා. ඒ ජලය වත්තේ වැඩවලට, ලෝන්ඩරි, වැසිකිලි, වාහනය සෝදන්න වගේ දේවලට පාවිච්චි කරනවා. වැස්ස අඩු ඕස්ත්‍රේලියාවේ සමහර ගෙවල් වල ලීටර් 2000, 5000 වගේ ලොකු වැසි ජල ටැංකි තියෙනව, මෝටර සවි කරපු.

537. ලෝකයේ වියලිම මහාද්වීපය වන ඕස්ත්‍රේලියාවේ සමහර ප්‍රදේශවලට අවුරුද්දකට වත් වහින්නේ නැහැ. වැස්ස නැතුව වගාවන් පාලු වෙලා, මිනිස්සු අතහැර දමා ගිය ප්‍රදේශ තියෙනවා. බුද්ධිමත්ව වැඩ කරන රටක් නිසා මරේ ඩාර්ලින් ගංගාව, වැස්ස නැතත් ඒ අය මරා නොගෙන රැක ගත්තා. ඒ අය එය සජීවීව තියාගෙන තියෙනවා; තදබල නීති පැනවීම සහ ඒවා අකුරට ක්‍රියාත්මක කිරීම මඟින්.

538. වැව් වල වතුර අඩු කාලෙට අපට තියෙන ඒ අගනා වැව්වල රොන්මඩ ඉවත් කරලා, බැකෝ වලින් හොඳට හාරලා, හොඳට වැව් බැමි බැඳලා, ඇල වේලි හරියට හදා ගෙන, අපේ වාරි පද්ධතිය හදා ගන්නවා නම් ඔය වාන් දානවා කියලා මහා ජල කඳන් පාරවල්, ඉඩම්, පැසුණු කුඹුරු හරහා ඉවත් කිරීම නතර කරන්න පුළුවන්. අහසින් ලැබෙන සෑම දිය බින්දුවක්ම සංරක්ෂණය කර ප්‍රයෝජනයට ගන්න පුළුවන්. 2000 මුල, එක් දේශපාලන පක්ෂයක් ආණ්ඩුවේ කොටසක්ව ඉන්න කාලේ මේ පිළිබඳව ඉතා හොඳට වැඩ කළා, විශේෂයෙන්ම රජරට ප්‍රදේශවල.

539. නිතරම වාන් දමන වැව් වඩා විශාල කර, දැනට තිබෙනවාට වඩා දෙගුණයක් උනත් විශාල කර ගන්න බලන්න ඕන. පුද්ගලික ඉඩම් උනත් මේ සඳහා පවරා ගන්න වෙනවනම් කරන්න දෙයක් නැහැ. රජ කාලේ විශාල වැව් හැදුවා නම් නවීන යන්ත්‍ර සූත්‍ර තිබෙන මේ කාලයේ ඕවා සුළු දේවල්.

540. වටිනා වැහි වතුර ගලා ගෙන යාමට වැව්වල වාන් දොරටු ඇරලා දානවනම්, ඒ වැව් වලින් ඇති පලය කීම? ගංවතුර ඉවරවෙලා, ආයි මාස 3-4 කින් වැව් හිදිලා, නියං ආවා කියලා කෑ මොර දෙන්නෙත් අපිම නේද?

541. වැව් වේල්ල කැඩී වැවේ වතුර ගලලා මිනිස් ජීවිත සහ දේපල බේරා ගැනීමට වැවේ වතුර වාන් දම්මනවා.

නමුත් ඒ වාන් දාන වතුර නිසාත් නිවාස, කුඹුරු, වාහන, හරකා බාන විනාශ වෙනවා. හැම වසරකම හෝ වසර කිහිපයකට වරක් වත් තදින් ගංවතුර ගලනවානම් ඒවාට පිළියම් සොයා දීම රජයන්ගී වගකීමයි. 100%ක්ම බැරි වුනත් විශාල ප්‍රමාණයෙන් ගංවතුර හානි අවම කර ගැනීමට ක්‍රම වේද තියෙනවා.

542. ගංවතුර කාලෙට ඒ ප්‍රදේශවල ටෝයිලට් වලවල් බොහොමයක් උතුරා යනවා. මෙයින් සිදුවෙන අයහපත් සෞඛ්‍යාරක්ෂණය අති මහත්. කොළඹට නැතත් බොහෝ ප්‍රධාන නගරවලට මේ ප්‍රශ්ණය තදින්ම බලපානවා. ඩ්රේනේජ් පද්ධතියක තියෙන වටිනාකම මෙයින් පැහැදිලි වෙනවා (කොළඹ).

543. ගං වතුර තත්වයන්ගෙන් පසු එය බලපෑ ප්‍රදේශවල විශාල වශයෙන් තැන තැන කැලි කසල එක් රැස් වී තිබෙනවා. තදින් දුගඳ පැතිරෙනවා. මේ හේතුවෙන් එම ප්‍රදේශයන් මිහිපිට අපායන් බවට පත් වෙනවා. ඉතාම දැඩි දුර්ගන්ධයක් හමා යනවා. මිනිසුන් විශේෂයෙන්ම වයෝවෘධ අය සහ කුඩා ළමුන් ලෙඩ වෙන්න පුළුවන්.

544. ගංවතුර/නාය යාම් නිසා විනාශ වෙන්නේ ඒ ගෙදර තිබුන ඇඳන්, මෙට්ට, tv, ෆ්‍රිජ්, රයිස් කුකර්, වොෂින් මෙෂින්, වාහන, මහන මැෂින්,පොත් පත්, ලිපි ලේඛන, සහතික පත්, ෆොටෝ ඇල්බම් පමණක් නොවේ, ඒ පවුලේ අයගේ

'ආත්මයමත්' ඒ සමඟ විනාශ වෙනවා. ගංවතුර/නාය යාම් පීඩාවෙන් අත් විඳී කෙනෙක් තමා දන්නේ මොන තරම් දුකක්ද, සාපයක්ද ගංවතුර අරන් එන්නේ කියා.

545. තදින් වහින කාලෙට එන බිහිසුනු ප්‍රශ්නයක් තමා නාය යාම. කඳු මුදුන් වල ගස් කැපීම, කඳු බෑවුම් වල පාංශු ඛාදනයට එරෙහිවූ ක්‍රම වේද සකස් නොකිරීම සමහරක් නාය යාමේ ප්‍රශ්ණවලට හේතු. කලින් නාය යාමට බඳුන් නොවූ ඉඩම් පවා අද අළුතින් නාය යාමේ තර්ජනයට ලක්ව තිබෙනවා. ප්‍රශ්නයේ අඩු වීමක් නොවෙයි වැඩි වීමකුයි තියෙන්නේ. තව කොපමණ වටිනා ජීවිත අනාගතයේදී නැතිවී යයිද?

546. අරණායක නාය යාමෙන් මිනිසුන් 110ක් මිය ගියා, කුඩා දරුවෝ 22ක් ඇතුළුව. නාය යාමේ කාරකයන් හැටියට ඒ අහිංසකයන් කිසිම වැරදි දෙයක් කර තිබුනේ නැහැ; අනුන්ගේ වැරදි වැඩ නිසා ඒ අය සිය ජීවිත වලින් වන්දි ගෙවුවා.

547. සියළු සංවර්ධන යෝජනා ක්‍රම පරිසරයට, සොබා දහමට පමණක් නොව මානසික අධ්‍යාත්මයටත් එකඟව සිදුවිය යුතුයි. පහත් බිම් ගොඩ කරලා තට්ටු ගොඩනැගිලි හදනවා - 'ලක්ෂරි' මහල් නිවාස ඇතුළුව, හයිවේ කියලා වෙල් ගොඩකරලා පාරවල් හැදුවා. දැන් පොඩි වැස්සක් ආවත් ඒ වතුර ටික උරා ගන්න පොළොවක් නැහැ.

548. වැලිසර නාවික හමුදා කඳවුර ඉදිරිපිට තිබෙන පරාක්‍රම පාරේ නිවෙස් හිමියන් හමුවී බලන්න. කටුනායක අධිවේගය නිසා දැන් විශාල වැස්සක් වැස්සොත් ඒ අයගේ ගෙවල් වල වැඩිහිටියෙක්ගේ පපුව ළඟට වගේ වතුර පිරෙනවලු. ඉස්සර කිසි කරදරයක් තිබ්ලා නැහැ. මේ ප්‍රශ්න කියන්න/අහන්න කෙනෙක් නැහැ කියලයි ඒ අය කියන්නේ. රස්සාවට ගියත් කොයි වෙලෙත් බයෙන් ඉන්නේ වැහලා ගංවතුර ගෙට එයිද කියා එක් අහිංසක අම්මෙක් කිවා.

549. අපේ රටත්, පරිසරයත්, ජනතාවත් ගංවතුර, නාය යාම් වැනි අපදා වලින් නිදහස් කර ගන්න නම් රජය නිසි වැඩ පිළිවෙලක් සකස් කරලා; දැඩි නීති දාල අනවසරයෙන් පස් කපන (දේශපාලනඥයයෝ ඇතුළුව), ගල් කඩන, මැණික් ගරන, පහත් බිම් ගොඩ කරන, ගස් කපන මිනිසුන්ට අමතක නොවෙන දඬුවම් ලබා දෙන්න ඕන. අනුර කුමාර දිසානායක මහතා මේ පිළිබඳව යස කථාවක් කළා පාර්ලිමේන්තුවේ, **2016** මැයි **25** වෙනිදා.

550. පසුගිය කාලයේ පරාක්‍රම සමුද්‍රය එහා පැත්තේ, ඒ වගේම පහත දැක්වෙන වැව් වල ඉස්මත්තේ හැදුනු සුපිරි හෝටලවලට දේශපාලනඥයයෝ හෝ ඔවුන්ගේ ඥාතීන් ද සමහරවිට සම්බන්ධ බව කවුරුත් දන්නවා. මේවායින්

විශාල පරිසර හානි සිදු වුනා කියා කියනවා: කළාවැව, නාච්චියාදුව, තබ්බෝව, අග්බෝ, රිදියගම.

551. මෑත කාලයේ හැම වසරකම වගේ මිනිසුන් 100ට එහා මැරුණා නාය යාම් නිසා. මේ 21වෙනි ශත වර්ෂයේ කිසිසේත් නොවිය යුතු දෙයක්.

552. මෑතක සිට දන්සැල් ලියාපදිංචි කල යුතුයි කියා රජයෙන් නීතියක් පනවා තිබෙනවා. මෙයින් වෙසක්/පොසොන් සමයේ දන්සැල් සංඛ්‍යාව අඩු වෙලා. ආහාරවල පිරිසිඳුබව සහ සෞඛ්‍යසම්පන්න භාවය වැදගත් තමයි, නමුත්, වෙසක්/පොසොන් දන්සැල් කරන අය ඒ වැඩ කරන්නේ ඉතාම සත්භාවයෙන්, ආහාර/පාන වල පිරිසිඳු බව සහ සෞඛ්‍යායාරක්ෂිත භාවය පිලිබඳව ඒ අය කැප වෙලා වැඩ කරන්නේ. බොහෝ දන්සැල් කරන්නේ පාසැල්/දහම් පාසැල් සිසුන්, වෙනත් ගැටවරයන්, ත්‍රීවිල් රියදුරන් ආදීන්. මේ අයට රජයේ නිලධාරින් හමුවී දන්සැල් ලියාපදිංචි කරන්න ඕන කිවුවහම, ඒ අදහස අත්හැරලා දානවා. ඇරත් කවුද කැමති සත්භාවයෙන් කරන වැඩක් උනත් ගිහින් දඩ කන්න, දන්සැල ලියාපදිංචි කලේ නැහැ කියලා. බොහෝ දෙනෙක් දන්සැල් දමන තීරණය ගන්නේ අනිතිම මොහොතේ. එවිට ලියාපදිංචියට වටේ දුවන්න කාලයක් නැහැ.

553. වෙසක්/පොසොන් දන්සැල් අපේ සංස්කෘතියේ වැදගත් අංගයක්. මේවාට තද නීති දාලා හානි කරන්න/නැති කරලා දාන්න ඉඩ දෙන්න බැහැ.

554. කරන්න තියෙන්නේ නව ලයිසන් ක්‍රමයක් හඳුන්වා දීම නොවෙයි, දන්සැල් සඳහා අදාළ නීති රීති (සාධාරණ) පැහැදිලිව හඳුන්වා දුන් පත්‍රිකා ග්‍රාම සේවක කාර්යාල වල ප්‍රදර්ශනය කිරීමයි. පසුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ලවා දන්සැල් අහඹු ලෙස පරීක්ෂාවට යොමු කරවීමයි.

555. දැන් වෙසක් තොරණ හදන එකත් බෙහෙවින්ම අඩු වෙලා. පන්සල් වල පෙරහැර වලට අලි නැහැ. ඥානාන්විතව මේ ප්‍රශ්න දෙස බලා රජයන් අපේ මේ මගඟු සංස්කෘතිකමය දායාද රැක ගැනීමට ඉදිරියට ආ යුතුයි, විශේෂයෙන්ම, වෙසක්/පොසොන් තෝරන් සහ දන්සැල්.

556. අද පාරට බැස්සහම පෙනෙනවා අපේ රටේ මොනතරම් ආබාධිතයින් සංඛ්‍යාවක් ඉන්නවද කියලා. යුද්ධයට අමතරව හදිසි අනතුරු (වැඩියෙන්ම රිය අනතුරු) වලින් පිඩා විඳින අබාධිතයින් බොහෝයි. ඉඩක් ලැබුනොත් ඔවුනට කථා කරන්න, ඔවුන්ගේ කථා ශ්‍රවනය කරන්න.

557. අද කාලයේ ගෙදරින් එලියට බැස ගමනක් යන්න බය හිතෙනවා; ආපසු අනතුරක් නොවී ගෙදර එන්න ලැබේද කියලා. ඔබ හෝ මම සදාකල් අබාධිතයෙකු වී දුක් විඳීමේ සම්භාවිතාව, දියුණු රටවල් හා සැසඳීමේදී අපේ රටේ වැඩියි.

558. ශ්‍රමදාන කොච්චර හොඳ දෙයක් ද. ලංකාව ශ්‍රමදාන ලොවට හඳුවන්වා දුන් රටක්. මොන තරම් වැඩ කොටසක් ශ්‍රමදානෙන් කරන්න පුලුවන්ද. සෑම මසකම පලවෙනි හෝ අන්තිම ඉරිදා එම ගමේ/ නගරයේ 'ශ්‍රමදාන ඉරිදා' කරගන්න පුලුවන් නම්...

559. සුනාමි ඇවිත් විනාශ වෙච්ච බස්නැවතුම්, කෝච්චි පාරවල්, ගෙවල් දොරවල් එහෙම අප පොදුවේ වැඩ කරලා ඉතා ඉක්මනින් සෑහෙන දුරට යථා තත්වයට පත්කර ගත්තා. ඉතාම හොඳ කර්තව්‍යයක්.

560. **2016** මැයි දිනය දා පෙළපාලි උත්සවය අවසන් වී රැස්වීම් භූමිය ශුද්ධ පවිත්‍ර කිරීමේ ආදර්ශයක් එක් දේශපාලන පක්ෂයක් ක්‍රියාවෙන්ම පෙන්වූ බව මතක් වෙනවා.

561. දේශපාලනයට අති ප්‍රසිද්ධ, කීර්තිමත් නළුවෝ, ක්‍රීඩකයෝ, ගායකයෝ වැනි අයව ගේනවා. මේවා දේශපාලනඥයන් චන්ද දිනන්න කරන වැඩ. අර අහිංසක මිනිස්සු දේශපාලනයෙන් සමුගන්නේ තමා ගොඩනගාගත් හොඳ නමත් පළුදු කරගෙන. ඒ ඒ අංශ වලට දක්ෂ අය ඒවයින් ඉවත් වුනාට පසුවත් ඒ අංශම දියුණු කරන වැඩවල දිගටම යෙදෙන්න ඕන. ඒ ගොල්ලන්ට ඒ සඳහා දෙන්න පුළුවන් සහාය අති විශාලයි. පුහු දේශපාලනයම බදා ගන්න ඕන නැහැ.

562. සිනමාවේ නමාගත් අවිවාහක තරුණ දේශපාලනඥයෙක් අද දූෂණයට විරුද්ධව හොඳ සටනක් ගෙන යනවා. එතුමාගේ ගමනට සුභ පැතිය යුතුයි.

563. කැස්ත්‍රෝ බිහි කලා සමාජවාදී සමාජයක්. කියුබාව 'ප්‍රත්‍යක්ෂ' රටක් නොවෙයි. ඒත්, ඒ රටේ අනිත් රටවලට වඩා සමානාත්මතාවය, සාධාරණත්වය තියෙනවා කියනවා.

564. චියාන් කයි ෂෙක් තාය්වනයට 1949 යනකොට ඒ රට පැල්පත් ගුහාවක්. අද තාය්වානය?

565. ඉඩම් නඩුවක් නම් අවසානයේ තීන්දුව එනකොට නඩුව දාපු කෙනා සමහරවිට මියගිහින්.

566. ඒ කාලේ කොල්ලුපිටියේ ලිබර්ටි හෝල් එක පිටිපස්සේ පැල්පත් වත්තට කිවුවේ 'කොරියාව' කියලා. අද (දකුණු) කොරියාව කොහොමද? අපි ලක්ෂ ගණනින් එහේ වැඩට යනවා.

567. ආ ඒ ඕස්ත්‍රේලියාව, සිංගප්පුරුව නැත්නම් කොරියාව, අපි ඒ රටවල් තරම් දියුණු නැතත්, දකුණු ආසියාවේ සහ අප්‍රිකාවේ ගොඩක් රටවල් වලට වැඩිය අපි හොඳයි' කියලා කොයි දේටත් නිදහසට කරුණු ඉදිරිපත් කරන අය ඉන්නවා.' මේවා මෝඩ නිදහසට කරුණු.

568. අපට ඕස්ත්‍රේලියාව, සිංගප්පූරුව, කොරියාවටත් වඩා දියුණු වෙන්න බැරි මන්දැයි කියා හිතන්න/අහන්න පුළුවන් පිට කොන්දක් හදා ගන්න ඕන.

569. සිංගප්පූරුව, අපි වගේ නොවේ, කිසිම ස්වාභාවික් සම්පතක් නැති රටක්. දියුණු වීමට ප්‍රධාන හේතු: හොඳ නායකත්වය, දූෂණ/වංචා නොමැති වීම, රාජ්‍ය පාලනයට දේශපාලන ඇඟිලිගැසීම් නොමැතිවීම, හොඳ අධ්‍යාපන ක්‍රමය, සුදුස්සාට සුදුසු තැන් ලැබීම, මනා ආදායම් බදු ක්‍රමයක් තිබීම, වෙහෙස මහන්සි වී වැඩකරන මිනිසුන් සිටීම.

570. අපි සිංගප්පූරුව තරමට දියුණු වෙන්න ඉස්සෙල්ලා, මලයාසියාව තරමටවත් දියුණු වෙන්න ඕන. ඉනිමගේ ඉහලටම නගින්නේ පල්ලෙහා පඩි පසු කරලා.

# • කලාව/ක්‍රීඩා/සංස්කෘතිය

519. 60/70 දශකයේ පහළ වූ ශ්‍රේෂ්ට සංගීතඥයයන් අද කාලේ බිහි නොවීමට ප්‍රධාන හේතුවක් වන්නේ බොහොමයක් ගුවන් විදුලි සහ රූපවාහිනි නාලිකා විසින් තේරුමක් නැති,අප රටට ආවේනික නොවූ බොල් සංගීතයක් නගා සිටුවීමට කටයුතු කිරීමයි. සිංහල ඉංග්‍රීසි පටලවාගත්, බොහෝ විට වාචාල බස් දොඩවන නිවේදකයන් කිසිම වැදගත්කමක් හෝ ශාස්ත්‍රීය වටිනාකමක් නැති බොල් ගීතම ශ්‍රාවකයනට පුද කරත්. විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රය පුරා පැතිර ඇති මෙම දූර්භාග්‍යය වසංගතයක් සේ වැඩීවෙමින් වර්ධනය වෙමින් පවතී.

520. ගීතයක් ප්‍රචාරය කිරීමට අද ඇතැම් මාධ්‍ය ආයතන නිර්මාණකරුවන්ගෙන් මුදල් අයකරනවා. සල්ලි නොදෙන ප්‍රබුද්ධ ගායකයන්ගේ අලුත් ගීත ප්‍රචාරය නොකෙරෙන යුගයක් මේ.

521. රටේ ජාතික ගීය ලියූ රචකයා තාමාට සිදුවූ අසාධාරණය නිසා සියදිවි නසා ගත්තේ නම්, ඉන්දීය නොවන, අපේ රටටම ආවේනික වූ අපූරු සංගීතයක් නිර්මාණය කල අසහාය ගායකයාගේ ගීත වසර 20ට තරම ගුවන් විදුලියෙන් උවමනාවෙන්ම ප්‍රචාරය කිරීම නතර කලේ නම්, ජාතියක් වශයෙන් අප ලජ්ජා විය යුතුයි.

522. බාල ගීත වලට අද ඉන්න පරම්පරාව කැමති ඔවුන්ට ඔවුන්ගේ ප්‍රිය නාලිකා වලින් ඇහෙන්නේ බාල ගීත විතරක් නිසායි. විකල්ප හොඳ සංගීත ආශ්වාද මාර්ග ඔවුනට අඩුයි.

523. පැරණි හෝ නවීන, අනුන්ගේ ගීත තමන්ගේ ගීත හැටියට ගයා ලොවට පෙන්වන අය ප්‍රබුද්ධ ගායකයෝ විය නොහැකියි. 'මෙය අනුන්ගේ ගීතයක්' කියා පිළිගෙන ගීත ගයනවා නම් එහි වරදක් නැහැ.

524. බොහෝ ගායකයන් තමන්ගේ ගීතවල පෙරදිග සහ අපරදිග සංගීත භාණ්ඩ සම්මිශ්‍රණයක් කරනවා, එකේ වරදක් නැහැ. නමුත් මේ ගායකයන්ගේ සමහර ගීත තියෙනවා තනිකරම පෙරදිග සංගීත භාණ්ඩ පමණක් යොදා ගයපු (සිතාර්, එස්රාජ්, සර්පිනා, වයලින්, තබ්ලා වැනි), ඒ ගීත වඩාත්ම ලස්සනයි.

525. සමහර මිය ගිය ගායකයන්ගේ හොඳ ගීත සමහරු තමන්ගේම වගේ අයිතිකරගෙන. ඒ වගේම සමහර මියගිය ගායකයන්ගේ පවුලේ අය ඒ ගීත වෙන අයට ගයන්න දෙන්නෙම නැහැ. මේ දෙකම හොඳ නැහැ.

526. අපේ කලාකාරයන් වෙනුවෙන් හැදූ ටවර් හෝල් පදනම ඉතා හොඳයි. මෙය සාර්ථක, ශක්තිමත් පදනමක් කර ගත යුතුයි.

527. ජනප්‍රිය ගායක පියවරුන්ගේ ගීත ගායනා කරමින් ඔවුන්ගේ පුතුන් විශාල භූමිකාවක් ලංකාවේ පමණක් නොව ලොව පුරා සිටින ශ්‍රී ලාංකික ප්‍රජාව අතර කරනවා. ඔවුන්ට තම ප්‍රතිභාපූර්ණ පියවරුන්ගේ අසලකට වත් පැමිණිය නොහැකි බව සත්‍යයක් වුවත් ඔවුන්ගේ කාර්යය ඉතා අගය කල යුතුයි.

528. කරුණාරත්න අබේසේකර මහතාගේ ගී පැඹදුමේ දක්ෂතාවය පෙන්වන්න JA මිල්ටන් පෙරේරා මහතාගේ සින්දු ටිකම ඇතිලු.

529. එදා ජීවත්ව සිටියදී HR ජෝතිපාල මහතා තරම් අපහාසයට පත් කල වෙනත් ගායකයෙක් තවත් නොමැති තරම්. කොපි මාස්ටර් කියා නමකුත් දැම්මා. නමුත්, අද?

530. ශ්‍රී ලංකාවේ මොහම්මඩ් රාෆි - මොහිදීන් බෙග්

531. ශ්‍රී ලාංකේය බටහිර කණ්ඩායම් සංගීත ක්‍රමයක් නිර්මාණය කිරීමේ පුරෝගාමියෙක් ක්ලැරන්ස් විජේවර්ධන. ධර්මරත්න සහෝදරයෝ, ත්‍රී සිස්ටර්ස් ද මෙවැන්නට පාර කැපුවා.

532. ක්ලැරන්ස් 'දිලීප පොඩි පුතු' ලිවේ කරුණාරත්න අබේසේකරගේ පුත් දිලීප නිදන අයුරු දැකලා. 'කඳ සූරිඳුනි ඔබ' ගීතය රචනා කලේ ක්ලැරන්ස්ගේ මිතුරු ශ්‍රීකාන්ත දසනායක ගේ පියා, හිටපු ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යය **(1965)** LB දසනයාක මහතායි; ශ්‍රී කාන්තගේ අසනීපයක් සුව වීම වෙනුවෙන් කතරගම දෙවියන්ට වූ බාරයක් ඔප්පු කිරීමට - ක්ලැරන්ස් මේ ගීය ගයමින්/වයමින් කතරගම දේවාලය වටේ ගියා.

533. MS ප්‍රනාන්දුට බයිලා චක්‍රවර්ති කියන්නේ ඔහුගේ අති දක්ෂ බයිලා ගායනය නිසාම පමණක් නොවේ, ඒ බොහෝ බයිලා ඔහුම ප්‍රබන්ධ කර, සංගීතයද නිර්මාණය ද ඔහු විසින්ම කල නිසායි.

534. ෆ්‍රෙඩී සිල්වා මහතා අපට සිටි හොඳම විකට නළුවා පමණක් නොවේ, සිය ගීත වලින් කදිම, උපහාසාත්මක පණිවුඩයක් දුන් කෙනෙක්. ඔහුට සමාජය සැලකුවා මදි.

535. ෆ්‍රෙඩී සිල්වා මහතා හැමදාම ස්වයං නිර්මාණ පමණයි කලේකොපි කලේ නැහැ. ඔහුගේ 'කුන්ඩුමනි' ගීතය ඔහුගේ අනෙක් ගී මෙන් නොවේ, ප්‍රබුද්ධ ගීයක් කියා කියන්න පුළුවන්; එයින් කියන්නේ ශෝකී කථාවක්.

536. මැතකදී අභාවප්‍රාප්ත ඇන්ටන් ජෝන්ස් මහතා ගැයූ ගීත සියල්ල ලස්සනයි; ඔහුගේ රණවිරුවන් වෙනුවෙන් ගැයූ බයිලා කැසටය අන් සියල්ලටම වඩා අගනේයි.

537. මිල්ටන් මල්ලවාරච්චි මහතාගේ 'ශෝකී' මියුරු හඬ වඩාත්ම රසවත් රාත්‍රී නිදි යහනේදී අසද්දී. ඔහුගේ 'ඔරුවක පාවී' සින්දුව මෙලෙස අසා බලන්න.

538. වික්ටර් රත්නායක ශූරීන් ජීවත්ව සිටියදී එතුමාගේ මුද්දරයක් නිකුත් කිරීම ඉතා අගනේයි.

539. කිසි දාක අනුන්ගේ පැරණි ගීතයක් තමන්ගේ මෙන් පෙන්වා ගායනය නොකළ ගායකයෙක් වික්ටර් රත්නායක ශූරීන්. මොහු **1970** මැද භාගයේදී හඳුන්වා දුන් 'ස' ප්‍රසංගය අපේ රටේ සංගීත ක්ෂේත්‍රයේ නව, ධනාත්මක නැම්මක් ඇති කළා.

540. CT ප්‍රනාන්දු මහතාගේ සෑම ගීයක්ම ලස්සනයි; ඒවායේ පද රචනය (ඔහු විසින්ම ලියූ) බොහෝ විට ඊටත් වඩා ලස්සනයි.

541. ගීතා කුමාරසිංහ ඒ කාලේ දක්ෂ නිලියක්. දැන් දේශපාලනඥයෙක් හැටියට අවංක සේවයක් කරන කෙනෙක්.

542. අද සමහර දෙනෙක් විදේශ තනු කොපි කර (ඉංග්‍රීසි සින්දු පවා), ඒවාට සිංහල වචන යොදා, ගායනා කරනවා; ප්‍රසිද්ධ වෙනවා.

543. සමහර TV නාලිකා උදේ ඉඳන් රෑ වෙනකම් තොරතෝංචියක් නැතිව දකුනු ඉන්දීය ගී, නැටුම් ප්‍රදර්ශනය කරනවා. මේවා බැලීමෙන් අප බොහෝ විට ඒවා අනුකරණය කර, අපේ නිර්මාණ බිහි කරනවා. කලින් නම් හින්දි චිත්‍රපට/ගී ආදිය නිසා අපේ නිර්මාණවල තිබුනේ උතුරු ඉන්දීය අභාශයක්.

544. බොහෝ නළු නිලියන්/ප්‍රසිද්ධ ක්‍රීඩකයන් දේශපාලනයට නාවා නම් කොච්චර හොඳද? විශ්‍රාම ගිය පසු ඒ අයට තමන්ට අදාල ක්ෂේත්‍රයන්හි මහඟු සේවයක් කරන්න තිබුනා. ඒ අයව බලෙන්ම වගේ ගෙනා දේශපාලනඥයන්ටයි දොස් කියන්න ඕන.

545. රියැලිටි වැඩසටහන් නිසා බොහෝ ළමයින්, (වැඩිහිටියන්) කුරුවල් වෙලා.

546. ශ්‍රී ලංකාවේ ඉදිරියේදී සිංහල කාම (සෙක්ස්) ෆිල්ම් රැල්ලක් එන බව සමහරු කියනවා. මිනිසුන්ගෙන් ආයි ෆිල්ම් හෝල් වල දිගටම පොලිම් වැඩිකරගන්නද? කොච්චර දුරට මේ කථා ඇත්තද කියලා තව පොඩ්ඩක්

ඉඳලා බලමු. හැබැයි, කාම (සෙක්ස්) සීන් නොදා චිත්‍රපටයක් නිර්මාණය කරගන්න බැරි වගේ සම්භාව්‍යය යයි කියා ගන්නා සමහර අධ්‍යක්ෂක වරු ඉන්නවා. විවෘත ආර්ථිකය කියන්නේ හැම කුණු ගොඩටම ඉඩ දෙන එක නොවෙයි. චිත්‍රපට රඟුම් පාලක මණ්ඩලය අපේ සංස්කෘතිය, සභ්‍යත්වය කෙලසන චිත්‍රපට වලට ඉඩ නොදේ යයි අප පතමු.

547. ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා උඩටම ආවේ කාම දර්ශන තම චිත්‍රපටවල පෙන්වා නොවෙයි.

548. අපිට ඕනෑ ක්‍රිකට් නළුවෝ නෙමෙයි, ක්‍රිකට් ක්‍රීඩකයෝ.

549. සනත් ජයසූරිය, අපට වැදගත් වන්නේ ඔහු ලෝකයේම පහලවූ හොඳම ක්‍රිකට් ක්‍රීඩකයෙක් නිසා පමණක් නොවෙයි යුද්දයෙන් බැට කා බෝම්බ පිපිරෙන සමයේදී දස්කම් පෙන්වා රටේ ජනතාවට බලාපොරත්තුවක්/ ධෛර්යයක් දුන්න ක්රීඩකයෙක් වීම. ඔහු එදා ජනතාවගේ ආත්ම ශක්තිය වර්ධනය කළා. එදා දෙවන යුද්ධෙ කාලේ ඩොනල්ඩ් බ්‍රැඩ්මන් මේ දේම ඕස්ත්‍රේලියාවේ කලා.

550. සනත් ජයසූරිය එදා 1996 වර්ල්ඩ් කප් මුළු ක්‍රීඩා වාරයේදීම ක්‍රීඩා කල විලාශය නිසයි හොඳම ක්‍රීඩකයාට පිරිනමන සුඛෝපභෝගී මෝටර් රථය ඔහුට පිරිනැමුවේ.

551. ලසිත් මාලිංග වැනි අය හොයා හොයා කැපිල්ල දාන්නේ ගමෙන් කොළඹට ඇවිත් තාමත් සංකර පුරුදු, බොරු ෂෝක් නොදාන නිසාත් විය හැකියි. මුල්ම බෝලෙට වැඳලා බෝල් කරන ලොව එකම ජාත්‍යාන්තර ක්‍රිකට් ක්‍රීඩකයා මොහුයි. පන්න පන්නා මොහුට කරන පහර දීම් කවදා නතර වේද?

552. ලෝකයේ සිටින හොඳම 20/20 වේග පන්දු යවන්නා ලසිත් මාලිංග බව ලංකාව කෙසේ වෙතත් ලොව අනෙක් ක්‍රිකට් ක්‍රීඩා කරන රටවල් පිළිඅරන් ඉවරයි.

553. කුසල් ජනිත් පෙරේරාට සිදුවුයේ මහා අසාධාරණයක්. කෙසේ නමුත් නැවත තරඟ ක්‍රීඩා කිරීමට අවස්ථාව ඔහුට ලබාදීම ලොකු දෙයක්. කවදාහරි අති විශිෂ්ටම ගණයට පත්වෙන ක්‍රීඩකයෙක්, හරියට නිදහස්ව ඔහුට ක්‍රීඩා කරන්න අවස්ථාව ලබා දුන්නොත්.

554. තිලකරත්න දිල්ෂාන් අපේ රටෙන් බිහිවූ තුන් ඉරියව්වෙන්ම දස්කම් පෙන්වූ අති දක්ෂතම ක්‍රීඩකයෙක්. ඔහුත් නොයෙකුත් ‘කැපීම්’ වලට භාජනය වුනත්, ඔළුව කෙලින් තියාගෙන ක්‍රීඩා කර සියළු අභියෝග ජය ගත්තා.

555. රංගන හේරත් අති විශිෂ්ට ගණයේ ක්‍රීඩකයෙක් මෙයාට කුඩම්මාගේ සැලකිලි ලැබුනා වගෙයි. අජන්ත මෙන්ඩිස්ටත් අවස්ථා ලබා දුන්නා මදි.

556. සමහර ජොෂ්ට යයි කියා ගත් ක්‍රීඩකයන් හිටියා, කටයුතු කලේ ටීම් එකේ අයිතිකාරයෝ වගේ.

557. අති දක්ෂ, එහෙත් අසාධාරණය නිසා ටීම් එකේ ඉඩක් නොදුන් ක්‍රීඩකයන් බොහෝ සිටියා. දයා සහබන්දු, දොන් අරුණසිරි, අසංක ගුරුසිංහ, උපුල් චන්දන, රොමේෂ් කළුවිතාරණ, දිනේෂ් චන්දිමාල්, කුමාර ධර්මසේන, හෂාන් තිලකරත්න මේ වෙලාවේ මතකයට එන නම් කිහිපයක්. දක්ෂතා නැති/අඩු, අසාධාරණ ලෙස ටීම් එකේ රඳවා ගත් ක්‍රීඩකයොත් හිටියා.

558. දුලිප් මෙන්ඩිස් මහතා කැපවීමෙන්, සාධාරණාත්මකව අපේ ක්‍රිකට් කණ්ඩායමට පුහුණු කරුවෙක්/කළමනාකරුවෙක් වශයෙන් සේවය කළා. එවන් අයට දිගු අනාගතයක් නැහැ. ඔහු සේම 96’ ජයග්‍රහණයට ඉමහත් සේ දායකවූ අනා පුංචිහේවා මහතාටත් උනේ ඒ ටිකමයි.

559. තරඟ වලින් දිනීමේ ප්‍රතිශතය ඉතා අඩු කෙනෙක් , විශේෂයෙන්ම හොඳ විදේශ කණ්ඩායම් වලට එරෙහිව රටේ ක්‍රිකට් කණ්ඩායමේ නායකයා වශයෙන් තබා ගැනීමේ තේරුමක් නැහැ. දක්ෂතා තියෙන ක්‍රීඩකයෝ ඉන්නවා, තැන දෙන්නේ නැහැ.

560. ක්‍රිකට් කණ්ඩායමේ නායකයා වශයෙන් තෝරා පත් කර ගතයුත්තේ ඒ සඳහා සුදුසුම තැනැත්තායි. වෙනත් පරිබාහිර කරුණු වැඩක් නැහැ.

561. නායකයාගේ සාර්ථකත්වය ඔහු දිනූ/පැරදුනු තරඟ වලින් බලා ගන්න පුළුවන් ඉතා පහසුවෙන්, විශේෂයෙන්ම ඊට කලින් සිටි නායකයන් සමඟ සැසඳීමෙන්.

562. සුසන්තිකා ජයසිංහ ජාතික වස්තුවක්. අප බලාගන්නවා මදි.

563. ශ්‍රී ලංකාව ක්‍රිකට් තරඟ වලින් පිට පිට පරදිනවානම් එයින් වැටෙන්නේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව පමණක් නොවේ මුළු රටේම වගේ ජනතාවගේ මානසිකත්වයයි.

564. දිගින් දිගටම මෑතකදී තරඟ පරාජය වීම නිසා රටේ මේ දවස්වල තියෙන්නේ ක්‍රිකට් ක්‍රීඩාව ගැන අර පරණ

තිබිච්ච 'පිස්සුව' නොවෙයි. ගොඩාක් මිනිස්සු විස්තර ප්‍රචාර පචා අහන්නේ නැහැ.

565. අපේ ප්‍රධාන ක්‍රීඩාව ක්‍රිකට් වුනත් තව බොහෝ ක්‍රීඩා තියෙනවා. ඒවාට තැනක් ලැබෙන්නේ නැහැ, විශේෂයෙන්ම මාධ්‍යවලින්. අප දකුණු ආසියාවේ ඉතාම හොඳ පාපන්දු කණ්ඩායමක් හැටියට හිටියා, අද තත්ත්වය නම් ඉතා නරකයි. එදා තිබූ විශිෂ්ට ගනයේ පාපන්දු ක්‍රීඩා සංගම් ගැන අද අහන්නවත් නැහැ.

566. ලෝක ප්‍රසිද්ධ අපේ හිටපු හොඳම බයිසිකල් ධාවන ශූරයෙක් බොනිෆස් පෙරේරා මහතා. ඔහුට පුළුවන් තරම් 'කුඩම්මාගේ සැලකිලි' ලබා දුන්නා.

567. රටේ රගර් ක්‍රීඩාව ප්‍රචලිත කිරීමට CSN නාලිකාව කැපවී වැඩ කළා, හොඳ දෙයක්.

568. ලංකාවේ හොඳම රගර් ක්‍රීඩකයන් බිහිකරන විදුහලක් කොළඹ 5හේ ඉසිපතන මහා විද්‍යාලය.

569. පසුගිය කාලයේ රගර් ක්‍රීඩාව දියුණු වේගන ආවා, නැවත 'මැරෙන්න' පටන් අරං.

570. අද ශ්‍රී ලංකාවේ උසස් මට්ටමේ පාපන්දු ක්‍රීඩාවක් නැති තරම්. අපේ ප්‍රධානතම පා පන්දු කණ්ඩායම් වන සෝන්ඩර්ස්, ජුපිටර්, රත්නම්, වික්ටරි, රිනවුන්, යෝක්, සන්රයිස් (මේ සමහරක් දැන් මැරිලා), ආදිය මඟින් එදා බිහි කලේ ජාත්‍යාන්තර මට්ටමේ ක්‍රීඩකයන්. එදා, අප මොනතරම් විදේශ කණ්ඩායම් පැරදුවාද? දැන් අප මාලදිවයිනටත් පරදිනවා.

571. පටු දේශපාලන ප්‍රතිපත්ති, මතයන් ක්‍රියාත්මක කිරීමට ක්‍රීඩාව, කළාව උපයෝගී කර ගැනීම වැරදියි.

572. ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව, කළාව පමණක් නොවේ සෑම සියලු දේම උග්‍ර දේශපාලනිකරණයකට ලක් වෙලා.

573. සිංහළ අවුරුද්ද වගේමයි, වෙසක් උත්සවයත් සිංහළ, බෞද්ධ සංස්කෘතිය විද්‍යාමාන කරන එකක්. අද වෙසක් දවසේට ඉස්සරින්දා කූඩු ටිකක් කඩෙන් අරං කඩදාසි අලවලා එල්ලනවා. ඒ කූඩුත් බොහෝ විට ඇවිත් තියෙන්නේ චීනයෙන්. එදා වෙසක් කූඩු හැදුවේ ගෙවල් වල. වෙසක් කුඩු හදන්න පටන් ගන්නේ වෙසක් එකට මාසෙකට විතර කලින් ඉඳන්. මුළු පවුලම සහභාගි වෙනවා. පුදුම ආදරයක්, සෙනෙහසක්, බැම්මක් වෙසක් කූඩු හැදීම තුලින් ඇතිවෙනවා; පවුලේ සෑම සියලු දෙනාම එකතු වෙලා 'පැටවූ **12/15/18** අට පට්ටම් කුඩුවක් හදන

වැඩෙන්. සමහර පැතිවල අහල පහල නිවෙස් සමඟ තරගෙට වෙසක් කූඩු හදනවා.

574. එදා මුළු මැයි මාසයම හැමෝගෙම වගේ ජීවිත වෙසක් කාඩ් වලින් වෙලා ගත්තා. වෙසක් කාඩ් එකක් ඇරිය කෙනෙක් නොමැති තරම්. පේව්මන්ට් වෙසක් කාඩ් අලෙවි කරන තාවකාලික කඩ මඩු වලින් වැසී යනවා. ඒ තරමට වෙසක් කාඩ් ජනප්‍රියයි. අද වෙසක් කාඩ් එකක් යවපු හෝ ලැබිච්ච කෙනෙක් 'බෙහෙතකටවත්' හොයා ගන්න අමාරුයි. වෙසක් කාඩ් සංස්කෘතිය මුලුමනින්ම වාගේ 'මැරී' ගොස්. අද ඊමේල්, 'ෆේස් බුක්', 'ඉන්ස්ටර්ග්‍රෑම්' වලට වහල් වූ, තදින්ම 'යාන්ත්‍රිකරණය' වූ සමාජයක මෙවැන්නක් බලාපොරොත්තු වෙන්න අමාරුයි.

575. වෙසක් කූඩු, වෙසක් කාඩ් සම්ප්‍රදාය තුලින් අප නැති කරගන්නේ ඒ දේවල් පමණක් නොවෙයි, අපේ අධ්‍යාත්මයයි, ගුණගරුක කමයි. අපේ වටිනා ගති සිරිත් සහ අප විශ්වාස කරන හෝ 'අදහන' දේයි.

576. වෙසක් භක්ති ගී, තොරන්, දන්සැල් අපේ ජීවිත කාලය තුලම ක්‍රම ක්‍රමයෙන් අභාවයට යනවා අපට දක්නට ලැබේවි.

577. අද තියෙන වෙසක් කළාප හොඳ සංකල්පයක් වෙන්නත් පුළුවන්. හැබැයි, එදා මුළු කොළඹ නගරයම

(වෙනත් ප්‍රධාන නගරද) වෙසක් කළාපයක්. කොළඹට වෙසක් බලන්න එන අය ගියේ අද බිහිවෙලා තියෙන 'වෙසක් කළාපයට' විතරක් නොවේ, මුළු නගරයේම, වෙසක් සිරි නරඹලායි. ගෙවල්වල පොඩිම පොඩි කූඩු, එලිය පෙට්ටි, ඔලු බක්කෝ සංදර්ශනද ඇතුළුව. ඔලු බක්කෝ, තහනම් කිරීම අනවශ්‍ය දෙයක්. සැණකෙළියක් බඳු වූ වෙසක් දා රෑ, වෙසක් සිරි නරඹන්නන්ට විවිධ ආකරයෙන්, අහිංසක ලෙස සතුට, විනෝදය ලබා දීමේ වරදක් නැහැ. ගොඩාක් මිනිස්සු වෙසක් කියා රාත්‍රී චිත්‍රපට නරඹනවා/සර්කස් බලන්න යනවා. වරදක් නැහැ. වෙසක් දවස්වල රෑ නගරවල විදී වෙසක් සිරි නරඹන ජනයාගෙන් පිරී ඉතිරීතිබිය යුතුයි. අවාසනාවකට වගේ දැන් එහෙම නැහැ.

578. **2016,** 'හේදිලා ගිය' වෙසක් සහ පොසොන් උත්සව වසරක් කියන්න පුළුවන්. තෝරන්, දන්සැල් සහ සැරසිලි ඉතාම අඩුයි. **2017**ත් එසේම වේද? රජය මැදිහත් විය යුතුයි.

579. අපේ හෙළ කළාව, හෙළ බස, හෙළ දැය, හෙළ සමය අපි නොරැක්කොත් ඒවා වැනසී යනවාමයි.

580. අපේ දේශීය සංස්කෘතියේ උසස් කළා නිධානයක් වන පහත රට නැටුම අද අභාවයටම වගේ ගිහිං. මෙයට හේතුව සියළු රාජ්‍ය සැලකිලි අප දේශීය කළාවේ මුදුන්

**මල්කඩ සේ සලකන උඩරට නැටුම් උදෙසා පමණක් වෙන්වීමයි.**

# • මගී ප්‍රවාහන

582. සාඩින් වගේ පිරිච්ච බස් එකක හිටගෙන යන මඟින් හිතනවා ඇති අනේ මේ මම පෙර ආත්මේ කල පවක්ද විඳින්නේ කියලා.

583. බහුතරය බස් වලින් ගමන් කරන අපේ ශ්‍රී ලංකාවේ බස් මගී ප්‍රවාහනය සඳහා රජය විසින් යොදවා ඇති බස් ප්‍රමාණය ඉතා අල්පයි - ඇත්තෙන්ම මෙය ආපස්සට ගමන් කිරීමක්. මතුගම පැත්තෙන් ආපු මහත්තයෙක් **1960** ගණන්වල ලංගම යම් තරමකට ගෙනාවා කියා කියනවා.

584. බස් මගී ප්‍රවාහනය වැනි අති වැදගත් කර්තව්‍යයක මූලික වගකීම පෞද්ගලික අංශයට පවරා ආණ්ඩුව හාන්සි පුටුවට වී බලා සිටින්නට බැහැ. පුද්ගලික අංශයේ මූලික අරමුණ උපරිම ලාභ ලැබීම. රජය වැඩි බර කරට ගත යුතුවාක් පමණක් නොව මගී ජන -හිතකාමී ප්‍රතිපත්තියක් ඇතිව වැඩ කල යුතුයි. රාත්‍රී **8**න් විතර පස්සේ මේ රටේ බස් ධාවනයක් (දුර ගමන් සේවා නොවේ) නැති තරම්. අඩුව පුරවන්න ත්‍රී විල් හොඳ සේවයක් කරනවා, ඒත් කීදෙනාටද ඒවාට ගෙවන්න සල්ලි තියෙන්නේ.

585. අද මගී ප්‍රවාහන ප්‍රතිපත්තිය මුල් තැන දෙන බවට පෙනෙන්නේ බස් මගියා සුරක්ෂිත කිරීම වෙනුවට ප්‍රය්වෙට් බස් හිමියා සුරක්ෂිත කිරීමටද කියා සිතෙනවා.

586. පෞද්ගලික බස් මඟී කාල සටහන් හදනවිට ඒ අය හදන්නේ හැම බස් එකක්ම පුරවන විදියේ කාල සටහන්. මේ කාල සටහන් හදන විට බස් මඟී සමිතිද එකතු කරගත යුතුයි.

587. ලොකු බස් භාවිතයේ අවාසියක් තමයි බස් එකම ලෝඩ් වෙනකම් ඉන්නවා. ගමන පටන් ගත්තට පස්සෙත් තැන තැන නවත්තාගෙන ඉන්නවා, එක 'කැල්ලක්' හරි වැඩියෙන් දා ගන්න. සමහර තැන්වල විනාඩි 15 – 20 විතර වගේ නවත්තලා, පුළුවන් තරම් බස් එකට පටවා ගන්න තමා බලන්නේ. පිටි පස්සෙන් බස් එකක් එනවා දැක්කහම තමයි අද්දලා යන්නේ. මේවා 'මොනිටර්' කරන්න කවුරුවත් නැහැ.

588. ලොකු බස්, පොඩි බස් සම්මිශ්‍රණය කරලා මාර්ගයට දන්නා ඕන, ඒකෙන් මගියාට වාසියක් වෙනවා, තෝරාගෙන යන්න පුළුවන්. ලොකු බස් වගේ නොවෙයි පොඩි බස් ඉක්මනට ලෝඩ් කර ගන්න පුළුවන් - ආසන ගණනට.

589. වැදගත් ගමන් යන්න, ජැන්ඩියට ඇඳපු ගෑනු පිරිමි, තෙරපිච්ච බසයක් ගොස්, හොඳ පන ගිය පසු  බස් එකෙන් බහින කොට අර හිතේ තිබ්ච්ච ධනාත්මකභාවය රිනාත්මක බවට පත් වෙලා.

590. උදේ කාර්යාලයට ගොස් වැඩ කරන්න පුළුවන් වූ හොඳ මානසිකත්වයක් නොවෙයි, මොට්ට මානසිකත්වයකුයි තෙරපුණු/මිරිකුණු  බස් සහ කෝච්චි වලින් සේවයට  පැමිණෙන අපගේ බොහෝ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ මහත්ම මහත්මීන්ට  තිබෙන්නේ. ඔවුන්ට දොස් කියන්න බැහැ.

591. ඉන්දියාවේ කාන්තාවන්ට පමණක්ම වෙන්වූ දුම්රිය මැදිරි, බස් ආසන තියෙනවා; අපත් අඩුම තරමින් අත්හදා හෝ බැලිය යුතුයි.

592. මැරෙනකම්ම මේ පුද්ගලික බස් වල තෙරපිලා හිටගෙන යන්න වෙයි වගේ ගොඩාක් මිනිස්සුන්ට. පුද්ගලික බස් වලින් මේ මගී ප්‍රවාහන ප්‍රශ්ණය විසදෙන්නේ නැහැ; රජය මැදිහත් වෙලා බලය අතට ගෙන රෙගුලාසි නොගෙනාවොත්.

593. මිනිස්සුන්ට යන්න තියෙන බස් ප්‍රමාණය හොඳටම මදි, ලොකු බස් නොවෙයි ඉක්මනට පිරෙන ආසන 26 වගේ බස් දාන්න ඕන මැදියම් රෑ වෙනකම් වත් නගරාසන්න බස්

සේවා තියෙන්න ඕන, දැන් තියෙන 7 ට 8 ට ඉවරවෙන තත්ත්වය වෙනුවට. මුල් මාස 6 විතර පාඩුවට දුවන්න වෙයි, නමුත්, මිනිස්සු පුරුදු වුනාට පස්සේ, ප්‍රධාන නගරවල රාත්‍රී මගී ධාවන සේවා ලාභදායි වේවි.

594. මැති ඇමති ගොල්ල බස් වල, කොච්චි වල යන්නේ නැති නිසා මිනිස්සුන්ට මගී ප්‍රවාහන සේවයේ තියෙන අතිශය දුර්වලතා ගැන ඒ අයට දැනුමක් නැහැ. ඩිෆෙන්ඩර් රථ වලින් සුදු ග්ලව්ස් එලියට දාගත් ඇමති ආරක්ෂක නිලධාරින්, ට්‍රැෆික් ජෑම් පන්නගෙන ඒ අයව අදාළ ස්ථාන කරා ගෙන යනවා. සමහර වෙලාවට පාරේ ඉන්න පොලිසියට ටෙලිෆෝන් කරලා කියනවා පාර ක්ලියර් කරලා දෙන්න කියලා; ඒ හින්දා ට්‍රැෆික් ජෑම්ස් ගැන ඒ අයට දැනීමක්/හැඟීමක් නැහැ.

595. අඟහරුවාදා දවසක උදේ 645ට මාලබෙන් නැග්ග අම්මෙක් බොරැල්ලට එනකොට උදේ 925 වෙලා තියෙනවා. අනේ කාලේ, අනේ වාසේ.

596. ඔය මෙගාපොලිස් වැනි දේවලින් බස්නාහිර පළාත මිනිස්සුන්ගෙන් තවත් පුරවන දේ නවත්තලා, ඒ සල්ලි වලින් මිනිස්සු මග රස්තියාදු කරන වාහන තදබදය අවම කිරීමට කටයුතු කරන්න. අලුතින් හොඳ බස්/කෝච්චි ටිකක් ගෙනත් දාන්න.

597. ලංගම බස් විශාල ප්‍රමාණයෙන් වැඩි කරන්නේ නැතුව මගී ප්‍රවාහනය දියුණු කරන්න බැහැ.

598. මොනවා කිව්වත් මිනිස්සු කැමති ලංගම බස් එකක යන්න. ලංගම බස් වැඩි කලොත් ප්‍රයිවෙට් බස් වලට වෙනවා ඒ අයගේ සේවයේ ගුණාත්මක භාවය මීට වඩා වැඩි කරගන්න. ඔය බස් හෝල්ට් වල බොහෝ වෙලා බස් එක නවත්තගෙන තැපගෙන සිටීම, ටිකට් නොදීම, ගාස්තු වැඩියෙන් අය කිරීම - සමහර බස්වල, වැනි නරක ක්‍රම අඩු කරගන්න වෙනවා; මොකද ලංගම බස් එහෙම කරන්නේ නැහැ.

599. ඉතාම ලාභ දායි මාර්ගයක් වන බොරැල්ල - කොළඹ (103) මාර්ගයේ 5%ක් වත් ලංගම බස් නැහැනේ. හැබැයි ඒ අය (පුද්ගලික) මගීන් ප්‍රවාහනය කරන්නේ මගීන් බහුල වෙලාවල පමණයි. උදේ 5 ඉස්සර සහ සවස 8න් පස්සේ බෙහෙතකටවත් බස් එකක් හොයා ගන්න අමාරුයි. මුළු රටේම තත්ත්වය මේකයි. රජයේ මගී ප්‍රවාහන බලධාරීන් නිදිද?

600. තවත් ලාභදායි මාර්ගයක් තමයි 138 පිටකොටුව - මහරගම; ලංගම බස් නම් අවමයි හැබැයි.

601. යාපනයේ බස් සේවය ඉතා ඉහලයි. පුද්ගලික වගේම, පිරිසිදුවට තබාගත තියෙන ලංගම බස් බහුලයි. මිනිස්සු හොඳට ඉඳගෙන යනවා.

602. කොළඹ - යාපනය වැඩ කරන සමහර ලංගම බස් වල ඔටෝමැටික් වගේ ඉදිරි සහ පසුපස දොරවල්. කොළඹින් උදේට යන ඉන්ටර්සිටි කෝච්චිය ඉතා කෙටි වෙලාවකින් යාපනයේ. මැදවච්චියෙන් එහා කෝච්චිය ගමන් කරන්නේ අධික වේගයකින්. මෙය යුරෝපයේ ධාවනය වන දුම්රියක් වැනියි. සැප පහසුයි, ඉතා හොඳයි. මේ තත්ත්වය මුළු රට පුරාම ඇති කල යුතුයි. රාජධානි සීඝ්‍රගාමි දුම්රිය සේවය හොඳයි.

603. සමහර පුද්ගලික සහ ලංගම බස් කොන්දොස්තරවරු ඉන්නවා උවමනාවෙන්ම මගීන්ගෙන් සල්ලි ගන්නේ නැහැ. මේ අය කාටවත්ම වැඩක් නැති කොටසක්.

604. ලංගම බස් ඩ්‍රයිවර්ලා ඉන්නවා, ඒ අයගේ රාජකාරිය යනු බසය පැදවීම පමණක් නොව හෝල්ට් වල ඉන්න බස් මගීන්ව නග්ගා ගැනීමත් බව ඒ අයට අමතක වෙලා.

605. ඇතැම් රූට් වල, ප්‍රයිවෙට් බස් වල මඟින් උතුරා යාමටත්, ලංගම බස් වල බොහෝ විට එසේ නොවීමටත් හේතුවක් තියෙන්න ඕන.

606. **154** රූට් එකේ ලංගම බසයක් යනවා, ප්‍රයිවෙට් බස් වලට පිටුපස්සෙන්මයි යන්නේ, ඕවර්ටේක් කරලා යන්නේ නැහැ. ලංගම බස් එකේ සෙනග නැහැ, ඊට ඉදිරියෙන් යන

ප්‍රයිවෙට් බස් එකේ උතුරන්න සෙනග, තවත් සෙනග පටවා ගන්නවා. ප්‍රයිවෙට් බස් එකේ 'කොන්දා' ලංගම බස් එකට අතින් මොනවද සඥ්යා කරනවා දැක්කා කියලා කියපු මල්ලියෙක් ඉන්නවා. ඇත්තද දන්නේ නැහැ.

607. රට මිනිසුන්ට යන්න බස් නැත්තේ (කොළඹ පවා) හරියට රටේ යුද්ධයක් තිබ්බ කාලේ වාගේ.

608. යුද්ධෙට ඉස්සෙල්ලා කොළඹ නගරයේ රාත්‍රී 12 විතර වෙනකම් ලංගම බස් වැඩ කළා. නැවත ඒ තත්ත්වය ඇති කල යුතුයි. රුට්ස් හදා ගන්නකම් මුලදී පාඩුවට දුවන්න වේවි. මුලදී අඩුම තරමින් පැය ½ කට හෝ පැයකටවරක් වත් බසයක් ධාවනය කල යුතුයි - පුළුවන්නම පාන්දර 2 විතර වෙනකම් වත් බස් සේවයක් තිබුනොත් රෑ වැඩ ඇරිලා සහ රෑ වැඩට යන අයට ඉමහත් පහසුවක්. මොකද ඒ වෙලාවට ත්‍රී විලුත් නැහැ.

609. අවුරුද්ද, නත්තල වගේ දවස්වල බස් /දුම්රිය ධාවනය වෙන්නෙම නැහැ. ඉස්සර පවුල් පිටින් අවුරුදු දවසේ නෑගම් ගියේ බස් වල. හැමෝටම ත්‍රී වීල් වලට ගෙවන්න සල්ලි නැහැ.

610. මගී ප්‍රවාහන අධිකාරියේ මහත්තයෙක්ගෙන් ඇහුවහාම කියනවා පිටකොටුව බස් ස්ටෑන්ඩ් එක සිංහල අවුරුද්ද ලැබූ පසු බස් නැත්තේ මගීන් නැති නිසාලු. බස්

ටිකක් දාලා බලන්නකෝ මගීන් ඉන්නවද නැද්ද කියලා කිවුවහම ඔහු හීන් සීරුවේ මාරුවෙලා ගියා.

611. ඔය දේශපාලන වැඩ වලට, මැයි දිනේ ද ඇතුළුව, බස් වෙන්කරනවානම් මහජන ගමනාගමනය කඩාකප්පල් නොවෙන අයුරින් එය සිදු කල යුතුයි.

612. බස්වල (පුද්ගලික/ලංගම) නිකන් යන්න බලන අය ඉන්නවා, හොඳ වැඩක් නොවෙයි. හොරකම් කිරීමේ නරක පුරුද්දත් අපරාදේ ඇති කරගන්නවා.

613. කොළඹ කෙටි ගමන් යන අය (උදාහරණයක් ටවුන් හෝල් ඉඳලා බම්බලපිටියට, කොම්පඤ්ඤවිදියේ ඉඳලා කොල්ලුපිටියට) ඇවිදන් යන එක වඩා හොඳයි. ව්‍යායාමයක් ලැබෙනවා පමනක් නොව තමන්ගේ වාහනය විනාඩි 10ක් විතර ට්‍රැෆික් ලයිට් වල නවත්වාගෙන ඉන්ධන පිච්චීම නවත්තා ගන්නත් පුළුවනි.

614. බස් කොන්දොස්තර කෙනෙකුට ඇත්තේ ඉමහත් වගකීමක්. තම බස් රථයේ ගමන් කරන මඟීන් සුරක්ෂිතව ඔවුන්ගේ ගමනාන්තය දක්වා ගෙන ගොස් බැස්සවීමේ පුළුල් වගකීම ඔහු සතුයි. මේවා මේ අය දන්නවාද? රියදුරු මහතා බසය ආරාක්ෂකාරි ලෙස පදවිය යුතුයි.

615. බස්කොන්දොස්තර කෙනෙකෙට ඔහුගේ බස් එක 'හදන්නත්' පුළුවන්, 'මරන්නත්' පුළුවන්.

616. කොන්දොස්තර වරු අතර කතාවක් තියෙනවා නියම කොන්දොස්තර කෙනෙක් නම් ඒ අවස්ථාවේ තමන්ගේ බස් එකේ ඉන්න සෑම මගීයෙක්ම බහින තැන දන්නවාය කියලා.

617. කාලයකට උඩදී ලංගමට කාන්තා බස් කොන්දොස්තරවරියන් පත් කළා. නැවත පන ගන්වන්න උත්සහ කර බැලිය යුතුයි; හැබැයි දැන්ම නොවෙයි බොහෝ දුරට බස් ගමනාගමන සේවය දියුණු වූ පසු.

618. කාන්තා ත්‍රී විල් ඩ්‍රයිවරියන් දැන් එන්න කාලය හරි (රාත්‍රී කාලයේදී නොවේ).

619. කාන්තාවන් බෙහෙවින් දැන් ස්කූටර්, වැලි කදිමෙට පදිනවා. පිරිමි වගේ 'අස්සෙන්' දමා යන ගතියක් තවම නම් මේ අය බෝ කරගෙන නැහැ. බොහොම ප්‍රවේශමින් ඒඅය පදින්නේ.

620. දුර බස් ගමන් සේවාවල රියදුරු මහත්වරුන් බුලත් විට කන්නේ නිදිමත ගතියෙන් වැළකී සිටීමට. හප හප ඉන්නකොට නින්ද යන්නේ නැති උනාත් ඇගේ පතේ රුදාව වැඩි වෙනවා.

621. බස් සේවකයන්ට (ඩ්‍රයිවර්/කොන්දොස්තර) ට්‍රිප් එකක් ඉවර වුනාහම හොඳ විවේකයක් නොදුන්නොත් මාර්ග අනතුරු වැඩි වෙන්න පුළුවන්. සමහර බස් මුදලාලිලා විවේකයක් දෙන්නෙම නැහැ, හරියට මැෂින් කියලා හිතන්නේ. දියුණු රටවල කියන්නේ පැය 2ක් යමෙක් එක දිගටම වාහනයක් එලවනවානම් අනිවාර්යයෙන්ම විනාඩි 10ක වත් විරාමයක් ගත යුතුයි කියාලයි.

622. ඔය රියැලිටි ටී වී නොවෙයි, වසරේ හොඳම බස් කොන්දොස්තර, බස් ඩ්‍රයිවර් සැඟවුණු මගින් දාලා තෝරනවනන්, රටට යහපතක් වෙනවා පමණක් නොවෙයි, දක්ෂ, අවංක බස් සේවකයන්ටත් ධෛර්යයක්. පළාත් මට්ටමින් කරන්න පුළුවන් රසවත් වූ තරඟයක්.

623. මෙහෙ වගේ නොවෙයි එංගලන්තයේ බස් රථයක ගමන් කිරීමත් සතුටක්. එයා කන්ඩිෂන් කරපු බස් වල හිටගෙන යන්නේ ඉතාම කලාතුරකින්. හැමෝටම හොඳ සුවපහසු ආසනයක් ලැබෙනවාමයි. ඒ රටවල 'ඉහල', 'පහල' හැම පන්තියකම අය බස් වල යනවා.

624. ලංකාවේ බස් වල සැමන් වගේ මිනිසුන් ඇහිරීම කවදා නවතීද? මැලේසියාව මේ අංශයෙන් අපට වඩා හුඟාක් දියුණුයි - ඉතා සැප පහසු බස් මඟින් සඳහා ඔවුන් යොදවා තිබෙනවා. ටැක්සි ඔක්කොම හයිබ්‍රිඩ් වාහන; ත්‍රී විල් මැලේසියාවේ නැහැ.

625. ඕස්ත්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ ඇමති කෙනෙක් හැමදාම නිව් කාසල් ඉඳලා සිඩ්නි වලට කෝච්චියෙන් වැඩට ආවා. වැදගත්කම කියන්නේ මිනිහා ඒ කාලේ ඒ ප්‍රාන්තයේ ප්‍රවාහන ඇමති.

626. ලොකු බස් වල පටවන්න පිරෙන්න තරම් මිනිස්සු නැති හින්දා බොහෝ බස් මාර්ග රෑ 7න් 8න් විතර පස්සේ මාර්ගයෙන් ඉවත් කරගන්නවා. අඩුම ගානේ රැටවත් පොඩි බස් මගී ප්‍රවාහනය සඳහා ඉඩ දෙන්න ඕනා. සීට් 15, 20, 24/26 වගේ බස් ඉක්මනට මගීන්ගෙන් පුරවගන්න පුළුවන්, එතකොට හොල්ට් වල ගාට ගාට ඉන්න ඕන නැහැ වාහනය ෆුල් කරගන්න. තව, පාරවල ඉඩ ඇහිරෙන්නේ නැහැ, ඒකෙන් ඇක්සිඩන්ට්, මාර්ග තදබද විශාල ලෙස අඩු වෙනවා.

627. කොටුව -රාජගිරිය 103, 171, 144 මාර්ගයේ රෑ 8 විතර පස්සේ බස් ඇත්තෙම නැහැ වගේ නැහැ. ඉතින් කොහොමද ආර්ථිකය නගා සිටුවන්නේ?

628. මිනිස්සු පිරෙන්න ඉන්නවනම් පමණක් බසයක් ධාවනය විය යුතුය යන සංකල්පයෙන් සිටින බස් මුදලාලිලා අතට මගී ප්‍රවාහන යාන්ත්‍රනය භාර දී, ඔවුනට ඕන විදියට කාල සටහන් හදා, බස් ධාවනයට ඉඩ දුන්නොත්, බස් මගින් වැටෙන්නේ කබලෙන් ලිපට.

629. මට්ටක්කුලිය බලා යන 178 බසයක් කොස්ගස්හන්දියේ විනාඩි 20ක් නතරකරගෙන ඉඳලා තියෙනවා. ඒ බසයේ සිටි මගීන්ගේ මානසිකත්වය කොහොමට තියෙන්න ඇද්ද? අද්දලා තියන්නේ ලංගම බස් එකක් පස්සෙන් නවත්තපුවහමයි.

630. තමන්ට හිතු ගණන් වෙලා බස් හෝල්ට් වල නවත්වාගෙන ඉන්න සහ වෙනත් බොහෝ වැරදි වැඩ කරන පුද්ගලික බස් සේවා ගැන පැමිණිලි කර විසඳුම් ලබා දීමට අදට වඩා විධිමත් ක්‍රමවේදයක් අවශ්‍යයි.

631. මිනිස්සුන්ට යහපත් බස් සේවයක් ලබා දෙන්න රජයන් අවංකව, කැප වෙනවා නම් ලංගම බස් සංඛ්‍යාව වැඩි කල යුතුයි. පුද්ගලික බස් අයිතිකාරයන්ට බයේ හෝ වෙනයම් හේතුවක් නිසා මේ දේ නොකලොත් පිඩාවට පත් වන්නේ අහිංසක බස් මගීනුයි.

632. බස් රථයක සෑම මගියෙකුටම සුව පහසු ලෙස හිඳගෙන යන්න පුලුවන්නම් එය බස් මගියාගේ ජයග්‍රහණයයි. බස් රථයක පොල් පැටෙව්වා වගේ මිනිස්සු පිරී ඉතිරි යනවා නම් එය පුද්ගලික බස් රථ හිමියාගේ ජයග්‍රහනයි. මන්ද, ඔහුගේ මල්ල තරවන්නේ එවිටයි.

633. රජයක වගකීම බස් මගියාට හොඳ ප්‍රවාහන සේවයක් ලබාදීමයි. එසේ නැතුව පුද්ගලික බස් රථ හිමියන්ට ඕනා විදියට බස් මගී ප්‍රවහාන සේවය ය පවත්වාගෙන යන්න ඉඩ

දී බලාසිටීමෙන් නොවේ. ලංගම මීට වඩා කාර්යක්ෂම කල යුත්තේ ඒ නිසායි.

634. වසර හැටක් වයසැති ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් ඩිපෝ 122ක බස් රථ 6500 කට සේවකයෝ 35600 ක් සිටිත්. ලංගම දිනක ආදායම රුපියල් මිලියන 69 ඒ දිනයේ වියදමටත් වඩා අඩුයි. මේ තත්ත්වය යටතේ **දේශපාලනඥයයන්ගේ ලියුම් වලින්** රැකියාවට පැමිණ අත්‍යාවශ්‍ය නොවන රාජකාරී කරන සේවකයන් අඩුකිරීමට කටයුතු කල යුතුයි.

635. **දිනපතා බස් සහ දුම්රියන් වල යන මගීන් එකතුවී දේශපාලන පක්ෂයක් සාදා ඒ මගින් ඔවුන්ගේ අයිතිවාසිකම්, සේවයේ වර්ධනය සඳහා සටන් කල හැකියි.**

636. **මගී ප්‍රවාහන භාර බලධාරීන් තේරුන් ගන්න ඕන පුද්ගලික බස් සහ ලංගම බස් ධාවනය යනු ලාභ ලැබීම පිණිස පවත්වාගත යුතු සේවාවන් නොව ජනතා යහපත සහ සුභසිද්ධිය සඳහා කැපවූ සේවාවන් බව.**

637. **පුද්ගලික බස් අයිතිකාරයන්ගෙන් බස් සේවය යනු ලාභ ලබන නොව මහජන සේවයක් බව බලාපොරොත්තුවීම කළු ගලෙන් වතුර ලබා ගන්නවා වැනි වූ නිෂ්පල වැඩක්. ඒ අයට බැනලා වැඩක් නැහැ, රජය බලවත් විය යුතුයි. ප්‍රධානම දෙයක් ලංගම ශක්තිමත් කිරීමයි.**

638. බස් අතර තියෙන තරගය නිසා අහිංසක මගීන්ට අනේක දුක් කරදර වලට බඳුන් වෙන්න වෙනවා. කොටින්ම බස් එක නවත්වන්න ඉස්සෙල්ලා කියනවා බහින්න කියා, ඒ තරමට ඒ අයගේ හදිස්සිය; නමුත් නග්ග ගන්න නම් ...

639. බොහෝ මගීන් අද බහින්නේ බස් හෝල්ට් එකේ නොව බස් එක ට්‍රැෆික් වලට නවත්වා ඇති විටයි. මේ නිසා රිය අනතුරු වලට ලක්වූ බස් මගීන් අනන්තයි.

640. දුර බස් දෙකක් අතර රේස් තරඟයට බයවී මගදී බැහැපු (නුවරඑළි නොගොස්, නුවරදී) මාමෙක් ඉන්නවා.

641. නගර තුල රාත්‍රී 12 වනතුරු වගේ ධාවනය වෙන විධියට ලංගම බස් කාලසටහන් අනුව ධාවනය කරලා බලන්න. මුලදී, එක පාරටම නැති වුනත් කාලයක් යන කොට හොඳ මගී ජනතාවක් හදා ගන්න පුළුවන්. මේවා කරන්න පුලවන් බිය නැති නිර්භීත රජයන්ට පමණයි. පෝසත් බස් අයිතිකරුවන් කියන හඬට වැඩි බලයක් දුප්පත් බස් මගීන්ට තියෙනවනම්, ඒ අයට මේ තරම් දුක් විඳින්න ඕන නැහැ.

642. අද අලුතෙන් පුද්ගලික බස් මාර්ග පර්මිට් එකක් ගන්න එක කළුනික සොයනවා වගේ අමාරුයිලු.

දෙන්නේම නැහැල්ලු, සමහර මාර්ග වල. බස් මඟීන්ට දෙයියන්න්ගේම පිහිට තමයි.

643. මේ **2016/17, -** ඒ කියන්නේ **21** වන ශත වර්ෂයේ, මිනිසුන් බස් වල යන්නේ **1970/80** ගණන් වල ගිය විදියටමයි. පාපුවරුවේ එල්ලිලා යාම නම් අඩුයි (යම් දියුණුවක්).

644. මගී ප්‍රවාහන බලධාරීන්ගේ ඉල්ලක්කය විය යුත්තේ **2020** වනවිට, සෑම බස්/දුම්රිය මගියෙකුටම සුව පහසුව ආසනයක ඉඳ ගෙන යාමට හැකි වන මගී ප්‍රවාහන සේවයක් සකස් කිරීමයි. රජයේ නාස්තිකාර බොරු වියදම් නැවත්තුවොත්, දූෂණ, අක්‍රමිකතා, අපරිපාලනය නැවත්තුවහොත් හෝ හොඳින් පාලනය කල හොත් , කරන්න පුළුවන් දෙයක්.

645. නගරවල තියෙන වාහන (ට්‍රැෆික්) තදබදයට හොඳම පිළියමක් තමයි හොඳ මහජන ප්‍රවාහන සේවයක් (බස්/දුම්රිය) තිබීම. අද මේවා ඉතා පහත් මට්ටමේ නිසා බොහෝ අය මහජන ප්‍රවාහන සේවා, විශේෂයෙන්ම,බස්, පාවිච්චි කරන්නේ නැහැ. අද තත්ත්වය වගේ බොහෝ විට හිටගෙන, තදවී,දහඩිය දාගෙන, ගාට ගාට යන බස් සේවයක් නම් තියෙන්නේ මිනිස්සු බස් වල යන්න පෙලඹෙන්නේ නැහැ, නොගිහින්ම බැරි නම් මිස. මුදල් නැති මිනිහාත් බලන්නේ කොහොමහරි මුදලක් එකතු කරගෙන වාහනයක් ගන්නයි, බස් වල/දුම්රිය සේවයේ දුක

දන්නා නිසා. එතකොට පාරවල වාහන තදබදය වැඩි වෙනවා (දැන් වාහන මිලත් ඉහල දාලා).

646. රෑ 7න් පස්සේ බොරැල්ලේ ඉඳලා කොල්ලුපිටියට කෙළින්ම යන්න බස් එකක් නැහැ, ආයි රෑ 9ට තියෙන , 177 ලංගම බස් එක හැරෙන කම්. ඉතා ශෝචනීය තත්ත්වයක්. ආසියාවේ ආශ්චර්යය කෙසේ වෙතත් තියෙන ණය ගෙවා දමාගන්න පුළුවන් ආර්ථියකයක්වත් ගොඩ නගා ගන්න පුළුවන් වෙන්නේ නැහැ මේ තරම් දුර්වල මගී ප්‍රවාහන සේවයක් එක්ක.

647. මීගමුව බස් ස්ටෑන්ඩ් එක ඉතා හොඳට හදා තියෙනවා. කොපමන කලක් අද තියෙන පිරිසිඳු කම රැකේද?

648. දුර ඉඳන් කොළඹ යන බොහෝ බස් මිගමුව බස් ස්ටෑන්ඩ් එකට නොපැමිණ තෙල්වත්ත හන්දියේ නවත්වා යනවා. මේ නිසා මීගමුව බස් ස්ටෑන්ඩ් එකේ අගය පහල වැටෙනවා; මීගමුවේ මගීනට ඒ බස් 'මිස්' වෙනවා. සමහර අර්ධ-සීග්‍රගාමි බස්වත් මිගමුව බස් ස්ටෑන්ඩ් එක හරහා ගියොත් මගීන්ට හොඳයි.

649. අද දුරගමන් බස් රියදුරන් තේ බීමට නවත්වන හෝටල් හෙවත් කෑම කඩ වල ඇති කෑම සැපයුම, වැසිකිලි ඇත්තේ ඉතාම දුර්වල තත්වයක. සමහර හෝටල ඇතුලට ගියහම බය හිතෙනවා ඒවායේ ගණන් දැකලා. වෙන තැන්

වල රුපියල් තිහට තියෙන බනිස් ගෙඩියක් ඒවායේ පනහක් වෙනවා. ඒවත් පරණ වෙච්චි ගල් ගෙඩි. පිළුණු රහ එන එළවළු රොටියක ගාන ඊටත් වැඩියි. ප්ලේන්ටියක් රුපියල් විස්සයි, ආනමාලු කෙහෙල් ගෙඩියක් රුපියල් තිහයි, කිරි තේ එකක් රුපියල් පනහයි. ඉතින් තුන් හතර දෙනෙකුට යන්තං බඩ පුරව ගන්න රුපියල් හාරසීයකුත් මදි.

650. එක් බස් මගී හෝටලයක මාළු හොද්දේ මාළු ඉතුරුකර හොදි ගත්තත් බිලට මාළු කැල්ලත් දමනවා.

651. සමහර බස් මගීන් සඳහා නවත්වන හෝටල් පිටුපස ඇති වැසිකිලි වල දොරක් පවා නැත; යන්තම් ඒවා ටකරං කීපයකින් වසා කොටු කරන ලද ඌරු කොටු මෙනි. විලි බියක් ලැජ්ජාවක් ඇති ගැහැනු තියා වැදගත් කමක් ඇති පිරිමියෙකුටද ඒවාට යාමට නොහැක. ගොඩාක් මගීන් වැසිකිලිය ළඟට එන්නේ නහය වහගෙනයි. වැසිකිලි යාමට ගොස් 'යන්න බැහැ... යන්න බැහැ... වතුරත් නැහැ... හරිම අපිරිසිදුයි ' පවසමින් තම තරුණ දියණියවද ආපසු ආපසු බසය තුලට හරවාගෙන ගිය මවක් ඉන්නවා.

652. බස් රියදුරු මහත්තුරු තේ බොන්න බස් එක නවත්තන්නේ එයාලාට 'සම්තිං' එකක් දෙන, 'ගතම්' එකක් ගෙවන හෝටලයක් ගාව විතරයි. එතන කෑම කොහොමද, වැසිකිලි කොහොමද කියල එයාට අදාල නැහැ. එයාලාගේ

ගාන දෙනවනං එයාලාට ඒ ඇති. සමහර බස් කොන්දොස්තරවරුන් සහ රියදුරන්ට දහසින් බැඳි පියලි හෙවත් මුදල් තෑගි ලැබෙනවා. තවත් අයට ඇති වෙන්න කෑම බීම සමග රැගෙන යන්නටද කෑම මුලක් ලැබෙයි. තවත් තැන් වල සන්තෝසම බයිට් පාර්සලයක් සමග අරක්කු බාගයක් හෝ බෝතලයකි.

653. බස් මගින් සඳහා වූ හෝටලයක වැසිකිලයට යාමට එළියට බැස්සවිට එම හෝටලයේ පිටුපැත්තේ වැසිකිලි පේළි දෙකක් තිබුනා. ඉන් දෙකක් කාන්තාවන් සඳහා වන අතර ඉතිරි දෙක පිරිමින් සඳහාය. දිනකට සිය/දහස් ගනනක් පරිහරණය කරන නිසා ඒවායෙන් හමන දුර්ගන්දය ගැන කතා කරන්නට වචන නැත.

654. සමහර බස් මගී හෝටලවල ජල සැපයුම ඇත්තේම නැත. බස් රියක් පැමිණ කා බී ශරීර කෘතයන්ද අවසන් කර සෙනග පිටවී ගිය පසු හෝටලයේ සේවකයෙක් පැමිණ වතුර බාල්දියක් දෙකක් ගසා පොඩි බොරුවක් කර වැසිකිලිය හේදූ බවට මුදලාලිට වාර්ථා කරයි. මුදලාලිද කිසි සොයා බැලීමක් නොකරන්නේ ඔහුට ඉන් වැඩක් නැති නිසා මිස වැඩකාරයාගේ කීමට රැවටී නොවේ. බොහෝ විට වැසිකිලියට යාම වගේම, ඔහු තමන්ගේ හෝටලයේ උයන කෑම ද නොකයි.

655. බස් මගීන් සඳහා වූ හෝටල් වල ප්‍රශ්න විසදන්න පුළුවන් අදාළ වූ රජයේ ආයතනවලට පමණයි. නමුත්,

එවැන්නක් නොකෙරෙන්නේ බොහෝ අදාළ දේශපාලනඥයන්/උසස් නිලධාරින් බස් වල ගමන් නොගන්නා නිසාත්, මෙවන් ප්‍රශ්ණ තිබෙන බවක් ඔවුන් නොදන්නා විය හැකි නිසාත්ය.

656. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල තියෙන මේ තරම් අමාරු, දුෂ්කර, අවහිර බාධා සහිත මාර්ගවල, අනතුරු වළක්වමින් රිය පදවන අපේ රියැදුරෝ, විශේෂයෙන්ම බස්, බර වාහන රියැදුරෝ ලෝකයේ ඉන්න හොඳම රියැදුරෝ ගොඩට වැටෙනවා.

657. මගී ජනතා චන්දයට අමතරව, මගී ප්‍රවාහන අධිකාරියෙන්ද පළාත් අනුව, හොඳම බස් ඩ්‍රයිවර්, හොඳම කොන්දොස්තර, හොඳම බස් සේවය, හොඳම ටිකට් පරීක්ෂකවරු තොරන වැඩ සටහන් ඇති කරන්න ඕන. ඒ අයට තෑගි/සහතික දෙන්න ඕන.

658. මාර්ග වල අපේ දුම්රිය සේවය උපරිම කාර්යක්ෂමතාවෙන් වැඩ කෙරෙන්නේ නැහැ. රාත්‍රී 7න් විතර පස්සේ පානදුරේ ඉඳන් කොටුව/මරදානට එකම දුම්රියක් වත් වැඩ කරන්නේ නැහැ. ඉස්සර , 1980/90 මැද ගණන් වල, මැදියම් රෑ වෙනකම් දුම්රිය මුහුදුබඩ මාර්ගයේ දුම්රිය දෙපත්තටම දිවුවා. දුම්රිය ආරක්ෂක සේවය තර කරලා හෝ පොලි සියෙන් ආධාර ලබාගෙන හෝ මේ ‘මැරී

ගිය’ රාත්‍රී දුම්රිය සේවය (දෙපත්තටම ධාවනය වන) පනගන්වලා ගන්න ඕන.

659. දකුණු දුම්රිය මුහුදුබඩ මාර්ගයේ රෑ 12 – 1 වගේ විතර වෙනකම් අඩු තරමින් පැයකට එක දුම්රියක් හරි දෙපැත්තට ධාවනය කරනවා නම් මොන තරම් සහනයක් මගීන්ට ලැබේවිද? මොකද ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මේ දුම්රිය මාර්ගයෙන් සහාය ලබා ගන්නවා.

660. ආයෙත්, කැලණිවැලි මාර්ගය - මුළු දවසටම කොළඹ - අවිස්සාවේල්ල දුම්රිය 4යි හෝ 5යි වැඩ කරන්නේ. මෙවැනි වෙනම දුම්රිය මාර්ගයක් පවත්වා ගැනීමෙ තේරුම කුමක්ද? මේ මාර්ගයේ පුවක්පිටියේ පාර හරහා දුම්රිය පාර දෙතුන් පලකින් ප්‍රධාන පාර හරහා මාරු වෙනවා, මේක හදා ගත්තොත් (දුම්රිය පාර හරහා නැතුව, කෙලින් යන විදීයට), ඉන්න ජනගහනය දිහා බැලුවොත්, දවසකට දුම්රිය 20කට එහා ධාවනය කරගන්න පුළුවන්. ඉතාම හොඳ ආදායම් මාර්ග රජයට හදා ගන්න පුළුවන්. අද දවසකට දුම්රිය 4 -5 ක් විතරක් ධාවනය කරන වෙනම දුම්රිය මාර්ගයකින් (දුම්රිය ස්ථානම 20 ට වැඩියි), මොන තරම් පාඩුවක් රජයට අත් වෙනවා ඇද්ද?

661. ඉස්සර කැළණිවැලි දුම්රිය කොළඹ සිට ඕපනායකයට ගමන් කළා, ඒ කියන්නේ යටියන්තොටත් එහා. අද අවිස්සාවේල්ලෙන් එහාට දුම්රිය පීලිත් එක්කම

ගලවලා දාලා. විශාල ජනගහනයක් වෙසෙන මේ ප්‍රදේශවල, අපට තියෙන දුම්රිය සම්පතවත් රැක ගන්න බැරි වුනේ එකල සිටි නිලධාරීන්ගේ සහ දුම්රිය භාර ඇමැතින්ගේ උකටලී බව නිසාද?

662. බස් මගීන් වගේම තමයි දුම්රිය මගින් විඳින දුක. දෙගොල්ලම හිරවී, තෙරපුනු ප්‍රවාහන සේවාවන් තමයි පාවිච්චි කරන්නේ මේ **2016** වසරේදීත්. බොහෝවිට උදේ වැඩට එන්න සහ සවස වැඩ අවසන් වී ගෙදර යන්න තියෙන්නේ ගුණාත්මයෙන් ඉතාම අඩු මගී ප්‍රවාහන සේවයක්.

663. සතියේ දවසක හවසට බම්බලපිටිය දුම්රිය ස්ථානයට ගොස් බලන්න දකුණට යන සමුද්‍රදේවී දුම්රිය දෙස. මිනිස්සු ගුලිවී, පොකුරු පිටින් මැදිරි තුල ඉන්න අයුරු සහ පාපුවරුවේ යන මගීන් දැක්කහම ඔලුවේ කැරකිල්ල හැදෙනවා. පෙට්ටි ඇතුලේ මිනිස්සු පොදිය හරියට හරියට බඹර වදයක් වගේ.

664. මෙහෙම ගියොත් ඉන්දියාවේ වගේ අපේ රටේත් දුම්රියේ වහල උඩ මිනිස්සු ගමන් කරන්න පටන් ගනීවී.

665. හොඳම ත්‍රීවිල් රියදුරන් පළාත් මට්ටමෙන් සොයා, බලා තෑගී දෙන වැඩපිළිවෙලක් ඇති කරන්න ඕන.

666. ත්‍රීවිල් අපේ ආර්ථික වර්ධනයට මහත් සේවයක් කළා, විශේෂයෙන්ම නගරවල මගී ප්‍රවාහන සේවා දූර්වල නිසා.

667. ත්‍රීවිල් වලට ස්තූතිවන්ත වෙන්න සාධාරණ මුදලකට ඉක්මනින් ගමනක් යන්න පුළුවන්.

668. මෙරට ත්‍රී රෝද රථ උවමනාවටත් වැඩියෙන් තියෙනවා කියා ත්‍රී රෝද රථ ආනයනය කිරීම සීමා කරන්න රජය උත්සහ කරනවා. ඇත්තෙන්ම අද කොළඹ ත්‍රිරෝද රථ හිඟයක් තියෙනවා, විශේෂයෙන්ම මගී ගමනාගමනය වැඩි වෙලාවට. ත්‍රී රෝද රථ අඩු/වැඩිවීම නිර්ණය කරන්නේ පවත්නා වූ වෙළඳ ආර්ථිකය විසින්, රජය මැද්දට පැනීම වැරදියි. ත්‍රී රෝද රථ හිඟයක් ඇති කිරීමෙන් වෙන්නේ ඒවායේ ගාස්තු ඉහල යාමයි; මෙයින්, නැවතත් පහර වදින්නේ අහිංසක දුප්පත් මගියාටයි.

669. නිකම්ම ත්‍රීවිල් නවත්තලා වැඩක් නැහැ ඒ වෙනුවට හොඳ ආදේශකයක් හඳුන්වා නොදී.

670. ත්‍රී රෝද රථ රියදුරු මහතුන් ඉතා දක්ෂ ලෙස අස්සෙන් රිංගා කොහොම හරි ගමන ඉදිරියටම යනවා, මගියාව ඉක්මනට ගෙන යනවා.

671. අස්සෙන් රිංගා යාම නිසා සිදුවිය හැකි වාහන අනතුරුද බහුලයි. ඒ අය හිතන්නේ ඉස්සරහ රෝදේ කොහොමහරි දාගත්තම, පිටිපස්සේ රෝද දෙකත් එම ඉඩෙන්ම දාගන්න පුළුවන් කියලා.

672. සැමවිටම මීටර් ත්‍රීවිල් ටැක්සියක්ම පාවිච්චි කරන්න.

673. දූෂිත ත්‍රීවිල් රියදුරන් ඉන්නවා මීටරය තිබිද්දී එය නොදා පදවන්න බලන අය. රැට මීටර් නැතුව එලවන බොහෝ ත්‍රිවිල් රියදුරන් ඉන්නවා. පොලිසියට මේ වගේ අයව කෙලින්ම පැමිණිලි කල හැකි ක්‍රමයක් සැකසිය යුතුයි.

674. ත්‍රීවිල් ලියාපදිංචි කර රියදුරාගේ විස්තර ත්‍රිවිලයේ යන මගියාට දකින්නට පුළුවන් ලෙස සකස් කරන වැඩපිළිවෙලක් අවශ්‍යයි. ත්‍රීවිල් මිටරත් නිතර නිතර පරීක්ෂණයට ලක් කල යුතුයි.

675. ඉදිරියේදී ත්‍රීවිල් ක්‍රමානුකූලව පාරවලින් ඉවත් කර නැනෝ, ඇල්ටෝ වැනි පොඩි කාර් ඒ වෙනුවට යෙදවිය යුතුයි. දෙකේම ගාස්තුව බොහෝවිට එකයි. ත්‍රීවිල් හොඳ සේවයක් කළා, නමුත් දැන් යන්න කාලය ඇවිත්. ත්‍රිවිල් නිසා පරිසර දූෂණය වැඩියි. සමහරවිට ලොකු බස්/ට්‍රක් වලින් පිටවෙන කාබන් මොනොක්සයිඩ් වායුව මගියාගේ/රියදුරාගේ පෙනහළුවලට කෙලින්ම යන්න පුළුවන්. මේවා තදබල පිළිකා කාරක. අනතුරක් සිදු වූ විට වෙන ආපදාවේ තරමත් වැඩියි. . අනික රටේ දුප්පත්

භාවයක් නිරූපනය කර පෙන්වනවා. මේ මෑතක් වනතුරුම අපට වඩා 'පහලින්' සිටි, මලයාසියාවේ අදත් ත්‍රීවිල් නැහැ, කවදාවත් හඳුන්වා දෙන්නේ නැහැයි කියා ඒ අය කියනවා. සිංගප්පූරුවේ ටැක්සි හැටියට දුවන්න පුළුවන් සැප වාහන පමණයි.

676. ලංකාවේ රියදුරන් බිලාද එලවන්නේ කියා සොයා බලන හොඳ ක්‍රම වේදයක් නැහැ. කටින් වහනය වන මත්පැන් ගඳින් සහ රියැදුරන්ගේ හැසිරීමේ ස්වභාවයෙන්, රතු ඇස් වලින් මේ නීති විරෝධීන් අල්ලා ගන්න අපහසුයි. මත්පැන් බීපු රියැදුරන් අල්ලන්න උපකරණ කට්ටල අපේ රටේම අඩු වියදමින් නිෂ්පාදනය කරගන්න අපට බැරි ඇයි? නැතිනම්, අහිංසක ජීවිත රැකීම උදෙසා, ඉන්දියාවෙන් හෝ චීනයෙන් අඩු මුදලට ගෙන්වා හරි මේ නිතිවිරෝධින් ඇල්ලීම මහා පරිමාණයෙන් කල යුතුයි. විශේෂ පොලිස් කාර්ය බලකාය වල් යොදා සවසට/රෑට වාහන පෝලිමට පැත්තක නවත්වා චෙක් කරන්න ඕන බිමත් රියදුරන් අල්ලන්න. දඩ අය කර පමණක් මදි, ලයිසන් කැන්සල් කරන්න ඕන වසරකට හෝ දෙකකටවත්.

677. රෑට සිදුවෙන රිය අනතුරු බොහෝමයකට හේතුව බිමත් රියදුරන්.

678. අදත් රටේ ජනගහනයෙන් 75% - 80% ක් විතර භාවිතා කරන්නේ බස් සහ දුම්රිය මගී ප්‍රවාහන සේවා. මේ අය වෙනුවෙන් ඇති පහසුකම් නම් ඉතාමත්

**අසතුටුදායකයි. පාලකයන්ට අවබෝධයක් සහ උවමනාවක් නැති බව තමයි පෙන්නලා තියෙන්නේ.**